# පලාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත

1.මේ ආඥාපනත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත ලුහුඬු නාමය යනුවෙන් හදුන්වනු ලැබේ.

2.මේ ආඥාපනතේ විධිවිධාන, මහා නගර සභාවකට, නගර සභාවකට , සුළු නගර සභාවකට සහ ගම් සභාවකට අදාල වන යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පිහිටවනු ලැබ හෝ පිහිටුවන ලබන සැම මහ නගර සභාවකටම, නගර සභාවකටම සහ ප්‍රාදේශිය සභාවකටම අදාළ විය යුතුය. ආඥාපනත අදාළ වීම. (1977 අංක 24 & 2)

3.මේ ආඥාපනතේ කාර්යයන් සදහා සැම මහ නගරයක්ම ප්‍රාදේශිය සභා ප්‍රදේශයක්ම ඡන්ද විමසීම් ප්‍රදේශයක් විය යුතුය. ආඥාපනත අදාළ වීම. (1987 අංක 20 & 2)

## “I” වන කොටස

ජාතික සීමා නිර්ණය කමිටුවක් ස්ථාපිත කිරීම.

ජාතික සීමා නිර්ණය කමිටුවක් ස්ථාපිත කිරීම.

3. (1) අමාත්‍යවරයා විසින් මෙම වගන්තිය කියාත්මක වීමේ දී ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙකුගෙන් සමන්විත (මේ කොටසේ “ජාතික කමිටුව” යනුවෙන් හදුන්වනු ලබන) ජාතික සීමා නිර්මාණය කමිටුවක් ස්ථාපිත කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එකී තැනැත්තන්ගෙන් එක් තැනැත්තකු ජාතික කමිටුවේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

PL 005291 – 3,440 (2010/10)

(2) ජාතික කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ එකී සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් අමාත්‍යවරයා විසින් එකී පුරප්පාඩුව පිරවීම සදහා වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

(3) ජාතික කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තුන් දෙනෙකු විය යුතු අතර, එකී කමිටුවේ යම් රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. ජාතික කමිටුවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් සාමාජිකයකු එකී රැස්වීමේ මුලසුන දැරීම සදහා නම් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ජාතික කමිටුව විසින් එකී කමිටුවේ රැස්වීම් පවත්වාගෙන යාම සහ කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් පටිපාටි විධිමත් කරගනු ලැබිය හැකි ය.

ජාතික කමිටුවේ කාර්යභාරය සහ ඉදිරිපත් කළ යුතු වාර්තා

3 ආ. (1) ජාතික කමිටුවේ කාර්යභාරය වනුයේ යම් පළාත් පාලන ආයතනයක්, (2) වන උපවගන්තියේ දක්වා ඇති නියමයන් සැලකිල්ලට ගනිමින් ඒ ඒ පළාත් පාලන බල ප්‍රදේශ කොට්ඨාශවලට බෙදා වෙන් කිරීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කිරිම සහ එසේ නිර්මාණය කරනු ලැබූ එක් එක් ඡන්ද කොට්ඨාශවල සීමා නිර්මාණය කිරිම ද , එකී එක් එක් කොට්ඨාශයට නමක් සහ අංකයක් වෙන්කොට දීම ද වේ.

(2 ) ජාතික කමිටුව විසින් යම් පළාත් පාලන ආයතනයක් වෙන් වෙන් කොට්ඨාසවලට බෙදීම සඳහා තම නිර්දේශ ලබා දිමේ දී පහත සඳහන් කාරණා, එනම් :-

(අ) අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනවාර්ගික ජනගහන අනුපාතය මත පදනම් වන්නා වූ නියෝජනයක් සහතික කිරීමේ අවශ්‍යතාවය ;

(ආ) පළාත් පාලන ආයතනයේ භූගෝලීය ප්‍රදේශය සහ එහි භෞතික ලක්ෂණ ;

(ඇ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන මට්ටම සැලකිල්ලට ගත යුතුය.

(3)(2) වන උපවගන්තියේ නිෂ්චිතව සඳහන් කරන කාරණා සැලකිල්ලට ගනිමින් එක් සභිකයකුට වැඩි සභිකයන් සංඛ්‍යාවක් තෝරා ගැනීමට හිමිකම ඇති ඡන්ද කොට්ඨාස නිර්මාණය කිරිම උචිත බව ජාතික කමිටුව අදහස් කරන අවස්ථාවක, අවස්ථෝචිත පරිදි යම් පළාත් පාලන බල ප්‍රදේශයක් සඳහා බහුසභික කොට්ඨාසයක් හෝ කොට්ඨාසයන් නිර්මාණය කිරීමට ජාතික කමිටුව විසින් නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(4) ජාතික කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(5) 3අ වගන්තිය යටතේ ස්ථාපනය කරනු ලබන ජාතික කමිටුවක් විසින්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දිනය වන විට තම කාර්යභාරය සම්පූර්ණ කළ යුතු බව නියම කරනු ලැබිය යුතු අතර තම කාර්යභාරය නිම කිරීමේ දී ඒ නිර්දේශ පිළිබඳ වාර්ථාවක් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

එක් එක් පළාත් පාලන ආයතනය සඳහා ඇති කරනු ලබන එක් එක් කොට්ඨාසයේ මායිම්, නම් සහ අංක හෝ අක්ෂර පිළිබඳ නියමයන් නිශ්චිතව සඳහන් කළ යුතු බව.

3ඇ.( 1) ජාතික කමිටුවේ නිර්දේශ පිළිබඳ වාර්තාව ලැබීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, එම නිර්දේශ සම්බන්ධ වාර්තාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු ය.

(2) එම නිර්දේශ පිළිබඳ වාර්තාව ලැබීමෙන් පසුව, ජනාධිපතිවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් ජාතික කමිටුව විසින් කරන ලද නිර්දේශ මත එසේ ඇති කරනු ලැබූ කොට්ඨාස සංඛ්‍යාව, එක් එක් කොට්ඨාසයට වෙන් කර දෙන ලද මායිම්, නම්, අංක හෝ ආකාරාදිය අනුව වූ ඉංග්‍රීසි අක්ෂර ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය. ජාතික කමිටුව විසින් බහු සභික කොට්ඨාස ඇති කිරීම සඳහා තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී එක් එක් බහුසභික කොට්ඨාසයට පවරා ඇති නම සහ අංකය හෝ ආකාරාදිය අනුව වූ අක්ෂරය ද පිළිවෙලින් සඳහන් පළාත් පාලන ආයතනයේ නම සහ එකී එක් එක් බහුසභික කොට්ඨාසය සඳහා තෝරාගනු ලැබිය යුතු සමස්ත සාමාජිකයන් ගණන ද එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් යම් කොට්ඨාසයක මායිම් වෙනස් කරනු ලැබිය හැකි බව.

3ඈ. (1) අමාත්‍යවරයා විසින් 3ඇ වගන්තිය යටතේ සාදන ලද නියමයේ පළ කරනු ලැබූ පරිදි වූ කොට්ඨාසවල මායිම් වෙනස් කළ හැකි අතර එම වෙනස් කිරීම් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙකුගෙන් සමන්විත වන කමිටුවක නිර්දේශ මත සිදුකළ යුතු අතර, 3ආ වගන්තියේ නිශ්චිතව සඳහන් නියමයන් එසේ සිදු කරනු ලබන වෙනස් කිරීම් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් මායිම් වෙනස් කරනු ලැබූ අමාත්‍ය වරයා විසින් එක් එක් කොට්ඨාසයේ අලුත් මායිම් , නම් හෝ අංක ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එය එකී වෙනස් කිරීම් සිදුකළ ඉක්බිතිව ම මේ ආඥාපනත යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් සීමා නිර්ණය කමිටු ස්ථාපිත කිරීම.

3ඉ. (1) ජාතික කමිටුව තම කාර්යභාරය ඉටුකිරීමේ දී සහය වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින්, කමිටුවේ සභාපතිවරයා විය යුතු අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් ද සමන්විත (මෙහි මින්මතු "දිස්ත්‍රික් කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) එක් සීමා නිර්ණය කමිටුව බැගින් දිස්ත්‍රික් මට්ටමින් පත් කරනු ලැබිය යුතු ය :–

(අ) මැතිවරණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ;

(ආ) එකී දිස්ත්‍රික්කය පිහිටා තිබෙන්නේ යම් පළාත් සභාවක සීමා තුළ ද, එකී පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ඇ) සර්වේ ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ;

(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන රජයේ නිලධරයකු.

(2) දිස්ත්‍රික් කමිටුවක් විසින් , එකී කමිටුවට ජාතික කමිටුව විසින් පවරනු ලැබිය හැකි කර්තව්‍ය කරගෙන යනු ලැබිය යුතු අතර, එය ජාතික කමිටුවේ විධානය සහ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) 3අ වගන්තියේ (3) සහ (4) වන උපවගන්තිවල යම් විධිවිධාන දිස්ත්‍රික් කමිටුවල රැස්වීම් පවත්වාගෙන යාම සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය."

"(1) කොමසාරිස්වරයා විසින් නාමිකව හෝ ධූරයෙන් ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා වශයෙන් හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා යෝග්‍ය සහ සුසුසු තැනැත්තකු සහ අවස්ථාවෝචිත පරිදි, දිස්ත්‍රික්කයේ එක් එක් පළාත් පාලන බල ප්‍රදේශයක් සඳහා හෝ යම් නිශ්චිත පළාත් පාලන බල ප්‍රදේශයක් සඳහා තේරීම්භාර නිලධරයා වශයෙන් හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තැනැත්තන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය."

නිලධරයන්ගේ බලතල හා කාර්යය (1963 අංක 9&3) (1963 අංක 9&3) (1977 අංක 24&4) (1987 අංක 24&3)

5(1) එක් එක් ඡන්ද විමසීම් නිලධාරියා වෙත මෙම ආඥාපනතින් පවරා තිබෙන බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඔහුට නියම වී තිබෙන කාර්ය ඉටු කිරීමේදී ඔහු කොමසාරිස්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට හා පාලනයට යටත් විය යුතුය.

"(2) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය අධීක්ෂණය සහ පාලනයට යටත්ව එක් එක් සහකාර තේරීම්භාර නිලධාරියා විසින් සහ සහකාර ඡන්ද විමසීම් නිලධරයකු මත මෙම ආඥාපනත මඟින් ප්‍රදානය කරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල හෝ කාර්ය, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම ලැබිය හැකි ය."

# II වන කොටස

### ඡන්දදායකයන්ගේ සහ සභියන්ගේ සුදුසුකම් හා සභිකයන් විසින් ධූරය හිස්කිරීම

**ඡන්දදායකයන්ගේ සුදුසුකම්**

ඡන්දදායකයන්ගේ නුසුදුසුකම් (1953 අංක 25&2) (1977 අංක 24&5)

6. තත් කාලයෙහි බලපවත්නා යම් පාර්ලිමේන්තු නාමලේඛනයක තමාගේ නම ඇතුලත්ව තිබේ නම් මිස, කිසිම තැනැත්තකු මේ ආඥාපනතේ යටතේ පළාත් පාලන ආයතනයකට සභිකයකු තෝරා පත් කිරීම සඳහා වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට සුදුස්සකු නොවිය යුතුය.

ඡන්ද විමසීම් ප්‍රදේශවලට සම්බන්ධ ඡන්ද හිමි නාමලේඛනවල නම් ඇතුළත් කිරීම (1977 අංක 24&6)

7. (1)(අ) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තත් කාලයෙහි බල පවත්නා යම් පාර්ලිමේන්තු මැතිවරණ නාමලේඛනයක තමාගේ නම ඇතුළත්ව තිබෙන්නා වූ ද,

(ආ) ඒ පාර්ලිමේන්තු මැතිවරණ නාම ලේඛනය පිළියෙල කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ වර්ෂයේ ජූනි මස පළමුවන දිනයෙහි මැතිවරණ කොට්ඨාශය ඇතුළත සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් හෝ පිහිටි "කොට්ඨාශයක සාමාන්‍යයෙන් පදිංචිව සිටියාවූ ද"

සෑම තැනැත්තකුටම තමාගේ නම ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ ඡන්ද හිමි නාමලේඛනයෙහි ඇතුළත් කර ගැනීමේ හිමිකම තිබිය යුතුය.

(2) යම් වර්ෂයක ජූනි මස පළමුවන දිනයෙහි යම් තැනැත්තකු පදිංචිය පිළිබඳ වූ යම් ප්‍රශ්නයක් නිශ්චය කිරීමේ දී ප්‍රස්තුත ලිපිනයෙන් දැක්වෙන ස්ථානයෙහි ඔහු සිටීමේ හෝ නොසිටීමේ පරමාර්ථය හා ඒ පිළිබඳ වෙනත් වෙනත් කරුණුවලට මෙන්ම, එහි සිටීමේ හෝ නොසිටීමේ සිද්ධියටද විශේෂයෙන්ම, ඔහු විසින් දරනු ලබන හෝ භාරගෙන ඇති යම් ධූරයකින්, සේවයකින් හෝ සේවා නියුක්තිකයකින් උද්ගත වන හෝ ඊට ආනුෂංගික වූ යම් කාර්යයක් ඉටු කිරීමෙහි ලා ඒ පදිංචි ස්ථානයෙන් බැහැර සිටීම පිළිබඳව ද විශේෂ සැලකිල්ල දැක්විය යුතුය. (1965 අංක 15 & 2)

(3) යම් වර්ෂයක ජූනි මස පළමුවැනි දිනයේ යම් තැනැත්තකු යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක සාමාන්‍යයෙන් පදිංචිව යම් ලිපිනයක ද ඒ ලිපිනය මින් මතු මේ ආඥාපනතෙහි ඔහුගේ "සුදුසුකම ලැබීමේ ලිපිනය" යනුවෙන් හඳුන්වනු ලැබේ. (1977 අංක 24 & 6)

8. 9 වන වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි නුසුදුස්සෙකු නොවන සෑම තැනැත්තකුම - සභිකත්වය සඳහා සාමාන්‍ය සුදුසුකම් (1977 අංක 24 & 7)

(අ) ඡන්ද විමසීම් ප්‍රදේශය හෝ එහි යම් කොටසක් පිහිටා ඇත්තේ යම් මැතිවරණ කොට්ඨාශයක් තුළ ද, ඒ මැතිවරණ කොට්ඨාශය සඳහා තත් කාලයෙහි බල පවත්නා පාර්ලිමේන්තු මැතිවරණ නාමලේඛනය පිළියෙල කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ දිනයේ දී ඒ නාම ලේඛනයෙහි තමාගේ නම ඇතුළත් කර ගැනීමට ඔහු සුදුස්සකුව සිටියේ නම් ; සහ

(ආ) ඒ නාමලේඛනය පිළියෙල කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම ආරම්භ කළ වර්ෂයේ ජූනි මස පළමුවන දිනයේ දී ඔහු ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ සාමාන්‍යයෙන් පදිංචිකරුවෙකු සිටියේ නම්,

යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා ඕනෑ ම අවස්ථාවක සුදුස්සෙකු විය යුතු ය.

9. (1) යම් තැනැත්තෙකු යම් විටෙක - සභිකත්වය සඳහා සාමාන්‍ය සුදුසුකම් (1953 අංක 25 & 6)

(අ) ලංකාවේ පුරවැසියෙකු නොවුවහොත්, හෝ ඔහුගේ යම් ක්‍රියාවක් හේතුකොටගෙන පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු නොවූ යම් විදේශ බලධරයකුට හෝ රාජ්‍යයකට ඇති පක්ෂපාත භාවයක් , අවනතභාවයක් හෝ බැඳීමක් පිළිබඳ යම් පිළිගැනීමකට යටත්ව සිටියහොත් ; හෝ

(ආ) වයසින් අවුරුදු දහ අටට අඩු වුවහොත්, හෝ (1963 අංක 9 & 4)

(ඇ) (1970 අංක 30 & 2)

(i). අධිකරණ නිලධරයකු ; හෝ
(ii). සන්නද්ධ හමුදාවල සාමාජිකයකු ;හෝ
(iii). පොලිස් නිලධරයකු ; හෝ
(iv). අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පොලිස් කටයුතු ක්‍රියාවෙහි යොදවන සාම නිලධරයෙකු ; හෝ

(iv) යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීමකට අවමවශයෙන් එක් වර්ෂයකට පෙර එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සේවය කිරීම අවසන් නොවූ එම පළාත් පාලන ආයතනය සඳහා නාමයෝජනා ඉල්ලා සිටින ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැලී සිටින රජයේ නිලධරයෙක්,

මෙම අනු- ඡේදයේ කාර්යය සඳහා "ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැලී සිටින රජයේ නිලධරයෙක්" යන්නට සංවර්ධන, සුභසාධන, ආර්ථික, සමාජ සෞඛ්‍ය හෝ ඔහුගේ සේවා නියුක්තියේ විෂයය පථය තුළ වූ වෙනත් ක්‍රියාකාරකම්වල නියැලී සිටින තැනැත්තකු ඇතුළත් වේ."

(1983 අංක 48 & 2) (v) ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක පහත දැක්වෙන ධූරයක් දරන රජයේ නිලධරයෙක් -

(අ) "2007 ජුනි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 2,27,280 කට නොඅඩු" වූ හෝ යම් තදන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් "2007 ජනවාරි මස 01 වන දිනට පෙර ඇතිකරන ලද ධූරයෙන් "

(ආ) "2007 ජනවාරි මස 01 වන දිනයෙන් පසු ඇති කරන ලද ධූරයෙන් "වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධූරයක් සම්බන්ධයෙන් වන විට, ඒ ධූරය ඇති කරන ලද දිනයේදී ඒ ධූරයට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (අ) විෂයයෙහි සඳහන් ධූරයකට ඒ දිනයේ දී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වන්නේ නම් ; හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයකදී ඉහත ,

පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධූරයක් :

(vi) යම් රාජ්‍ය සංස්ථාවක පහත දැක්වෙන ධූරයක් දරන නිලධරයෙක් -

(අ)ජනවාරි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප (1983 අංක 48 & 2)
වර්ෂයකට රු 2,46,300 කට නොඅඩු හෝ යම් ,තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපකට අනුරූප වන වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත "2009 ජනවාරි මස 01 වන දිනට පෙර ඇති කරන ලද යම් ධූරයක් " හෝ

(ආ) "2009 ජනවාරි මස 01 වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධූරයක් සම්බන්ධයෙන් වන විට, ඒ ධූරය ඇති කරන ලද දිනයේ දී ඒ ධූරයට අදාළ වැටුප් ප්‍රමාණයේ ආරම්භක වැටුප (අ) විෂයයෙහි සඳහන් ධූරයකට ඒ දිනයේදී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වන්නේ නම් හෝ තදනන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයකදී ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූපවන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධූරයක් ; සහ

"(ඇඇ)පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු වුවහොත්; හෝ."

(ඉ)ඒ ආයතනය විසින් තථ්‍ය සේවයෙහි යොදනු ලැබ ඒ ආයතනයෙන් නිලධරයකු හෝ සේවකයකු වුවහොත් හෝ ඒ ආයතනය විසින් සේවයෙහි යොදවා ගෙන සිටීම, ඒ ආයතනයට සභිකයන් තෝරා පත්කර ගැනීමේ දිනයට පෙර අවුරුද්දක කාලය ඇතුළත, අවසන් කරනු ලැබූ තැනැත්තකු වුවහොත් ; හෝ (1972 අංක 9 & 2)

(ඊ)ඒ ආයතනය සඳහා හෝ වෙනුවෙන් යම් තැනැත්තකු සමග ඇතුළත් වූ හෝ ඇතිකර ගත් යම් ගිවිසුමක් හෝ එකඟවීමක් හෝ පිළිගත් යම් කොමිස් මුදලක් තමා විසින්ම හෝ තමා සඳහා භාරයක් පිට හෝ තමාගේ ප්‍රයෝජනය සඳහා හෝ ප්‍රතිලාභය සඳහා හෝ තමා වෙනුවෙන් කවර හෝ වෙනත් යම් තැන්ත්තකු මඟින් හෝ අන්‍යාකාරයකින්, දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්,

එසේ වුවද අතීත සේවය සම්බන්ධයෙන් ඒ ආයතනය විසින් ප්‍රදානය කරන ලද යම් විශ්‍රාම වැටුපකට හෝ පාරිභෝගිකයට හෝ ඒ තැනැත්තා සාමාජිකයකු හෝ

කොටස්කරුවෙකු වන යම් සංස්ථාගත වෙළඳ සමාගමක් විසින් ස්වකීය සංස්ථාගත තත්ත්වයෙහිලා ඇතුලු වූ හෝ භාරගන්නා ලද යම් ගිවිසුමකට, එකඟවීමකට හෝ කොමිස් මුදලකට මෙහි ඇතුළත් කිසිවක් අදාල නොවිය යුතුය ; හෝ

(1953 අංක 25 & 6) (උ)සිහි විකලව සිටින බව ශ්‍රී ලංකාවේ බලපවත්නා නීතියක් යටතේ තීරණය කළහොත් හෝ ප්‍රකාශ කළහොත් : හෝ

(ඌ)සහතික නොලත් හෝ නිදහස් නොවූ වස්තු භංගත්වයට පත් වූවකු හෝ බුන්වතකු වුවහොත් ; හෝ

(එ)“මාස දොළහක් ඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමක් මගින් දඬුවම් පැමිණවිය යුතු වරදක් සම්බන්ධයෙන් බන්ධනාගාරගතවී සිටින හෝ පෙරාතුව ම වූ අවුරුදු හතක කාලයක් තුළ එවැනි බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් සම්පූර්ණ කළ හෝ මරණ දඬුවමකට යටත්ව සිටින හෝ මරණ දඬුවම වෙනුවට ප්‍රදානය කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ මරණ දඬුවම වෙනුවට ප්‍රදානය කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටින හෝ පෙරාතුව ම වූ අවුරුදු හතක කාලය තුළ එවැනි බන්ධනාගාරගතව සිටීමේ දඬුවමක් සම්පූර්ණ කළ ; හෝ ; සහ

(1972 අංක 9 & 2) (ඒ)*1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනතින් සංස්ථාපිත පළාත් පාලන සේවයේ සාමාජිකයෙකු වුවහොත්

එසේ වුවද,

(i). 2007 ජුනි මස 01 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් සම්බන්ධයෙන් වූ විට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 2.27,280කට අඩු හෝ ’ යන වචන ආදේශ කිරීමෙන්; සහ
තදනන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එ ආරම්භක වැටුපකට අනුරූපවන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට අඩු වැටුප් ප්‍රමාණයකට අඩු වැටුප් පරිමාණයක් මත 1970 නොවැම්බර් මස 18 වන දිනට පෙරාතුව ඇති කරන ලද තනතුරක් එදිනට දරන හෝ ;

(ii). "2007 ජූනි මස 01 වන දිනට පසුව"
තනතුරක් සම්බන්ධයෙන් වන විට, ඒ තනතුර ඇති කරන ලද දිනයේ දී ඉහත (i) ඡේදයේ සඳහන් තනතුරකට අදාළ වන හෝ ඉහත පළමුව සඳහන් ආරම්භක වැටුපට අනුරූප වන වාර්ෂික තනතුරක් දරන යම් තැනැත්තකු ප්‍රශ්නයට අදාළ ඡන්ද විමසීම් කරනු ලබන අවස්ථාවේ දී ඔහු තෝරා පත්කරනු ලැබීමට අපේක්ෂා කරන පළාත් පාලන ආයතනයේ සේවකයකු නොවේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ සේවකයකුව නොසිටියේ නම් එවැනි තැනැත්තකුට මෙහි අඩංගු විධිවිධාන කිසිවක් ව්‍යාප්ත නොවන්නේය ; හෝ

(ඔ) මේ වගන්තියෙ (2) වන උපවගන්තිය හෝ මේ ආඥාපනතේ 83 වන වගන්තිය ක්‍රියාත්මක වීම හේතුකොට ගෙන යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත්කර ගනු ලැබීමට නැතහොත් රැස්වීම්වලට සහභාගීවීමට හෝ ඡන්දය දීමට නුසුදුස්සකු වුවහොත් ; හෝ (1953 අංක 25 & 6)

(ඕ)මහජන ආයතන (දූෂණ වැලැක්වීමේ) ආඥාපනතේ 5 වන වගන්තියේ සඳහන් පරිදි වරදකරුවීමක් හේතුකොටගෙන හෝ පරීක්ෂණ කොමිසමක තීන්දුවක් හේතුකොටගෙන, ඒ ආඥාපනතේ විස්තරකෙරෙන පරිදි මහජන ආයතනයක සභිකයකු ලෙස ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ සභා රැස්වීමකට සහභාගීවීමට හෝ එහිදී ඡන්දය දීමට ඒ ආඥාපනතේ 5 වන වගන්තියෙන් නුසුදුස්සකු කරනු ලැබුවහොත් ; හෝ (1953 අංක 25 & 6)

(ක)අපරාධ වැලැක්වීමේ ආඥාපනතේ අර්ථානුකූල යම් අපරාධයකට වරදකරු කරනු ලැබ , මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනය නියමයක් සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් විඳිමින් හෝ පෙරාතුවම වූ පස් අවුරුදු කාලසීමාව තුළ විඳ අවසන් කොට සිටියහොත් ;

මේ ආඥාපනත යටතේ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ සභා රැස්වීමකට සහභාගී වීමට හෝ එහිදී ඡන්දය දීමට එවැනි කිසිම තැනැත්තකු සුදුස්සකු නොවිය යුතුය.

(1අ)එකම ඡන්ද විමසීම සඳහා එක් නාමයෝජනා පත්‍රයකට වැඩි ගණනක යම් තැනැත්තෙකුගේ නම අපේක්ෂකයකු ලෙස දැක්වෙයි නම් එවැනි කිසිම තැනැත්තෙක් යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස මේ ආඥාපනත යටතේ තෝරාපත්පත්කර ගනු ලැබීමට හා අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට හෝ සුදුදුකම් නොලබන්නේ ය. (1977 අංක 24 & 8)

(2) යම් තැනැත්තකු යම් විටෙක - (1953 අංක 25 & 6)

(අ)1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ යම් විධිවිධානයක සඳහන් වන්නා වූ වරදකරු කරනු ලැබීමක් හේතුකොටගෙන හෝ එකී ආඥාවට අනුකූලව මැතිවරණ විනිශ්චයාකාරවරයකුගේ වාර්තාවක් හේතු කොටගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත් කරනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට එකී ආඥාවේ යම් විධිවිධානයක් යටතේ නුසුදුස්සකු වුවහොත් ; හෝ

(ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයේ සඳහන් පරිදි විනිශ්චය කරනු ලැබීමේ හේතුවෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට හෝ නුසුදුස්සකු බවට පත්කරනු ලැබුවහොත්,

ඒ කවර විටෙකදී හෝ ඒ තැනැත්තා මේ ආඥාපනත යටතේ තෝරා පත්කර ගැනීමට හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට හෝ නුසුදුස්සෙකු විය යුතුය.

(1987 අංක 20 & 4) (3)(1) වන උපවගන්තයේ සහ (2) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මහ නගර සභාවක නගරාධිපති ධූරයෙන් හෝ සභික ධූරයෙන් යම් සංවර්ධන සභාවක හෝ යම් නගර සභාවක හෝ යම් ප්‍රාදේශිය සභාවක සභාපති ධූරයෙන් හෝ සභික ධූරයෙන් යම් සංවර්ධන සභාවක හෝ යම් නගර සභාවක හෝ යම් ප්‍රාදේශීය සභාවක සභාපති ධූරයෙන් හෝ සභික ධූරයෙන් අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභා පනතේ 63 වන වගන්තිය යටතේ හෝ නගර සභා ආඥාපනතේ 184 වන වගන්තිය යටතේ හෝ ප්‍රාදේශිය සභා පනතේ 179 වන වගන්තිය යටතේ හෝ පළ කරනු ලැබූ නියමයක් මගින් , නියමිත දිනයට පසු යම් අවස්ථාවක ඉවත් කරනු ලැබූ කිසිම තැනැත්තකු, ඒ ධූරයෙන් ඉවත් කරනු ලැබීමේ දින සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා මේ ආඥාපනත යටතේ තෝරා පත්කර ගනු ලැබීමට හෝ යම් පළාත් පාලන ආයතනයක අසුන් ගැනිමට හෝ ඡන්දය දීමට හෝ සුදුස්සෙකු නොවන්නේය ය.

(1970 අංක 30 & 2) (5) * මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ)“අධිකරණ නිලධරයා” යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූල ව අධිකරණ ධූරයක් දරන තැනැත්තෙකු අදහස් වන අතර -

(i). සමාදාන විනිශ්චයකාරවරයකු.
(ii). සමාදාන විනිශ්චයකාර නිල නොලත් මහේස්ත්‍රාත්වරයෙකු.
(iii). දිවුරුම් කොමසාරිස්වරයෙකු , සහ
(iv). අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පරීක්ෂකවරයෙකු එයට ඇතුළත් නොවිය යුතුය .

(ආ)“පොලිස් නිලධරයා” යන්නෙන් පොලිස් ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ පොලිස් හමුදාවේ සාමාජිකයෙක් අදහස්වේ.

(ඇ)“සන්නද්ධ හමුදා” යන්නෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ ; තව ද

(ඈ)“රාජ්‍ය සංස්ථාව” යන්නෙන් රජය විසින් සම්පූර්ණ මූලධනය හෝ ඉන් කොටසක් යොදවනු ලැබූ සංස්ථාවක් අදහස් වේ.

## ධූරය අත්හැරීම

සභිකත්වය අත්හැරීම

10. (1) 9 වන වගන්තියේ යම් විධිවිධානයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් පළාත් පාලන ආයතනයක යම් සභිකයකු ඒ ආයතනයේ සභිකයකු වශයෙන් අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට නුසුදුස්සකු වුවහොත් ඔහුගේ ආසනය හෝ ධූරය ඒ නයින් ම හිස් විය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් පළාත් පාලන ආයතනයක සභිකයෙකුගේ ආසනය හෝ ධූරය හිස්වූ අවස්ථාවක ඒ පළාත් පාලන ආයතනය සංස්ථාපනය කර ඇත්තේ යම් ප්‍රඥප්තියකින් ද නැතහොත් යම් ප්‍රඥප්තියක් යටතේ ද ඒ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ සභිකයා තම ආසනයෙන් හෝ ධූරයෙන් ඉල්ලා අස්වූ විටෙක දී අදාළ වන ආකාරයටම එසේ හිස් වූ ආසනය හෝ ධූරය පිරවීමේ කාර්යය සඳහා ද අදාළ විය යුතුය.

10අ. (1) යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරාපත්කරගනු ලැබීම පිණිස අපේක්ෂකයකු ලෙස යම් පිළිගත් දේශපාලන පක්ෂයක නාම යෝජනා පත්‍රයෙහි නම සඳහන් ව ඇති යම් තැනැත්තකු ඒ පක්ෂයෙහි සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇතැයි, ඒ පළාත් පාලන ආයතන ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා සෑහීමට පත්වුවහොත් ඒ ඡන්ද විමසීම නිලධරයා විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මඟින් ඒ තැනැත්තා -

(අ) ඒ පළාත් පාලන ආයතනයෙහි සභිකයකු ලෙස තෝරාපත් කරගනු ලැබ සිටී නම්, ඒ තැනැත්තා ස්වකීය සභික ධූරය අත්හැර ඇතැයි හෝ;

(ආ)යම් අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ නාම යෝජනා පත්‍රයෙහි සිය නම තබා ගැනීමේ ස්වකීය අයිතිවාසිකම අහිමිකර ගෙන ඇතැයි , ඒ ප්‍රකාශ කරනු ලැබිය යුතුය. එවිට, ඒ ප්‍රකාශය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා ඒ පළාත් පාලන ආයතනයේ සභිකයකු ලෙස දැරූ ස්වකීය ධූරය අත්හැරිය යුතුය. නැතහොත් ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ නාමයෝජනා පත්‍රයෙන් එම තැනැත්තාගේ නම ඉවත් කළ යුතු ය.

(2) ඡන්ද විමසීම් නිලධරයා විසින් -

(අ)එම තැනැත්තා සහ ඒ පිළිගත් දේශපාලන පක්ෂය වෙත දැන්වීමක් කිරීමෙන් පසුව ; සහ

(ආ)ඒ දැන්වීමක් කළ දිනයේ සිට දින විසි එකක කාලසීමාවක් ගතවූවාට පසුව මිස (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීමක් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

(3) පිළිගත් දේශපාලන පක්ෂයක නාම යෝජනා පත්‍රයෙහි නම ඇතුළත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඒ පක්ෂයෙහි සාමාජිකයෙකුව සිටීම අවසන් වන කවර අවස්ථාවකදී වුවද, ඒ පක්ෂයේ ලේකම්වරයා විසින්, ඒ නාම යෝජනා පත්‍රය අදාළ වන පළාත් පාලන ආයතනය පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා වෙත එම තොරතුරු සපයනු ලැබිය යුතුය.

ධූරය අත්හැරීමෙන් පසු සභිකයකු වශයෙන් ක්‍රියා කිරීමට දඬුවම

11.10 වන වගන්තියේ විධිවිධාන යටතේ තම ආසනය හා ධූරය හිස් වීමෙන් පසු දැන දැනම, යම් පළාත් පාලන ආයතනයක සභිකයකුගේ ධූරයෙහි කටයුතු කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී ඔහු එසේ සභිකයකු ලෙස කටයුතු ලෙස කටයුතු කරන එක් එක් දිනය සම්බන්ධයෙන් රුපියල් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය.

## III වන කොටස

(1977 අංක 24 & 10)

**ඡන්ද කොට්ඨාස වශයෙන් බෙදීම සහ ඡන්ද හිමි නාමලේඛන පිළියෙල කිරීම**

***ඡන්ද කොට්ඨාශ වශයෙන් බෙදීම***

පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශය පළාත් පාලන ඡන්ද විමසීම් සඳහා ඡන්ද කොට්ඨාශය ලෙස සැලකිය යුතු බව. (1977 අංක 24 & 11)

12 (1) යම් පළාත් පාලන ආයතන ප්‍රදේශයක තත් කාලයෙහි වලංගුව පවත්නා එක් එක් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාසය එම පළාත් පාලන ආයතනයෙහි ඡන්ද විමසීම් කාර්ය සඳහා ඡන්ද කොට්ඨාශයක් සලකනු ලැබිය යුතුය.

"එසේම තව දුරටත්,

(i). පළාත් පාලන ආයතනයක එක් එක් කොට්ඨාසය එම පළාත් පාලන ආයතනයෙහි ඡන්ද විමසීමේ කාර්යය සඳහා ඡන්ද ප්‍රදේශයක් වශයෙන් සලකනු ලැබිය යුතුය සහ ;

(ii). "නමකින් සහ අංකයකින්" එක් එක් කොට්ඨාසයක වූ ඉංග්‍රීසි අක්ෂරයකින් හඳුනාගනු ලැබිය යුතු ය. "

එසේ වුවද ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ඡන්ද විමසීම් නිලධරයා විසින් , පළාත් පාලන ඡන්ද විමසීමේ කාර්ය සඳහා එවැනි යම් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාසයක් වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(2) දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරයා විසින් -

(අ)කොමසාරිස්වරයා විසින් නිකුත් කළ හැකි නියමයන්ට අනුකූල පළාත් පාලන ආයතනයේ ඡන්ද කොට්ඨාසය එකක් හෝ වැඩි ගණනකට වෙන් කළ යුතු ය;

(ආ)වෙන්කොට හඳුනාගත හැකි අකුරක් හෝ අකුරු එක් එක් ඡන්ද කොට්ඨාසයට සඳහා වෙන් කළ යුතු ය;

(ඇ)එම එක් එක් ඡන්ද දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් එම දිස්ත්‍රික්කයට අදාළ ඡන්ද පොළවල් පිහිටිය යුතු ස්ථානය තීරණය කළ යුතු ය; සහ

(ඈ)ඉහත (අ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් විස්තර ඇතුළත් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය;

(2අ) කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කළහොත් මිස, ඡන්ද ප්‍රදේශයක් ඡන්ද දිස්ත්‍රික්ක සඳහා වෙන් කිරීම, එසේ වෙන් කරනු ලබන අවස්ථාවේ දී එක් එක් ඡන්ද කොට්ඨාසයෙහි ඡන්දදායකයන්ගේ සංඛ්‍යාව එක් දහස් පන්සියයකට නොවැඩි වන පරිදි විය යුතු ය.

(2ආ) (2අ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඡන්ද ප්‍රදේශයක් ඡන්ද කොට්ඨාස සඳහා වෙන් කිරීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා විසින් අවශ්‍යතාව අනුව වෙනස් කිරීමක් සිදු කරනු ලැබූ විට ඔහු විසින් (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් විස්තර නිශ්චිතව දක්වා ඇති සහ එම වෙනස් කිරීම බලාත්මක වන දිනය දක්වා ඇති දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(2ඇ) කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් යෝජිත සංශෝධන, මහජනතාව වෙත දැනුම්දිය යුතු අතර එම යෝජිත සංශෝධනය සම්බන්ධයෙන් නියෝජන ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් විස්තර සම්බන්ධයෙන් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි අතර, එය එම දැන්වීමෙහි නිශ්චිතව දැක්විය යුතු ය . ; සහ

(3) ඡන්දදායිකාවන් සඳහා වෙනම ඡන්ද පොළක් සලසාදීම යම් අවස්ථාවක් විශේෂ කරුණු අනුව අවශ්‍යයයි හෝ යෝග්‍ය යයි ඡන්ද විමසීම් නිලධරයා සලකයි නම් මිස, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා එක් ඡන්ද මධ්‍යස්ථානයකට නොඅඩු සංඛ්‍යාවක් තිබිය යුතු ය.

පළාත් පාලන ආයතනයක හෝ කොට්ඨාසයක පරිපාලනය සීමා වෙනස් කිරීම.

12අ. යම් පළාත් පාලන ආයතනයක හෝ පළාත් පාලන ආයතන බෙදා වෙන්කරනු ලැබ ඇති කොට්ඨාසයක පරිපාලන සීමා , එම පළාත් පාලන ආයතනය පිහිටුවා ඇති යම් නීතියක් යටතේ වෙනස් කරනු ලැබූ විට හෝ අමාත්‍යවරයා විසින් මෙම ආඥාපනතේ 3ඈ වගන්තිය යටතේ වෙනස් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, එම පරිපාලන සීමා වෙනස් කරනු ලැබූ පළාත් පාලන ආයතනය හෝ කොට්ඨාසයට සහ ඊට අදාළව 12 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, අදාළ විය යුතු ය.

(අ)කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව ඒ පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීම් ප්‍රදේශය ඡන්ද කොට්ඨාසවලට බෙදිය හැකි ය;

(ආ)ඒ එක් එක් ඡන්ද කොට්ඨාසයට හඳුනා ගැනීමේ අක්ෂරයක් හෝ අක්ෂර පැවරිය හැකි ය;

පාර්ලිමේන්තු මැතිවරණ නාම ලේඛන පළාත් පාලන ඡන්ද විමසීම් සඳහා භාවිතා කළ යුතු බව.
(1977 අංක 24 & 14)

සභිකයන් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමක කාර්ය සඳහා ඡන්ද විමසීම් නිලධරයා විසින් **"එවැනි ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාසයක් සඳහා වන ඡන්ද හිමි නාමලේඛන සහතික කළ යුතු"** එම නාමලේඛන එම පළාත් පාලන ආයතනයේ **"එවැනි ඡන්ද විමසීම් ප්‍රදේශයක අදාළ කොට්ඨාසයට අනුරූප වන"** බලාන්විතව පවත්නා පාර්ලිමේන්තු මැතිවරණ නාමලේඛනයෙන් හෝ ලේඛනවලින් හෝ නාම ලේඛනයක කොටස්වලින් හෝ ඒවායේ යම් සංකලනයකින් හෝ සමන්විත විය යුතුය.

ඡන්දහිමි නාමලේඛන පරීක්ෂණය සඳහා විවෘතව තැබිය යුතු බව
(1977 අංක 24 & 14)
(1978 අංක 35 & 3)

12ඈ.* 12ඈ වන වගන්තිය යටතේ ඡන්ද හිමි නාමලේඛනය සහතික කරනු ලැබූ විට එම නාමලේඛනය හෝ එහි පිටපත්, ඒ නාමලේඛනය අදාළ වන්නේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයකට ද ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය කාර්යාලයේ දී කාර්යාල වේලාවල් තුළ නොමිලයේ පරීක්ෂා කිරීම පිණිස වහාම විවෘතව තැබිය යුතුය. නාමලේඛනය පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බවට දැන්වීමක් ඡන්ද විමසීම් නිලධරයා විසින් පළකරනු ලැබිය යුතුය. 12ඈ වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද සහ සහතික කරන ලද **යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාසයක ඡන්දහිමි නාමලේඛනය** එසේ සහතික කරනු ලැබූ දිනයෙහි ක්‍රියාත්මක විය යුතු ය.

ඡන්ද විමසීම් නිලධාරියා විසින් ලිපි දෝෂ නිවැරදි කළ යුතු බව
(1977 අංක 24 & 14)

12ඉ. යම් ඡන්ද හිමි නාමලේඛනයක් සහතික කිරීමට පෙර, එහි කර ඇතැයි ඡන්ද විමසීම් නිලධරයකුට පෙනී යන යම් ලිපි දෝෂයක් ඒ ඡන්ද විමසීම් නිලධරයා විසින් නිවැරදි කිරීම, මේ ආඥාපනතෙහි සඳහන් කිසිවකින් තහනම් වෙතැයි නොසැලකිය යුතුය.

නාමලේඛන පිළියෙල කිරීම හා සම්බන්ධ විධිවිධාන අදාල කිරීම
(1977 අංක 24 & 14)

12ඊ **"අවස්ථාවෝචිත පරිදි, යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීම් ප්‍රදේශයේහි හෝ යම් කොට්ඨාසයක සීමා කොතරම් වෙනස්කොට තිබේද යත්"** අලුති ඡන්ද හිමි නාමලේඛනයක් පිළියෙල කිරීම අවශ්‍ය වෙතැයි අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින්, ඒ නියමය පළ කරනු ලැබීමෙන් පසු ඉක්බිතිව ම ඒ පළාත් පාලන ආයතනයේ සභිකයන් තෝරා පත්කර ගැනීම සඳහා භාවිත කළ යුතු ඡන්ද හිමි නාමලේඛනය, මේ ආඥාපනතේ මතු දැක්වෙන විධිවිධාන වලට අනුකූලව පිළියෙල කල යුතු යැයි විධාන කළ යුතුය.

**නාමලේඛන පිළියෙල කිරීම සම්පූර්ණ කළ බවට දැන්වීම.**

(1977 අංක 24 & 18)
ඡන්ද හිමි නාමලේඛනය පිළියෙල කිරීම සම්පූර්ණ කළ බවට දැන්වීම.
(1977 අංක 24 & 19)

16* **"යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාසවල ඡන්ද හිමි නාමලේඛන"** පිළියෙල කිරීම සම්පූර්ණ කළ විට, ඒ පිළියෙල කිරීම සම්පූර්ණ කළබව සඳහන් කරමින් ඡන්ද විමසීම් නිලධරයකු විසින් සිංහලෙන් සහ දෙමළෙන් දැන්වීමක් පළ කළ යුතුය.
එහි නාමලේඛනය හෝ එහි පිටපත් ඒ ප්‍රදේශයේ පළාත් පාලන ආයතන කාර්යාලයේ දී කාර්යාල වේලාවල් තුළ නොමිලයේ පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතුය. නාමලේඛනය එසේ පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බවට ප්‍රකාශයක් පෙර කී දැන්වීමෙහි ඇතුළත් විය යුතුය.

*1978 අංක 35 දරන පනතින් 12ඈ වන වගන්තිය ඉවත් කරන ලදී.
*1314. හා 15 වන වගන්ති ඉවත් කරන ලදී. 1977 අංක 24 දරන පනතේ 15 හා 17 වන වගන්ති බලන්න.

**හිමිකම් පෑම් හා විරෝධය පෑම්**

17.(1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක **"කොට්ඨාසයන්හි ඡන්ද හිමි නාමලේඛන"** සම්බන්ධයෙන් 16 වන වගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබූ විට -

(අ) එවැනි යම් නාමලේඛනයක තමාගේ නම ඇතුළත් කර ගැනීමට මේ ආඥාපනත යටතේ අයිතිවාසිකමක් ඇතැයි හිමිකම් පාන්නාවූ ද එසේ නම ඇතුළත්ව නොමැත්තා වූද, යම් තැනැත්තකු විසින් තමාගේ නම එහි ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ආ)එවැනි යම් නාමලේඛනයක තමාගේ නම ඇතුළත්ව තිබෙන්නාවූ ද වෙනත් යම් තැනැත්තකුගේ නම එහි ඇතුළත්ව තිබීම ගැන විරෝධය පාන්නා වූ ද යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තාගේ නම එම ලේඛනයෙන් කපා හැරීම ලෙස ඉල්ලුම් කළ හැකි ය.

(අ) ඡේදය යටතේ වූ (මෙහි මින් මතු "හිමිකම් පැමක්" යනුවෙන් සඳහන් කරනු ලබන සෑම ඉල්ලීමක් සහ (ආ) ඡේදය යටතේ වූ (මෙහි මින් මතු විරෝධය පැමක් යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම ඉල්ලීමක් ම දැන්වීම් පළ කරනු ලැබූ දින සිට දින දහ හතරක් ඉකුත්වීමට පෙර, එම ප්‍රදේශය පිහිටියේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා වෙත ලියවිල්ලකින් කළ යුතුය.

(2)(1) වන උපවගන්තියේ සඳහන් කාලය තුළ දී ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස කිසිම හිමිකම් පැමක් හෝ විරෝධය පැමක් ඡන්ද විමසීම් නිලධරයා විසින් භාර නොගත යුතුය.

18(1) **යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාසවල ඡන්දහිමි නාමලේඛන** සම්බන්ධයෙන් 16 වන වගන්තිය යටතේ දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින හතරක කාලයක් ඉකුත් වූ, ඒ නාමලේඛනය සම්බන්ධයෙන් යම් හිමිකම් පැමක් හෝ විරෝධය පැමකි විධිමත් ලෙස කර තිබේ නම්, ඒ ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා විසින් -

(අ) එසේ කරන ලද එක් එක් හිමිකම් පැම හෝ විරෝධය පැම දක්වමින්

(ආ) ඒ එක් එක් හිමිකම් පැම හෝ විරෝධය පැම විභාග කිරීමේ කාර්යය සඳහා ප්‍රදේශයේ පළාත් පාලන ආයතන කාර්යාලයට හෝ ඔහු විසින් දැන්විමෙහි සඳහන් කරනු ලබන වෙනත් යම් ස්ථානයකට ඒ දැන්විමෙහි සඳහන් කරනු ලබන දිනයක දී සහ වේලාවකදී තමා පැමිණ සිටින බව සඳහන් කරමින් ; සහ

(ඇ) එසේ සඳහන් කරන ලද දිනයේ දී සහ වේලාවේ දී හා ස්ථානයේදී තමා ඉදිරියේ පෙනී සිටින ලෙස සෑම හිමිකම් පාන්නකුට සහ යම් හිමිකම් පාන්නකුට විරුද්ධත්වය පළ කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුටම ද සෑම විරෝධය පාන්නකුට සහ විරෝධය පාන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට ද නියම කරමින් දැන්විමක් පළ කළ යුතුය.

(2) (අ) දැන්වීමෙහි දක්වා ඇති දිනයේ දී හා වේලාවෙහි දී එහි සඳහන් ස්ථානයට ඡන්දය විමසීම් නිලධරයා පැමිණිය යුතු අතර, ඒ දැන්වීමෙහි දක්වා ඇති එක් එක් හිමිකම් පැම හෝ විරෝධය පැම පිළිබඳ තීරණයක් අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලැබිය හැකි ලසු විභාගයකින් පසු, එදිනම හෝ එදින සිට දින දහයක් ඇතුළත දී ඔහු විසින් කළ යුතුය.

(ආ) මේ වගන්තිය යටතේ යම් හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් පිළිබඳ තීරණයක් කිරීමට පෙර, අවස්ථාවෝචිත පරිදි හිමිකම් පාන්නාට සහ හිමිකම් සෑම කෙරෙහි විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන සෑම තැනැත්තාටම හෝ විරෝධය පාන්නාට සහ විරෝධය පා ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාටත් තම කරුණු දැක්වීමට අවස්ථාවක් ඡන්ද විමසීම් නිලධරයා විසින් සැලසිය යුතුය.

(ඇ) යම් හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් තීරණය කිරීමේ කාර්යය සඳහා මේ වගන්තිය යටතේ තමා විසින් කරන ලද සියලුම කටයුතු පිළිබඳ සටහන් ඡන්ද විමසීම් නිලධරයා විසින් ලියා වාර්තා කර තැබිය යුතුය.

(3) යම් හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් තීරණය කිරීමේ කාර්යය සඳහා ප්‍රතිඥාවක් හෝ දිවුරුවීම ලබාගැනීම ඡන්ද විමසීම් නිලධරයා විසින් කළ හැකිය. තවද එසේ ප්‍රඥාදීමෙන් හෝ දිවුරුවීමෙන් පසු දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු වරදක් කරන අතර නඩු කටයුත්තක දී බොරු සාක්ෂි දීමේ වරද සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ නියම කොට ඇති දඬුවම්වලට ඔහු යටත් විය යුතු ය.

(4) සෑම හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ඡන්ද විමසීම් නිලධරයා කරන තීරණය 20 වන හා 21 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

(1977 අංක 24 & 21) (5) **"ඡන්දහිමි නාමලේඛන"** සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සියලු හිමිකම් පෑම් සහ විරෝධය පෑම් තීරණය කිරීමෙන් පසුව, ඡන්ද විමසීම් නිලධරයා විසින් එවැනි යම් තීරණයක් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි ඔහුට පෙනී යන සංශෝධන **"නාමලේඛනවල"** කරනු ලැබිය යුතුය.

(1953 අංක 25 & 10) (6)යම් හිමිකම් පෑමක දී හෝ විරෝධය පෑමකදී හෝ ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන විභාගයකදී ඕනෑකමින් ම අසත්‍ය ප්‍රකාශයක් හෝ ප්‍රකාශනයක් කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට යටත්විය යුතුය.

(1953 අංක 25 & 10) (7) යම් හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් විභාග කිරීම සඳහා මේ වගන්තිය යටතේ පැවැත්වෙන යම් විභාගයක දී ඡන්ද විමසීම් නිලධරයා විසින් විනය පවත්වා ගෙන යා යුතු අතර, එක් වරකට ඇතුළු විය යුතු තැනැත්තන්ගේ සංඛ්‍යාව විධිමත් කළ යුතුය. තවද අවස්ථාවෝචිත පරිදි, හිමිකම් පාන්නා සහ ඒ හිමිකම් පෑම කෙරෙහි විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ විරෝධය පාන්නා සහ ඒ විරෝධය පා ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා ද රාජකාරියේ නියුක්ත වී සිටින පොලිස් නිලධරයන් සහ විභාගයේ කාර්යයන් සඳහා නිල වශයෙන් සේවයේ යොදවනු ලැබ සිටින අනෙක් තැනැත්තන් ද හැර සියලු තැනැත්තන් ඡන්ද විමසීම් නිලධරයා විසින් බැහැර කළ හැකිය.

(8)යම් හිමිකම් පෑමක් හෝ විරෝධය පෑමක් විභාග කිරීම සඳහා මේ වගන්තිය යටතේ පවත්වනු ලබන යම් විභාගයක දී යම් තැනැත්තකු අයථා අන්දමට හැසිරුන හොත් හෝ ඡන්ද විමසීම් නිලධරයාගේ නිත්‍යානුකූල නියමවලට අවනත වීම පැහැර හැරියහොත්,

ඡන්ද විමසීම් නිලධරයා විසින් යම් පොලිස් නිලධරයකු ලවා හෝ ඡන්ද විමසීම් නිලධරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ වෙන යම් තැනැත්තකු ලවා එකී තැනැත්තා විභාගය පවත්වන ස්ථානයෙන් ඉවත් කරවිය හැකිය.

(9)මේ වගන්තිය යටතේ විභාගයකින් පවත්වනු ලබන ස්ථානයකින් ඉවත් කරනු ලැබූ තැනැත්තකුට-

(අ) ඡන්ද විමසීම් නිලධරයාගේ අවසරය ඇතිව මිස, විභාගය පවත්වන කාලය තුළ ඒ ස්ථානයට යළි ඇතුළු වීමට ඉඩ නොදිය යුතුය. තවද

(ආ)ඒ ස්ථානයෙහි දී වරදක් කරන ලදැයි චෝදනා කරනු ලැබ ඇතහොත් ඔහු මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට පමුණුවනු ලබන තුරු අත් අඩංගුවේ තැබිය හැකිය.

19.(1) කිසිම තැනැත්තකුට තමාගේ නම -

(අ) එක ම ඡන්ද විමසීම් ප්‍රදේශයක හෝ වෙනස් ඡන්ද විමසීම් ප්‍රදේශවල කොට්ඨාසයන්හි ඡන්දහිමි නාමලේඛන එකකට වඩා වැඩි වැඩි ගණනක ; හෝ

(ආ)එකම ඡන්ද හිමි නාමලේඛනයෙහි, සුදුසුකම් ලැබීමේ විවිධ ලිපිනයන් යටතේ එක් වතාවකට වැඩියෙන් ; හෝ

ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට සුදුසුකම් තිබුණ ද එසේ ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට අයිතිවාසිකම් නොතිබිය යුතුය.

(2) (අ) යම් තැනැත්තකුට තමාගේ නම -

(i). ඡන්ද හිමි නාමලේඛන එකකට වැඩි ගණනක ; හෝ

(ii). සුදුසුකම් ලැබීමේ විවිධ ලිපිනයන් යටතේ එකම ඡන්ද හිමි නාමලේඛනයෙහි එක් වතාවකට වැඩියෙන් හෝ ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට සුදුසුකම් ලැබ ඇතැයි පෙනී යන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට ඔහු අදහස් කරන්නේ යම් ඡන්ද හිමි නාමලේඛනයකද, ඒ නාමලේඛනය නැතහොත් ඔහුගේ නම එකම ඡන්ද හිමි නාමලේඛනයෙහි ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට ඔහු අදහස් කරන්නේ යම් සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ ද, ඒ ලිපිනය, දැන්වීම භාර දීමෙන් පසු දින හතක් ඇතුළත සඳහන් කර එවන ලෙස නියම කරමින් ඒ තැනැත්තා වෙත දැන්වීමක් භාර දීමට ඡන්ද විමසීම් නිලධරයකු විසින් කටයුතු සැලැස්විය යුතුය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් දැන්වීමක් ඒ තැනැත්තාට සාමාන්‍ය තැපැලෙන් යැවීමෙන් හෝ ඔහුට හෝ ඔහුගේ පවුලේ වැඩිහිටි සාමාජිකයෙකුට දීමෙන් හෝ ඔහු වෙත භාර දීම කළ හැකිය.

(1977 අංක 24 & 22) (3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ දැන්වීමක් අනුව යම් තැනැත්තකු -

(අ) තමාගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට තමා අදහස් කරන්නේ යම් ඡන්ද හිමි නාමලේඛනයක ද ඒ නාමලේඛනයේ සඳහන් කරනු ලබන්නාවූ ද ඒ නාම ලේඛනයේ ඔහුගේ නම ඇතුළත් කරනු ලැබීමට හෝ තබා ගැනිමට ඒ තැනැත්තා සුදුස්සකු බවට අදාළ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා සෑහීමට පත් වන්නා වූ ද අවස්ථාවක ඒ තැනැත්තාගේ නම, අන් කිසි ඡන්ද හිමි නාමලේඛනයක නොව, ඒ ලේඛනයෙහි ම ඇතුළත් කිරීම හෝ තබා ගැනීම කළ යුතුය. නැතහොත්

(ආ) එම ඡන්ද හිමි නාමලේඛනයෙහි ම තමාගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට තමා අදහස් කරන්නේ යම් සුදුදුකම් ලැබීමේ ලිපිනයක් යටතේ ද, ඒ ලිපිනය සඳහන් කරනු ලබන්නා වූ ද, ඒ නාමලේඛනයේ ඒ ලිපිනය යටතේ ඔහුගේ නම ඇතුළත් කරනු ලැබිමට හෝ තබා ගැනීමට ඒ තැනැත්තා සුදුස්සකු බවට ඒ ඡන්ද හිමි නාමලේඛනය අදාළ වන කොට්ඨාසය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයකද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා සෑහිමට පත්වන්නාවූ ද අවස්ථාවක ඒ තැනැත්තාගේ නම, ඒ නාමලේඛනයේ අන් කිසි ලිපිනයක් යටතේ නොව, ඒ නාමලේඛනයේ ඒ ලිපිනය යටතේ ම ඇතුළත් කිරීම හෝ තබා ගැනීම කළ යුතුය.

(4) (2)වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ දැන්වීමක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරින ලද අවස්ථාවක -

(අ) ඒ තැනැත්තාට ඒ දැන්වීමෙන් නියම කරන ලද්දේ ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබාගැනීමට ඒ තැනැත්තා අදහස් කරන්නේ යම් ඡන්ද හිමි නාමලේඛනයක ද ඒ ඡන්ද හිමි නාමලේඛනය සඳහන් කර එවන ලෙස නම්, ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට ඒ තැනැත්තා සුදුසුකම් ලබා ඇති ඡන්ද හිමි නාමලේඛන අතුරෙන් ඒ නම ඇතුළත් කළ යුතු හෝ තබා ගත යුතු ඡන්ද හිමි නාමලේඛනය කුමක්දැයි උචිත ඡන්ද විමසීම් නිලධරයා විසින් නිශ්චය කළයතු අතර ඒ නම වෙත යම් ඡන්ද හිමි නාම ලේඛනයක නොව, ඒ නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ඡන්ද හිමි නාම ලේඛනයක නොව, ඒ නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ඡන්ද හිමි නාමලේඛනයෙහිම ඇතුළත් කිරීම හෝ තබා ගැනිම කළ යුතුය ; නැතහොත්

(ආ) ඒ තැනැත්තාට ඒ දැන්විමෙන් නියම කරන ලද්දේ ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීම ට ඒ තැනැත්තා අදහස් කරන්නේ ඒ ඡන්ද හිමි නාමලේඛනයෙහිම සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ ද ඒ ලිපිනය සඳහන් කර එවන ලෙස නම්, ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට ඒ තැනැත්තාට සුදුසුකම් ඇති ඒ ඡන්ද හිමි නාමලේඛනයෙහිමවූ සුදුකම් ලැබීමේ ලිපිනයන් අතුරෙන් කවර ලිපිනයක් යටතේ ඒ නම ඒ ඡන්ද හිමි නාමලේඛනයෙහි ඇතුළත් කළ යුතු දැයි හෝ තබා ගත යුතු දැයි උචිත ඡන්ද විමසීම් නිලධරයා විසින් නිශ්වය කළ යුතු අතර ඒ නම ඒ ඡන්ද හිමි නාමලේඛනයෙහි වූ සුදුසුකම් ලැබීමේ වෙන යම් ලිපිනයක් යටතේ නොව ඒ ඡන්ද හිමි නාමලේඛනයෙහි වූ ඒ නිලධාරයා විසින් නිශ්වය කරනු ලබන සුදුසුකම් ලැබීමේ ලිපිනය යටතේ ම ඇතුළත් කිරීම හෝ තබා ගැනීම කළ යුතුය.

(5) (2) වන උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ භාර දෙනු ලැබූ යම් දැන්වීමක් අනුව ක්‍රියා කිරිම යම් තැනැත්තකු විසින් පැහැර හැරීම හෝ ඒ තැනැත්තා සම්බන්ධයෙන් (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම ඡන්ද විමසීම් නිලධරයකු විසින් පැහැර හැරීම හෝ නියමිත පරිදි ක්‍රියා කිරීමෙන් පසු ඒ තැනැත්තාගේ නම ඒ තැනැත්තා විසින් සඳහන් කර එවූ යම් ඡන්ද හිමි නාමලේඛනයක හෝ ඒ ඡන්ද හිමි නාමලේඛනයෙහි සුදුසුකම් ලැබිමේ යම් ලිපිනයක් යටතේ ඇතුළත් නොකරනු ලැබීම හෝ තබා නොගැනීම හේතු කොට ගෙන, අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට ඔහුට සුදුසුකම් ඇති යම් ඡන්ද හිමි නාමලේඛනයක හෝ ඒ නාම ලේඛනයෙහි වූ සුදුසුකම් ලැබීමේ යම් ලිපිනයක් යටතේ 82 වන වගන්තියේ හා (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඔහුගේ නම ඇතුළත් කර ගැනීමට හෝ තබා ගැනීමට ඔහුට ඇති අයිතිවාසිකම කෙරෙහි බලපෑමක් හෝ හානියක් නොවිය යුතුය.

**අභියාචනා**

20 (1) ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාසවල ඡන්දහිමි නාමලේඛනවලට අදාළ යම් හිමිකම් පෑමක් පිළිබඳව යම් ඡන්ද විමසීම් නිලධරයකුගේ තීරණය ගැන යම් හිමිකම් පාන්නකු හෝ විරෝධය පාන්නකු විරෝධයක් පා ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා හෝ සෑහීමට පත් නොවෙතහොත් ඒ තීරණයේ දින සිට දින දහයක් ඉකුත් වීමට පෙර ඔහු විසින් වෙනත් යම් හේතු මත නොව, එම තීරණයට සම්බන්ධ යම් නෛතික ප්‍රශ්නයක් මත ඒ තීරණය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කළ හැකිය.

(2)මේ වගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම රුපියල් පහක වටිනාකම ඇති මුද්දරයක් හෝ මුද්දර සහිත පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අභියාචනා පෙත්සම ඡන්ද විමසීම් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර ඔහු විසින් ඒ අභියාචනයට සම්බන්ධ නඩු කටයුතු වාර්තාව සමග එය අභියාදනාධිකරණයේ රේජිස්ට්‍රාර්වරයා වෙත වහාම ඉදිරිපත් කළ යුතුය.

(3) අභියාචක විසින් අභියාචනයෙහි වගඋත්තරකරුවෙකු ස්වකීය පෙත්සමෙහි නම් කළ යුතු අතර, ඒ වගඋත්තරකරු-

(අ)අභියාචක හිමිකම් පාන්නකු නම් , ඡන්ද විමසීම් නිලධරයා විය යුතුය.
.

(ආ)අභියාචක විරෝධය පාන්නකු නම්, ඒ විරෝධය පෑම යම් තැනැත්තා සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විය යුතුය.

(ඇ)අභියාචක විරෝධය පෑමකට භාජන වූ තැනැත්තකු නම්, ඒ විරෝධය පාන්නා විය යුතුය.

(4) * ඡන්ද විමසීම් නිලධරයා වෙත පෙත්සම ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු දින තුනක් ඇතුළත අභියාචක විසින් ඒ පෙත්සමෙහි පිටපතක් වගඋත්තරකරුට පෞද්ගලිකව භාර දිය යුතුය. නැතහොත් ඒ වගඋත්තරකරුගේ වාසස්ථානය ලෙස අවසානවරට දැනගෙන සිටි ස්ථානයෙහි ඒ පිටපත තබා යාමෙන් එය ඔහුට භාර දිය යුතු ය. තවද ඒ පිටපත භාරදීමෙන් පසු දින පහක් ඇතුළත ඒ භාරදීමේ වේලාව, ස්ථානය සහ අවස්ථානුගත කරුණු ප්‍රකාශවන දිවුරුම් පත්‍රයක් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ආඥාව
(1977 අංක 24 & 24)

සම්බන්ධයෙන් යථා පරිදි ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් විභාග කිරීමේදී අභියාචනාධිකරණය විසින් අභියාචකට සහ වගඋත්තරකරුට හෝ ඔවුන්ගේ නීතිඥවරයන්ට කරුණු කියා සිටීමේ අවස්ථාවක් සලසා දීමෙන් පසු, හිමිකම් පෑම හෝ විරෝධය පෑම සම්බන්ධයෙන් සහ නඩු විභාගයේ නඩු ගාස්තු ගෙවීම පිළිබඳව එය සාධාරණයැයි කල්පනා කරන ආඥාවක් කළ යුතුය. ඡන්ද හිමි නාමලේඛනයෙහි යම් නමක් ඇතුළත් කරන ලෙස හෝ කපා හරින ලෙස එම ආඥාවෙන් විධාන කළ හොත් එම නාමලේඛනය පිළියෙළ කරන ලද්දේ යම් ඡන්ද විමසීම් නිලධරයකු විසින් ද ඒ ඡන්ද විමසීම් නිලධරයා විසින් ඒ අනුව වහාම ක්‍රියා කළ යුතුය.

## ඡන්දහිමි නාමලේඛන සහතික කිරීම

ඡන්ද හිමි නාමලේඛන සහතික කිරීම
(1977 අංක 24 & 25)

22.(1) එක් එක් ඡන්ද විමසීම් ප්‍රදේශය සම්බන්ධයෙන් පිළියෙල කරනු ලැබ අවශ්‍ය අවස්ථාවල 18 වන වගන්තියේ හෝ 19 වන වගන්තියේ හෝ 21 වන වගන්තියේ විධිවිධාන අනුව සංශෝධනය කරන ලද ඡන්දහිමි නාමලේඛන ඒ ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතුය.

(2)ඡන්දහිමි නාමලේඛන සම්බන්ධයෙන් 20 වන වගන්තියෙන් යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් විභාගයට භාජනව තිබියදී ඡන්ද විමසීම් නිලධරයා විසින් ඒ නාමලේඛන මේ වගන්තිය යටතේ සහතිකකර කරනු ලැබිය හැකි අතර, යම් නමක් ඇතුළත් කරන ලෙස හෝ කපා හරින ලෙස එවැනි යම් නමක් ඇතුළත් කරන ලෙස හෝ කපා හරින ලෙස එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විධාන කළහොත් නාමලේඛනයේ ඒ නම ඇතුළත් කිරීම හෝ කපා හැරීම ඉන්පසු කළ යුතු ය.

(3)මෙහි ඉහත විධිවිධාන සලසා ඇති පරිදි ඡන්දහිමි නාමලේඛන සහතික කරනු ලැබූ විට, ඒ නාමලේඛන අදාළ වන්නේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද, ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ කාර්යාලයේ දී කාර්යාල වේලාව තුළ, එම නාමලේඛන හෝ එහි පිටපත් හෝ නොමිලයේ පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘතව තැබිය යුතු ය. පරීක්ෂා කරනු ලැබීම සඳහා නාමලේඛන එසේ විවෘතව තබා ඇති බවට,

*මෙම අභියාචනා අධිකරණ බලය අභියාචනාධිකරණයේ විනිශ්චකාරවරයන් විසින් ක්‍රියාත්මක කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 146(2)(III) වන ව්‍යවස්ථාව මගින් නියම කර ඇති නිසා (5 වන උපවගන්තිය අත්හරින ලදී).

දැන්වීමක් ඡන්ද විමසීම් නිලධරයා විසින් පළ කරනු ලැබිය යුතු අතර, නාමලේඛන සම්බන්ධයෙන් යම් අභියාචන, අභියාචනාධිකරණ ඉදිරියේ විභාගයට භාජනව ඇත්නම්, ඒ එක් එක් අභියාචනයෙහි විස්තර දැක්වෙන ප්‍රකාශයක් පෙර කී දැන්වීමට ඇතුළත් විය යුතුය.

(4) යම් ඡන්දහිමි නාමලේඛන සහතික කිරීමට පෙර, එහි කර ඇතැයි ඡන්ද විමසීම් නිලධරයකුට පෙනී යන යම් ලිපි දෝෂයක් ඒ ඡන්ද විමසීම් නිලධරයා විසින් නිවැරදි කිරීම, මේ ආඥාපනතෙහි සඳහන් කිසිවකින් තහනම් වෙතැ'යි නොසැලකිය යුතුය.

23.22 වන වගන්තිය යටතේ පිළියෙල කර සහතික කරන ලද යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක කොට්ඨාසවල ඡන්දහිමි නාමලේඛන 22 වන වගන්තියට අනුව එහි පසුව කරනු ලබන යම් වෙනස් කිරීම්වලට වගන්තියට අනුව එහි පසුව කරනු ලබන දිනයෙහි ක්‍රියාත්මක විය යුතුය.

## IV වන කොටස

### ඡන්ද විමසීම්

24 පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත් කර ගනු ලබන සෑම ඡන්ද විමසීමක්ම මෙම ආඥාපනතකින් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන් පවත්වනු ලැබිය යුතු ය.

25 පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත්කර ගැනිම සම්බන්ධයෙන් වූ සෑම මහා ඡන්ද විමසීමක් ම, තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන්ගේ ධුර කාලය ආරම්භවීමට නියමිතව ඇත්තේ යම් දිනයක ද ඒ දිනයට ඉහතින් වූ මාස හයක කාල සීමාවක් ඇතුළත පවත්වනු ලැබිය යුතුය.

### නාම යෝජනා පිළිබඳ දැන්වීම

නාමයෝජනා කාලසීමාව පිළිබඳ දැන්වීම.

26. පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත්කර ගනු ලැබීම සඳහා යම් වර්ෂයක් තුළ ඡන්ද විමසීමක් පවත්වනු ලැබීමට නියමිත කවර විටක වුව ද, එම පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීම් විමසීම් ප්‍රදේශය පිහිටියේ යම් දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධරයා විසින් එම ඡන්ද විමසීම් පැවැත්වීමට තමා අදහස් කරන බවට දැන්වීමක් පළ කළ යුතු ය. එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ එක් එක් කොට්ඨාසය තුළ තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල සියලු අපේක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍ර භාරගැනීම සඳහා පත් කරනු ලැබූ තේරීම් භාර නිලධරයා විසින් නාමයෝජනා පත්‍ර භාරගත යුතු ස්ථානය සහ කාර්යාල වේලාව තුළ දී සිය කාර්යාලයේ දී නාම යෝජනා පත්‍ර භාරගනු ලබන (මෙහි මින්මතු නාමයෝජනා කාලසීමාව යනුවෙන් සඳහන් කරනු ලබන) කාලසීමාව නිශ්චිත දැන්වීමේ සඳහන් කළ යුතු ය. එම නාමයෝජනා කාලසීමාව දැන්වීම පළ කරන ලද දිනයට පසුව එළබෙන දහහතරවන දිනයෙහි ආරම්භ විය යුතු අතර, එම දැන්වීම පළකිරීමේ දිනයෙන් පසුව එලඹෙන දහත්වන දින දහවල් දොළහට අවසන් විය යුතු ය. අනුමත කරන ලද ලකුණු, වෙන් කර දෙනු ලබන දිනය, වේලාව, ස්ථානය සහ එක් ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී හඳුනාගැනීමේ අංකයක්, දැන්වීමේ නිශ්චිතව සඳහන් විය යුතු ය.

### තේරීම් භාර නිලධරයන් පත් කිරීම

තේරීම්භාර නිලධරයන් පත් කිරීම (1977 අංක 24 & 30) (1987 අංක 24 & 7)

27 (1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ සෑම මහා ඡන්ද විමසීමක කාර්යය සඳහා ඒ ඡන්ද විමසීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, තේරීම් භාර නිලධරයකුට හෝ සහකාර තේරීම් භාර නිලධරයකුට පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන්කර දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා තේරීම් භාර නිලධරයා වශයෙන් රජයේ නිලධරයකු සහ සහකාර තේරීම් භාර නිලධරයන් වශයෙන් අවශ්‍ය පරිදි රජයේ නිලධරයන් යම් සංඛ්‍යාවක් කොමසාරිස්වරයා විසින් නම් කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද තේරීම් භාර නිලධරයකු අසනීපවීමේ හේතුවෙන් හෝ වෙනත් හේතුවක් නිසා, මේ ආඥාපනතෙන් හෝ ඒ යටතේ ඔහුට පවරා දෙන ලද නියම කරන ලද හෝ වෙන්කර දෙන ලද බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට නොහැකිවන අවස්ථාවක ඒ තේරීම් භාර නිලධරයා විසින් ඒ බලතල කාර්ය සහ කර්තව්‍ය වෙනත් රජයේ නිලධරයකුට පවර දෙනු ලැබිය හැකිය. එවැනි සෑම පවරාදීමක් ම හැකි ඉක්මනින් කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර , ඒ බලතල කාර්ය සහ කර්තව්‍ය පවරා දෙනු ලැබුවේ යම් රජයේ නිලධරයකුට ද, ඒ රජයේ නිලධරයා විසින් එවකටත් කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොමැතිව, කොමසාරිස්වරයා විසින් ඒ පැවරීම සථිර කළ හැකිය, නැතහොත් ඊට අවසර දෙනු නොලැබිය හැකිය.

(3) මේ වගන්තියෙන් තේරීම් භාර නිලධරයකුට පවරන ලද නියම කරන ලද හෝ වෙන් කරන ලද බලතල , කාර්ය සහ කර්තව්‍ය 4 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තේරීම් භාර නිලධරයකු විසින් තම දිස්ත්‍රික්කය ඇතුළත වූ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක දී ක්රියාත්මක කළ හැකිය නැතහොත් ඉටු කළ හැකිය.

**පිළිගත් දේශපාලන පක්ෂ**

(1977 අංක 24 & 31) පිළිගත් දේශපාලන පක්ෂ

27අ. (1) පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලබන සෑම දේශපාලන පක්ෂයක්ම එම දේශපාලන පන්ෂය එම ආඥාව යටතේ එසේ සලකනු ලබන තාක්කල් පළාත් පාලන ඡන්ද විමසීම් කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(1977 අංක 24 & 32)

(2)(1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාර දේශපාලන පක්ෂයක් පළාත් පාලන ඡන්ද විමසීම් කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලබන අවස්ථාවක පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව යටතේ එම පක්ෂයේ අපේක්ෂකයන්ට වෙන් කරන ලද අනුමත කරන ලද ලකුණු (1) වන උපවගන්තිය යටතේ එසේ හිමිකම් ලැබීම අවසාන වන දිනය තෙක් එම පක්ෂයට වෙන් කරන ලද අනුමත ලකුණ ලෙස සලකනු ලැබිය යුතුය.

27ඉ.* (1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් තුළ පැවැත්වීමට නියමිත යම් ඡන්ද විමසීමක දී පළාත් පාලන ඡන්ද විමසීම් කාර්ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක විරුද්ධවාදී කණ්ඩායම් වශයෙන් හිමිකම් පාන්නාවූ විරුද්ධවාදී කණ්ඩායම් ඇති වී තිබීමේ හේතුව නිසා දුෂ්කරතා පැන නගිනු ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු කොමසාරිස්වරයාට ඇති අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් එම දුෂ්කරතා ඉවත් කිරීම පිණිස, ඒ ඡන්ද විමසීමේ දී එම කණ්ඩායම අතුරෙන් යම් කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය වන බවට හෝ එම කණ්ඩායම් අතුරෙන් කිසිම කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය නොවන බවට තම පරම අභිමතය පරිදි එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත විධානයක් නිකුත් කරනු ලැබිය හැකිය. එම ඡන්ද විමසීමේ දී ඒ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තේරීම් භාර නිලධරයාගේ හෝ වෙන යම් නිලධරයකුගේ කාර්යය විය යුතුය.

(2) (අ) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීම නිසා කොමසාරිස්වරයාට විරුද්ධව හෝ ;

(ආ) ඒ විධානය අනුව යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම හෝ නොකර හැරීම නිසා තේරීම්භාර නිලධාරියකුට හෝ වෙන යම් නිලධරයකුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නොපැවරිය යුතුය.

(3) තේරීම් භාර නිලධරයකු වෙත (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධානයක් අවසාන හා තීරණාත්මක විය යුතු අතර යම් අධිකරණයකදී එය රිට් ආඥාවක් මගින් හෝ අන් ලෙසකින් ප්‍රශ්න නොකළ යුතුය.

(4) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරනු ලබන යම් විධානයක්, මේ ආඥාපනතේ වෙන යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, බලපැවැත්විය යුතුය.

සම්පූර්ණ කාන්තා සභිකයන් ගණන

27ඊ. (1) මෙම ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුවද එක් එක් පළාත් පාලන ආයතනයේ සම්පූර්ණ සභිකයන්ගෙන් සියයට විසිපහකට නොඅඩු වූ ප්‍රමාණයක් කාන්තා සභිකයන් විය යුතු ය.

එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක සම්පූර්ණ සභිකයන් ගණනින් සියයට විසිපහක් සංයුක්ත වන ප්‍රමාණය පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, මේ වගන්තියේ කාර්යය සඳහා පූර්ණ සංඛ්‍යාව එම සියයට විසිපහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) මැතිවරණ කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් නම් කිරීමට නියමිත කාන්තා අපේක්ෂිකාවන් ප්‍රමාණය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

*27 ආ වන සහ 27 ඇ වන වගන්ති ඉවත් කරන ලදී. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතේ 33 වන වගන්තිය බලන්න.

(1977 අංක 24 & 35)

## නාම යෝජනා පත්‍ර

28 (1) "මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත්කරගනු ලැබීම සඳහා සුදුසුකම් ලැබූ යම් තැනැත්තකු යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සඳහා අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එකී තැනැත්තා පළාත් පාලන ආයතනයක යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එකකට වැඩි කොට්ඨාස සංඛ්‍යාවක් සම්බන්ධයෙන් තෝරාපත්කර ගනු ලැබීම සඳහා අපේක්ෂකයකු ලෙස නාම යෝජනා නොකරනු ලැබිය යුතු ය."

(2) "යම් පළාත් පාලන ආයතනයක සියලු කොට්ඨාස සම්බන්ධයෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතු ය. එම නාමයෝජනා පත්‍රවල, පළමු නාමයෝජනා පත්‍රයේ සඳහන් තෝරා පත් කර ගත යුතු සම්පූර්ණ සභික සංඛ්‍යාවෙන් සියයට දහයකට නොඅඩු සංඛ්‍යාවක් සහ දෙවන නාමයෝජනා පත්‍රයේ සඳහන්, තෝරා යැවිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන්ගෙන් සමන්විත විය යුතු අතර, යම් පළාත් පාලන ආයතනයක සභිකයන් ලෙස තෝරා පත් කරගනු ලැබීමේ කාර්යය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින්"

“(අ) එම අපේක්ෂකයන්ගේ නම් සඳහන් කළ යුතු අතර පළාත් පාලන ආයතනයේ එක් එක් කොට්ඨාසය සම්බන්ධයෙන් නම් කරනු ලබන අපේක්ෂකයන් ගණන එම පළාත් පාලන ආයතනයේ සම්පූර්ණ සාමාජිකයන් ගණනින් සියයට හැටකට සමාන විය යුතු ය.

එසේ වුව ද, මෙම ඡේදයේ සඳහන් එම සියයට හැටක් සංයුක්ත වන ගණන පූර්ණ සංඛ්‍යාවක් හා භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම පූර්ණ සංඛ්‍යාව මෙම ඡේදයේ කාර්යය සඳහා සියයට හැට සංයුක්ත වන සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතුය.

(ආ) “තෝරායැවිය යුතු සභිකයන්ගේ නම් සඳහන් කළ යුතු අතර, එම ප්‍රමාණය පළාත් පාලන ආයතනයේ මුළු සභික සංඛ්‍යාවෙන් සියයට හතලිහකට සමාන වූ සහ තවත් අමතර තැනැත්තන් තුන්දෙනෙකුගේ එකතුවට සමාන විය යුතු ය.”

එසේ වුව ද, (ආ) ඡේදයේ සඳහන් කර ඇති සියයට හතලිහක් ප්‍රතිශතය සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් හා පූර්ණ සංඛ්‍යාවක භාගයක් වන අවස්ථාවක දී, එම ඡේදයේ කාර්යය සඳහා පූර්ණ සංඛ්‍යාව සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.

(2අ) කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, (2) වන උපවගන්තියේ නිශ්චිත සඳහන් පරිදි එක් එක් පළාත් පාලන බල ප්‍රදේශය සම්බන්ධයෙන් පළමු නාමයෝජනා පත්‍රයේ හා අතිරේක නාමයෝජනා පත්‍රයේ හා අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් කළ යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව නිශ්චිතව දැක්විය යුතු ය. නම් කිරීමට නියමිත කාන්තා අපේක්ෂිකාවන්ගේ සම්පූර්ණ ගණන පළමු නාමයෝජනා පත්‍රයේ තෝරා ගැනීමට නියමිත සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට දහයකට වඩා අඩු නොවිය යුතු මෙන්ම අතිරේක නාම යෝජනාපත්‍රයේ සඳහන් තෝරා යැවිය යුතු අපේක්ෂකයන් ගණනකින් සියයට පනහකට වඩා අඩු නොවිය යුතු අතර, එම ප්‍රමාණය පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන විට මෙම පනතේ කාර්යය සඳහා නියමිත ගණන වශයෙන් පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.

(2ආ) තේරීම් භාර නිලධරයා විසින්, ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් තමන් වෙත භාරදෙනු ලැබූ එක් එක් නාමයෝජනා පත්‍රයෙහි පිටපතක් පිළියෙල කොට නාමයෝජනා පත්‍රයේ එකී පිටපත් තම නාම පුවරුව මත ප්‍රදර්ශනය කළ යුතු ය.

(2ඇ),(1) වන උපවගන්තිය යටතේ සඳහන් නාම යෝජනාපත්‍රයේ,

(අ) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට, එකී පක්ෂයේ ලේකම් හෝ එම පක්ෂයේ බලයලත් නියෝජිතයා හෝ පක්ෂයේ ලේකම් විසින් නම් කරන ලද නාමයෝජනා පත්‍රයේ නම සඳහන් අපේක්ෂකයකු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ; සහ

(ආ) ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, එකී කණ්ඩායමේ නායකයා විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ වුවද කණ්ඩායම් නායකයා විසින් මෙම ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ වලංගු මුදලක් තේරීම්භාර නිලධරයා වෙත තැන්පත් කරනු ලබන අවස්ථාවේ දී අපේක්ෂකයන් අතුරින් යම් තැනැත්තකු එම බලයලත් නියෝජිතයා ලෙස නම් කරනු ලැබිය යුතුය.

(2ඇ) මේ ආඥාපනතේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයේ සඳහන් මුළු අපේක්ෂක සහ අමතර තැනැත්තන් සංඛ්‍යාවෙන් සියයට තිහකට අඩු නොවන සංඛ්‍යාවක් තරුණයන්ගෙන් සමන්විත විය හැකිය.

(2ඉ) මේ වගන්තියේ (2ඇ) වන උපවගන්තියේ සඳහන් සියයට තිහ සංයුක්ත වන සංඛ්‍යාවක භාගයක් වන විටෙක, එකී උපවගන්තිවල කාර්යය සඳහා "සියයට තිහ" සංයුක්ත කරනු ලබන සංඛ්‍යාව , එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය. (1983 අංක 48 & 3)

(4)* පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ නාමයෝජනා කරනු ලැබූ එක් එක් අපේක්ෂකයාගේ සහ එක් එක් තැනැත්තාගේ ලිඛිත නාමයෝජනා පත්‍රයේ පිටසන් කරනු ලැබිය යුතු අතර එවැනි සෑම අපේක්ෂකයකු විසින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද දිවුරුම් හෝ ප්‍රතිඥාව නාමයෝජනා පත්‍රයට අමුණනු ලැබිය යුතු ය.

"(4අ) නාමයෝජනා පත්‍රයේ නම දැක්වෙන සෑම තරුණයෙක් ම උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් හෝ තම උපන් දිනය සහතික කරමින් ඒ තරුණයා විසින් අත්සන් කරන ලද දිවුරුම් පත්‍රයක් ඒ නාමයෝජනා පත්‍රයට අමුණා තිබිය යුතුය."

"(4ආ) එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් හා නාමයෝජනා පත්‍රයක නම් දක්වා ඇති එක් එක් තැනැත්තන් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ එකී පනතින් නියම කරනු ලැබූ ආකෘතියට අනුකූල වූ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් එකී නාමයෝජනා පත්‍රය භාරදීමෙන් පසු මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(5) එක් එක් නාමයෝජනා පත්‍රය, පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා විසින් අත්සන් කල යුතු අතර, ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විටෙක,(මෙහි මින්මතු "කණ්ඩායම් නායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි නම දැක්වෙන සහ එලෙස එහි නාමෝද්දිෂ්ට අපේක්ෂකයා විසින් අත්සන් කළ යුතුය. තවද, එය සමාදාන විනිශ්වයකාරවරයකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් හෝ සහතික කළ යුතුය.

තවද පිළිගත් දේශපාලන පක්ශයක් සම්බන්ධයෙන් වන විට ඒ පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිතයා විසින් ද ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට කණ්ඩායම් නායකයා විසින් ද ඒ නාම යෝජනා පත්‍රය නාම යෝජනා කිරීමේ කාල සීමාව තුලදී, තේරීම් භාර නිලධරයා වෙත භාර දිය යුතුය.

(6) 26 වන වගන්තිය යටතේ දැන්වීම පළ කිරීමෙන් පසු සහ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා නාම යෝජනා කාලසීමාව ඉකුත්වීමට පෙර යම් දිනයක කරන ලද ඉල්ලීමක් මත, එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා විසින් යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ යම් ස්වාධීන කණ්ඩායමකට නියමිත ආකෘතියෙහි නාම යෝජනා පත්‍රයක් ගාස්තුවක් අය නොකොට සැපයිය යුතුය. එහෙත් තේරීම් භාර නිලධරයා විසින් නොසපයන ලද යම් නාම යෝජනා පත්‍ර ආකෘතියක් ,

ඒ ආකෘතිය පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වෙනස් නොවන තාක් දුරට භාවිත කිරීම මෙම ආඥාපනතේ සඳහන් කිසිවක් වළක්වනු ලබන ලෙස නොසැලකිය යුතුය.

(8) (අ) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයක යම් අත් හැරීමක් හෝ ලිපි දෝශයක් ඇතැයි ඒ පක්ෂයේ ලේකම්ට හෝ කණ්ඩායමේ නායකයාට හෝ පෙනී යන අවස්ථාවක ඔහු විසින්, නාම යෝජනා කාල සීමාව අවසන් වීමට පෙර, තේරීම් භාර නිලධරයා වෙත ඉල්ලීමක් කළ හැකිය.

(ආ) ඒ අත්හැරීම හෝ දෝෂය අනවධානය නිසා සිදුවී ඇතැයි තේරීම් භාර නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක , එම අත්හැරීම හෝ දෝෂය තමා ඉදිරිපිට දී නිවැරදි කිරීමට එම ලේකම්ට හෝ බලයලත් නියෝජිතයාට හෝ කණ්ඩායමේ නායකයාට හෝ ඒ තේරීම්භාර නිලධරයා විසින් ඉඩ දිය හැකිය.

*(3) වන උපවගන්තිය ඉවත් කරන ලදී. 1987 අංක 24 දරන පනතේ 8 වන වගන්තිය බලන්න.

29 "(1) (අ) යම් ඡන්ද විමසීමක දී සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් සහ ස්වාධීන කණ්ඩායමක් විසින් ම, 26 වන වගන්තිය යටතේ දැන්වීම පළ කරන ලද දිනය සහ නාමයෝජනා පත්‍රය භාරදෙනු ලබන දිනය අතර කාලය තුළ (සහ කුමන හේතුවක් නිසා වුව ද, නාමයෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යාහ්න දොළහ පසු නොවී) නාමයෝජනා පත්‍රය ඉදිරිපත් කළ යුතු තේරීම් භාර නිලධරයා වෙත -

(i) පිළිගත් දේශපාලන පක්ෂයක් මගින් නාමයෝජනා කරනු ලැබූ එක් එක් අපේක්ෂකයා සහ අමතර තැනැත්තන් සම්බන්ධයෙන් එක් අයකුට රුපියල් එක්දහස් පන්සියයක මුදලක් සහ,

(ii) ස්වාධීන කණ්ඩායමක් මගින් නාමයෝජනා කරනු ලැබූ එක් එක් අපේක්ෂකයා සහ අමතර තැනැත්තන් සම්බන්ධයෙන් එක් අයෙකුට රුපියල් පන්දහසක මුදලක් තැන්පත් කළ යුතු ය.

(ආ) වලංගු මුදලින් විය යුතු තැන්පතුව -

(i) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සහ,

(ii) ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, එකී ස්වාධීන කණ්ඩායමේ නායකයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, මෙම වගන්තියේ (1) වන උපවගන්ති යටතේ අපේක්ෂකයකු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු තැන්පතුවක් තේරීම්භාර නිලධරයා විසින් භාර නොගත යුතුය.

(3) මේ වගන්තිය යටතේ තැන්පත් මුදල තේරීම් භාර නිලධරයා විසින් භාරගන්නා ලද අවස්ථාවක නිලධරයා විසින් එම තැන්පත් මුදල තමා විසින් භාර ගන්නා ලද බවට එම නිලධරයා විසින් අත්සන් කරන ලද , ලියවිල්ලකින් වූ කුවිතාන්සියක් එම තැන්පත් මුදල තැබූ තැනැත්තා වෙත වහාම නිකුත් කළ යුතු අතර එම කුවිතාන්සියේ,

(අ) තැන්පත් මුදල තබන ලද්දේ යම් කණ්ඩායමක නායකයකු විසින් නම් ඔහුගේ නම් ද නැතහොත් ඔහු වෙනුවෙන් බලයලත් තැනැත්තකු විසින් නම් ඔවුන් දෙදෙනාගේ ම නම් ;

(ආ) අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව ;
(ඇ) තැන්පත් මුදලේ ගණන සහ ;
(ඈ) තැන්පත් මුදල තැබූ වේලාව සහ දිනය සඳහන් විය යුතුය.

(7) වන උපවගන්තිය ඉවත් කරන ලදී. 1987 අංක 24 දරන පනතේ 8 වන වගන්තිය බලන්න.

තැන්පත් කළ මුදල් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කිරීම.

30 (1) 29 වන වගන්තිය යටතේ තේරීම් භාර නිලධරයකු වෙත තැන්පත් කරනු ලැබූ සෑම මුදලක් ම ඒ නිලධරයා විසින් වහාම තැන්පත් ගිණුමකට බැර කළ යුතු අතර මීළඟට දැක්වෙන උපවගන්තිවල විධිවිධාන අනුව ඒ සෑම මුදලක්ම සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කළ යුතු ය.

(1977 අංක 24 & 38)

(2) ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා පත්‍රය 31 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක තැන්පත් මුදල, ඒ තැන්පත් මුදල තැබූ තැත්තාට ආපසු දිය යුතුය.

(1977 අංක 24 & 38)

(4) 29 වන වගන්තියේ තැන්පතුවක් තබන ලද්දේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු වෙනුවෙන් ද, එකී අපේක්ෂකයා තෝරා පත්කර ගනු නොලැබූ අවස්ථාවක සහ එම අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව ඔහු තරග කරන ලද කොට්ඨාසයේ දෙනු ලැබූ මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකක් නොඉක්මවන අවස්ථාවක ඒ අපේක්ෂකයා වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතුය.එම මුදල තැන්පත් කරනු ලැබුවේ යම් තේරීම්භාර නිලධරයකු වෙත ද, ඒ නිලධරයා විසින් ඒ මුදල තැන්පත් ගිනුමෙන් ඒකාබද්ධ අරමුදලට පැවරිය යුතු අතර, අනෙක් සෑම අවස්ථාවක ම, තැන්පත් මුදල තබනු ලැබූ අපේක්ෂකයා වෙත ඒ මුදල ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් ආපසු දිය යුතු ය.

එසේ වුව ද, එම කොට්ඨාසවල තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඡන්ද විමසීම් ප්‍රදේශයේ දෙන ලද මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකකට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීමට අපහොසත් වුවහොත්, එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා ඉදිරිපත් කරන ලද අමතර තැනැත්තන් සම්බන්ධයෙන් තැන්පත් කරන ලද ඇප මුදල රාජසන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. මෙහි ඉහත සඳහන් විධිවිධාන එම ඇප මුදල පැවරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා යම් ඡන්ද විමසීමකදී දෙන ලද ඡන්ද සංඛ්‍යාව ඇත්ත වශයෙන් ම ගණන් කරනු ලැබූ ඡන්ද සංඛ්‍යාව බව සැළකිය යුතු අතර බල රහිත බැවින් ප්‍රතික්ෂේප කරන ලද යම් ඡන්ද එයට ඇතුළත් නොවිය යුතුය.

## නාමයෝජනා කාලසීමාවෙන් පසු කාර්ය පටිපාටිය

31.(1) නාමයෝජනා කාලසීමාව ඉකුත් වූ වහාම, තේරීම භාර නිලධරයා විසින් තමාට ලැබුණු නාම යෝජනා පත්‍ර පරීක්ෂා කර බැලිය යුතු අතර -

(1අ )නාමයෝජනා කාලසීමාවේ අවසාන දිනයේ මධ්‍යාහ්න දොළහක් අපරභාග එකකුත් තිහත් අතර කාලය ඇතුලත, නාමයෝජනා පත්‍රයක් පිළිබඳ විරෝධතා, තේරීම් භාර නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැකි අතර ඒ දිනයේ අපරභාග එකකුත් තිහට පසුව එවැනි විරෝධතා කිසිවක් තේරීම්භාර නිලධරයා විසින් භාරගනු නොලැබිය යුතුය.

(ඇ) 29 වන වගන්තිය යටතේ නියම කරනු ලැබූ තැන්පත් මුදල තබනු නොලැබුවේ යම් නාම යෝජනා පත්‍රයක් සම්බන්ධයෙන් ද, එම නාමයෝජනා පත්‍රය හෝ;

*(3) වන උපවගන්තියේ ඉවත් කරන ලදී. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතේ 38 වන වගන්තිය බලන්න.

(5) වන උපවගන්තිය ඉවත් කරන ලදී. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතේ 38 වන වගන්තිය බලන්න.

(ඉ) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට , ලේකම්ගේ අත්සන හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට කණ්ඩායමේ නායකයාගේ අත්සන නාමයෝජනා පත්‍ර තබා නොමැති අවස්ථාවක හෝ 28 වන වගන්තියේ (5) වන උපවගන්තියෙන් නියම කරනු ලැබ ඇති පරිදි එම අත්සන සහතික කරනු නොලැබූ අවස්ථාවක එම නාමයෝජනා පත්‍රය හෝ ප්‍රතික්ෂේප කළ යුතුය.

(ඊ) මෙම ආඥා පනතේ 28 වන උපවගන්තියේ,
(2අ) උපවගන්තිය යටතේ නම් කිරීමට නියමිත සම්පූර්ණ කාන්තා අපේක්ෂිකාවන් ගණන අන්තර්ගත නොවන්නා වූ, නාම යෝජනා පත්‍රය.

(2) තේරීම්භාර නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ යම් නාම යෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, තේරීම් භාර නිලධරයා විසින් එම ප්‍රතික්ෂේප කිරීම, අවස්ථාවෝචිත පරිදි එම නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කළ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ කණ්ඩායමේ නායකයා වෙත දැනුම් දිය යුතු ය. එම නාම යෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තේරීම් භාර නිලධරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

“(3) අවස්ථාවෝචිත පරිදි, යම් පිළිගත් දේශපාලන පක්ෂයක් මගින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයක නම සඳහන් යම් අපේක්ෂකයකු හෝ තැනැත්තකු -

(අ) එම අපේක්ෂකයා හෝ තැනැත්තා තරුණයකු වන අවස්ථාවක, තම උප්පැන්න සහතිකයේ සහතික කල පිටපතක් හෝ උප්පැන්න සහතිකය ලබා ගැනීමට නොහැකි විට එකී තරුණයා විසින් තම උපන් දිනය සහතික කරමින් අත්සන් කළ දිවුරුම් ප්‍රකාශයක් හෝ එකී නාමයෝජනා පත්‍රයට ඇමිණීම පැහැර හැර තිබීම හෝ ;

(ආ) එකී නාමයෝජනා පත්‍රයේ ඇතුළත් කිරීමට නියම කරනු ලැබූ තම කැමැත්ත එකී නාමයෝජනා පත්‍රය මත සටහන් කිරීමට හෝ ආඥාඛුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කරන ලද දිවුරුම හෝ ප්‍රකාශය එකී නාමයෝජනා පත්‍රයට ඇමිණීම පැහැර හැර තිබීම ;

හේතුවෙන් නුසුදුස්සකු වන බව සොයාගත් අවස්ථාවක, එසේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප නොකළ යුතු නමුත් මේ උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ යම් හේතුවක් නිසාවෙන් නුසුදුස්සකු වන බවට සොයා ගනු ලැබූ එකී අපේක්ෂකයාගේ හෝ තැනැත්තාගේ නම එසේ භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයෙන් ඉවත් කළ යුතු ය. යම් අපේක්ෂකයකුගේ නම නාමයෝජනා පත්‍රයෙන් ඉවත් කළ විටක එකී නාමයෝජනා පත්‍රය භාරදෙනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් , එසේ ඉවත්කරනු ලැබූ නම වෙනුවට වෙනත් නමක් ආදේශ කිරීමට ඉන්පසු හිමිකම නොලබන අතර නම ඉවත් කරනු ලැබූ අපේක්ෂකයා හෝ තැනැත්තා සම්බන්ධයෙන් තැන්පත් කළ මුදල, රාජසන්තක විය යුතු වන්නේ ය.

*32 33 සහ 34 වන වගන්ති ඉවත් කරන ලදී. රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතේ 41 වන වගන්තිය බලන්න.

කිසිම නාමයෝජනා පත්‍රයක් නොලැබුණු අවස්ථාවක කාර්ය පටිපාටිය (1977 අංක 24 & 42)

*35 (1) (අ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් වන විට, නාම යෝජනා පත්‍ර භාරගැනීමේ කාලසීමාව ඉකුත්වීමෙන් පසු -

(i) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ වෙනුවෙන් නාම යෝජනා පත්‍රයක් විධිමත් ලෙස ලැබී නොමැති බවට හෝ ;

(ii) අවස්ථාවෝචිත පරිදි, තමන්ට ලැබුනු නාමයෝජනා පත්‍ර සියල්ල ම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බව හෝ එකී නාම යෝජනාපත්‍රවල සඳහන් සියලු ම අපේක්ෂකයන්ගේ නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර එකී නාමයෝජනා පත්‍රයෙන් ඉවත් කොට ඇති බවට,

තේරීම්භාර නිලධරයාට පෙනී යන අවස්ථාවක, එකී තේරීම්භාර නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි තමන්ට නාම යෝජනා පත්‍ර කිසිවක් නොලැබුනු බව හෝ තමන්ට ලැබුනු නාමයෝජනා පත්‍ර සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබූ බව හෝ එකී නාමයෝජනා පත්‍රවල සඳහන් සියලු ම අපේක්ෂකයන්ගේ නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ එකී නාමයෝජනා පත්‍රවලින් ඉවත් කරනු ලැබූ බව හෝ අදාළ ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම්භාර නිලධරයට තේරීම්භාර නිලධරයා විසින් වහා ම වාර්තා කළ යුතු ය.

(ආ) ඡන්ද විමසීම් භාර නිලධරයා විසින් එකී වාර්තාව ලැබීමෙන් පසු දින හතකට වැඩි නොවන කාලයක් තුළ නාමයෝජනා පත්‍ර භාරගැනීමේ වැඩිදුර කාලසීමාවන් නියම කරමින් දැන්වීමක් පළ කළ යුතු ය. එකී දැන්වීම මගින් (මෙහි මින්මතු “ දෙවන, නාමයෝජනා පත්‍ර භාරගැනීමේ කාලසීමාව” යනුවෙන් හඳුන්වනු ලබන) තේරීම්භාර නිලධරයා විසින් තම කාර්යාලයේදී නාමයෝජනා පත්‍ර භාරගන්නා කාලසීමාව නිශ්චිතව සඳහන් කළ යුතු අතර, මේ ආඥාපනතේ සියලු විධිවිධාන ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා නියම කරන ලද දෙවන නාම යෝජනා කාලසීමාව තුල කිසිම නාමයෝජනා පත්‍රයක් නොලැබුණහොත් හෝ ලැබුණු සියලුම නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, තේරීම් භාර නිලධරයා විසින් ඒ බව ඡන්ද විමසීම් නිලධරයාගේ මාර්ගයෙන් වහාම කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර එම වාර්තාව ලැබුණු විට කොමසාරිස්වරයා විසින් දෙවන නාම යෝජනා කාලසීමාව තුළ එම ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා කිසිම අපේක්ෂකයකුගේ නමක් විධිමත් ලෙස යෝජනා කරනු නොලැබූ,

බවට දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ඊට ප්‍රසිද්ධියක් ලබාදීම සඳහා වඩාත්ම සුදුසු යයි තමාට පෙනී යන වෙනත් ආකාරයකින් පළ කිරීමට සැලැස්විය යුතුය.

(3) ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් (2) වන උප වගන්තිය යටතේ දැන්වීමක් පළ කරන ලද දින සිට එම පළාත් පාලන ආයතනයේ සභිකයන්ගේ ඊලඟ ඡන්ද විමසීම් පවත්වනු ලබනතුරු, ඒ පළාත් පාලන ආයතනය සඳහා නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා සහ සභිකයන් තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මෙම ආඥාපනත යටතේ වැඩිදුර කිසිම පියවරක් නො ගත යුතුය.

එසේ වුවද එම පළාත්පාලන ආයතනයේ නගරාධිපතිවරයා සහ නියොජ්‍ය නගරාධිපතිවරයා සහ සභිකයන් ලෙස තෝරා පත් කර ගනු ලැබීම සඳහා මෙම ආඥාපනත යටතේ සුදුසුකම් තිබෙන තැනැත්තන් සංඛ්‍යාවගේ නම් අමාත්‍යවරයා විසින් 28 වැනි වගන්තියේ (1අ) උපවගන්තියේ අන්තර්ගත විධිවිධාන සැකිල්ලට ගනිමින් යෝජනා කරනු ලැබීම නිත්‍යානුකූල වන අතර එසේ නම් යෝජනා කරන ලැබූ තැනැත්තන් සියලුම කාර්ය සඳහා මේ අඥාපනතේ විධිවිධාන යටතේ තෝරා පත්කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

**තරඟ නොකරන ලද ඡන්ද විමසීම්**

36(1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් -

(අ) එක් නාම යෝජනා පත්‍රයකට වැඩි ගණනක් ඉදිරිපත් කරනු නොලැබූ හෝ,

(ආ) නාම යෝජනා පත්‍රය හෝ පත්‍ර ප්‍රතික්ෂේප වීමෙන් පසු හෝ නාම යෝජනා පත්‍රය හෝ පත්‍රවල සඳහන් කොට ඇති නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ එහි සඳහන් යම් හේතු නිසා ඉවත් කිරීමෙන් පසු, යම් එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයන් පමණක් තෝරාපත්කරගනු ලැබීමට ඉදිරිපත්ව සිටින අවස්ථාවක, තේරීම්භාර නිලධරයා විසින් ඒ කරුණු කොමසාරිස්වරයාට දැනුම්දිය යුතුය. කොමසාරිස්වරයා විසින් ඉන්පසුව, 28 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයන් අතුරෙන්, කවර අපේක්ෂකයන් නගරාධිපති සහ උපනගරාධිපති වශයෙන් තේරී පත්ව ඇති බවට ප්‍රකාශ කළ යුතු ද යන්න නිශ්චිතව දක්වන ලෙස, අවස්ථාවෝචිත පරිදි, එකී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට ඇරයුම් කළ යුතුය. අවස්ථාවෝචිත පරිදි, එකී ලේකම්වරයා හෝ කණ්ඩායමේ නායකයා හෝ විසින් තම තීරණය කොමසාරිස්වරයා විසින් එසේ නිශ්චය කරනු ලැබූ අපේක්ෂකයන් එකී පළාත් පාලන ආයතනයේ පිළිවෙලින් නගරාධිපතිවරයා සහ උපනගරාධිපත්වරයා වශයෙන් තේරී පත්ව ඇති බව ප්‍රකාශයට පත්කළ යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද විමසීම පිළිබඳ ප්‍රතිඵල ඡන්ද විමසීම් ප්‍රදේශයේ පිහිටි දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයාගේ මාර්ගයෙන් කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර එම වාර්තාව ලැබුණු විට, කොමසාරිස්වරයා විසින් වහාම ඡන්ද ප්‍රතිඵල පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ඊට ප්‍රසිද්ධිය ලබාදීම සඳහා වඩාත්ම සුදුසු යයි තමාට පෙනී යන වෙනත් ආකාරයකින් පළ කිරීමට සැලැස්විය යුතුය.

## තරඟ කරනු ලබන ඡන්ද විමසීම්

37.(1) ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාසය සඳහා නියම කරන ලද නාමයෝජනා කාලසීමාව ඉකුත් වූ විට සහ යම් නාම යෝජනා පත්‍රයක් හෝ පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසු හෝ නාම යෝජනා පත්‍රයක හෝ පත්‍රවල සඳහන් නම් 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කොට ඇති හේතු මත ඉවත් කළ විටෙක, එකකට වඩා වැඩි පිළිගත් දේශපාලන පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් ඡන්ද විමසීම සඳහා විධිමත් ලෙස නාමයෝජනා ලැබ සිටින්නේ නම් තේරීම්භාර නිලධරයා විසින් වහාම -

තරඟ කරනු ලබන ඡන්ද විමසීම්

(අ) පිළිගත් දේශපාලන පක්ෂයක එක් එක් අපේක්ෂකයකු වෙත එම පක්ෂයේ අනුමත කරන ලද ලකුණ වෙන් කළ යුතු ය, තව ද;

(1977 අංක 24 & 44)

(ආ)ස්වාධීන කණ්ඩායමක එක් එක් අපේක්ෂකයා සම්බන්ධයෙන් යම් අනුමත කරන ලද ලකුණක් සහ එකී ඡන්ද විමසීම තරග කිරීම සඳහා එකකට වඩා වැඩි ස්වාධීන කණ්ඩායම් සිටින විට -

(i) පළමු මෙන්ම එසේ තරග කරන ස්වාධීන කණ්ඩායම්වල එකඟත්වයෙන් ; හෝ

(ii) එවැනි එකඟතාවයක් නොවූ විටක, තම අභිමතය අනුව, තේරීම්භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් කුසපත් ඇදීමෙන්, තීරණය කරනු ලබන යම් අනුමත කරන ලද ලකුණක් වෙන් කළ යුතු අතර,

එම ලකුණ අදාළ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නමට ඉදිරිපසින් ඡන්ද පත්‍රිකාවේ මුද්‍රණය කළ යුතු ය.

(අ) එම ඡන්ද විමසීමේ කාර්යය සඳහා, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයකට එම පක්ෂයේ අනුමත කර ලද ලකුණ වෙන් කළ යුතුය තවද,

(ආ) එක් එක් ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් යම් අනුමත කරන ලද ලකුණක් වෙන් කළ යුතු අතර එක් ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක් ඉදිරිපත් වී සිටින අවස්ථාවක -

(i) පළමු අවස්ථාවේදී කණ්ඩායම් නායකයන් අතර එකඟත්වයෙන් ; හෝ
(ii) එවැනි එකඟත්වයක් නොවූ විටෙක, තම පරම අභිමතය අනුව තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් කුසපත් ඇදීමෙන්,

තීරණය කරනු ලබන යම් අනුමත කරන ලද ලකුණක් සහ හඳුන්වන අංකයන් වෙන් කළ යුතු අතර එම ලකුණ ඡන්ද පත්‍රිකාවේ -

(i) එම පක්ෂයේ නමට ඉදිරිපසින් සහ ;
(ii) ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විටෙක “ස්වාධීන කණ්ඩායම” යන වචනවලට සහ එම කණ්ඩායමට වෙන් කරන දෙන ලද හඳුනාගැනීමේ අංකයට ඉදිරිපසින් මුද්‍රණය කරනු ලැබිය යුතුය.

මෙම ආඥාපනතේ "අනුමත කරන ලද ලකුණ" යන්නෙන් මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයකින් කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ලකුණක් අදහස්වේ.

(2) පළාත් පාලන ඡන්ද විමසීම් කාර්යය සඳහා යම් පිළිගත් දේශපාලන පක්ෂයක අනුමත කරන ලද ලකුණ, ඒ පක්ෂය යම් ඡන්ද විමසීමක දී තරඟ කළත් නොකළත් යම් ස්වාධීන කණ්ඩායමකට (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වෙන් නොකළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලකුණු වෙන් කර දීමෙන් පසු තේරීම් භාර නිලධරයා විසින් වහාම -

(අ) මෙහි මින් මතු දැක්වෙන විධිවිධාන අනුව ඡන්ද විමසීමක් පවත්වනු ලැබීමට හැකි වනු පිණිස ඒ ඡන්ද විමසීම අඩාළව කල් තැබිය යුතුය.

(ආ) ඡන්ද විමසීම තරඟ කරන බව ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක් තුළද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා වෙත වාර්තා කළ යුතුය. තවද ;

(ඇ)පිළිගත් දේශපාලන පක්ෂ වල හා ස්වාධීන කණ්ඩායම්වල නාමයෝජනා පත්‍රවල පිටපත් ද එක් එක් පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කරන දෙන ලද ලකුණු සහ ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනක් ඇති අවස්ථාවක එක් එක් කණ්ඩායමකට වෙන් කරන ලද හැඳින්වීමේ අංක දැක්වෙන ප්‍රකාශයක් ද ඒ ඡන්ද විමසීම් නිලධරයා වෙත යැවිය යුතුය.

38. ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් 37 වන වගන්තිය යටතේ වාර්තාවක් ලැබුණු විට, ඒ ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක් ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා විසින් පහත දැක්වෙන විස්තර සඳහන් දැන්වීමක් ගැසට් පත්‍රයේ වහාම පළ කළ යුතුය -

(ආ) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන්ගේ නම් , ඔවුන් එයින් දක්වා ඇති පරිදි එහෙත් සිංහල අකාරාදී පිළිවෙළ අනුව "ඇතුළත් නාම යෝජනා පත්‍රයක්" ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දෙනු ලැබූ අනුක්‍රමික අංකය, ඒ ඒ පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කර දෙන ලද අනුමත ලකුණද, ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වූ විට, "ස්වාධීන කණ්ඩායම" යන වචන සහ යම් හඳුනා ගැනීමේ අංකයක් වෙතොත් ඒ අංකය :

(ඇ) ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය, එම දිනය පුර පසළොස්වක පෝය දිනයක් හෝ 1971 අංක 29 දරන නිවාඩු පනතේ පළමු උපලේඛනයේ සඳහන් රජයේ නිවාඩු දිනයක් නොවිය යුතු අතර, එය හැකිතාක් දුරට සෙනසුරාදා දිනයක් හෝ තේරීම් භාර නිලධරයා විසින්, කොමසාරිස්වරයාගේ එකඟත්වයෙන් තීරණය කරනු ලබන දිනයක් හෝ දිනයන් විය යුතු අතර, එම දිනය, දැන්වීම් පළ කරනු ලැබූ දින සිට සති පහකට නොඅඩු සහ සති හතකට නොවැඩි දිනයක් විය යුතුය.

(ඇ) ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයෙහි එක් එක් ඡන්ද කොට්ඨාශ සඳහා වූ ඡන්ද පොළෙහි හෝ ඡන්ද පොළවල් පිහිටීම සහ ඡන්දදායිකාවන් සඳහා වෙන් කර ඇති විශේෂ ඡන්ද පොළවල් කිසිවක් වෙතොත් ඒ ඡන්ද පොළවල්වල පිහිටීම.

(2) යම් හදිසි අවස්ථාවක් හේතුකොට ගෙන යම් ඡන්ද පොළක පිහිටීම (1) වැනි උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමක සඳහන් පිහිටි ස්ථානයෙන් වෙනස් කළ යුතුවීම අවශ්‍ය වන අවස්ථාවක ස්වකීය පරම අභිමතය පරිදි තමා විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් එම ඡන්ද පොළෙහි පිහිටීම වෙනස් කරනු ලැබීමට ඡන්ද විමසීම් නිලධරයා විසින් සැලැස්විය හැකි ය.

(3) යම් හදිසි අවස්ථාවක් හෝ අනපේක්ෂිත අවස්ථානුගත කරුණක් හෝ හේතුකොටගෙන යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ඡන්ද විමසීම, ඒ ඡන්ද විමසීමට අදාළව (1) වැනි උපවගන්තිය යටතේ පළ කරනු ලබන දැන්වීමෙහි සඳහන් දිනයෙහි පැවැත්විය නොහැකි බව, කොමසාරිස්වරයාගේ උපදෙස් විමසීමෙන් පසු ඡන්ද විමසීම් නිලධරයාගේ මතය වන අවස්ථාවක ඒ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා වෙනත් දිනයක් ඡන්ද විමසීම් යටතේ වූ දැන්වීම් පළ කරනු ලැබීමෙන් පසුව එළැඹෙන විසි එක්වන දිනයට කලින් දිනයක් නොවිය යුතුය.

"නාමයෝජනා කිරීමෙන් පසු අපේක්ෂකයකු මිය යාම."

39. (1) ඡන්ද විමසීමේ කාර්යය සඳහා ඡන්ද විමසීම කල් තබනු ලැබීම හා ඡන්දය දීම ආරම්භ කිරීම අතර කාලය තුළ යම් පළාත් පාලන ආයතනයක් වෙනුවෙන් තෝරා පත් කර ගැනීම සඳහා වූ අපේක්ෂකයකුගේ මරණය සිදුවීම නොතකා, ඡන්ද විමසීම සඳහා 38 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති දිනයේ දී ඒ ඡන්ද විමසීම පැවැත්විය යුතුය.

(2) අපේක්ෂකයකුගේ මරණය සිදුවීමේ හේතුවෙන් යම් පුරප්පාඩුවක් ඇතිවීමේ දී එකී මියගිය අපේක්ෂකයා අයත් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා එකී පුරප්පාඩුව පිරවීම සඳහා මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ සභිකයකු ලෙස තෝරා පත්කරනු ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තකු නම් කළ යුතු ය.

නම අංකය ඡන්ද පොළ, ඡන්දය විමසීමේ වේලාව ආදිය ඡන්ද දායකයාට දැන්වීම (1963 අංක 9 & 9) (1977 අංක 24 & 47)

39 (1) ඡන්ද විමසීමක් සඳහා තරඟ කරනු ලබන්නේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ද ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා වූ තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය මේ උපවගන්තිය අදාළ වන ප්‍රදේශයක් නම්, ඒ ප්‍රදේශයේ ඡන්ද විමසීම් ප්‍රදේශය මේ උපවගන්තිය අදාළ වන ප්‍රදේශයක් නම් එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ යම් කොට්ඨාසයක ඡන්දහිමි නාමලේඛනයේ සඳහන් එක් ඡන්දදායකයා වෙත -

(අ) පළාත් පාලන ආයතනයේ නම,

(ආ)ඡන්දය හිමි නාමලේඛනයෙහි සඳහන් කර ඇති පරිදි ඡන්දදායකයාගේ නම ලිපිනය හා අංකය,

(ඇ) කොට්ඨාසයේ නම සහ අංකය ;

(ඇ ඇ) ඡන්ද කොට්ඨාසයේ අංකය ;

(ඈ) ඡන්දදායකයාට වෙන්කර ඇති ඡන්ද පොළ, සහ

(ඉ) ඡන්දය විමසීමේ දිනය හා වේලාව සඳහන් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තැපැලෙන් එවිය යුතුය.

(1963 අංක 9 & 9) (2)(1) වන උපවගන්තිය යටතේ වූ නිලඡන්ද දැක්වීම් පත්‍රිකාවක් ඡන්දය විමසන දිනයට යටත් පිරිසෙයින් දින පහකට පෙර ඡන්දදායකයාට ලැබෙන සේ ඔහු වෙත යැවිය යුතුය. එකී නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් එය ලැබිය යුතු තැනැත්තා වෙත භාර දීමට තැපැල් කාර්යාලකට නොහැකි වන අවස්ථාවක ඡන්ද විමසන දිනය වන තෙක් ඒ තැපැල් කාර්යාලයෙහි එය රඳවා තබාගෙන එය ලැබිය යුතු තැනැත්තා විසින් ඉල්ලා සිටියහොත් එය ඔහුට භාරදිය යුතුය.

(1963 අංක 9 & 9)

(3) (අ) බලයක් නොමැතිව යම් නිලඡන්ද දැන්වීම් පත්‍රිකාවක් වෙන යම් තැනැත්තෙකුට සපයන හෝ ;

(ආ) යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් වෙන යම් තැනැත්තකුට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන හෝ වෙනත් තැනැත්තකුගෙන් මිලයට ගනු ලබන නොහොත් මිලයට ගැනීම සඳහා ඉදිරිපත් වන "සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

(3අ) (අ) වෙන යම් තැනැත්තකුගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව තම සන්තකයෙහි ඇතිව, රජයේ සේවකයකු වශයෙන් තම කාර්ය ඉටු කිරීමෙහි යෙදී සිටින රජයේ සේවකයකු නොවන හෝ ;

(ආ) මේ ආඥා පනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් හෝ යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් වශයෙන් සැලකෙන හෝ එසේ පාවිච්චි කළ හැකි නිල ඡන්ද පත්‍රිකාවක් නිසි බලය නොමැතිව මුද්‍රණය කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් කළින් කළ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි, (1) වන උපවගන්තියේ විධිවිධාන එසේ සඳහන් කරනු ලැබිය යුතු සෑම ඡන්ද විමසීම් ප්‍රදේශයකට හෝ ප්‍රදේශවලට අදාළ විය යුතු යයි ප්‍රකාශ කළ හැකිය.

39 ආ.(1) යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීමක කාර්යය සඳහා මේ වගන්තිය යටතේ තැපැල් ඡන්දදායකයෙකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තකු විසින් තැපෑලෙන් ඡන්දය දිය හැකි අතර ඒ ඡන්දය විමසීමේ දී ඔහු පෞද්ගලිකව ඡන්දය නොදිය යුතුයි.

මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩකරමින් යම් ඡන්ද විමසීමක දී පෞද්ගලිකව ඡන්දය දෙන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

(2) යම් පළාත් පාලන ආයතනයක තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා වන ඉල්ලීමක් -

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙකු විසින් හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ තමා එබඳු සාමාජිකයෙකු, නිධරයකු හෝ සේවකයකු වශයෙන් සේවයෙහි නියුක්තව සිටීම හා,
සම්බන්ධ විශේෂ අවස්ථානුගත කරුණු නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි පෞද්ගලිකව ඡන්දය දීමට තමාට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හේතු කොටගෙන ඒ සාමාජිකයා නිලධරයා හෝ සේවකයා විසින් ;

(අ) ඡන්ද විමසීම් පවත්වනු ලබන දිනයේ දී ඡන්ද විමසීම් හා සම්බන්ධ කාර්යයක් සඳහා තමාගේ සේවා නියුක්තියට අදාළ විශේෂ අවස්ථානුගත කරුණු නිසා, නැතහොත් ඒ කාර්යය සඳහා තමා සේවයෙහි නියුක්ත කරනු ලැබීමට ඉඩ ඇති බව හේතු කොට ගෙන රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ හෝ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සහ ;

(ඇ) වෙනත් යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක තම අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දි පෞද්ලිකව ඡන්දය දීමට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හේතු කොටගෙන ඡන්ද විමසීමක අපේක්ෂකයකු විසින් කරනු ලැබිය හැකිය.

(3) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක් 26 වන වගන්තිය යටතේ නාම යෝජනා කිරීම පිළිබඳ දැන්වීම පළ කරනු ලැබූ දිනයට පසු දින දහයක් ඇතුළත ලැබෙන පරිදි තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ ඉල්ලීම නව වන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් ඒ කාර්යය සඳහා නියම කර ඇති ආකාරයට සාරානුකූල විය යුතුය.

(4) තැපැල් ඡන්දදායකයෙකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන කිසිම ඉල්ලීමකට ඉල්ලීම් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූල බවට තේරීම්භාර නිලධරයා සෑහිමට පත් වුවහොත් මිස, ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සුදුස්සක් කිරීමේ කාර්යය සඳහා තේරීම්භාර නිලධරයා විසින්, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් තොරතුරක් තමා වෙත සපයන ලෙස දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කළ හැකිය.

(6) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් තේරීම්භාර නිලධරයකුගේ තීරණය ඉල්ලුම්කරු වෙත ලියවිල්ලකින් දැන්විය යුතුය.

(7) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට ඉඩ දෙමින් හෝ නොදෙමින් කරනු ලබන තේරීම්භාර නිලධරයාගේ තීරණය අවාසනාත්මක විය යුතුය.

(8) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට තේරීම්භාර නිලධරයකු විසින් ඉඩදෙනු ලැබූ අවස්ථාවක,

ඡන්ද විමසීමක කාර්යය සඳහා ඉල්ලුම්කරු තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු විය යුතු ය.

(9) තේරීම් භාර නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් එක් එක් තැනැත්තෙකු වෙත ඒ තැනැත්තා විසින් සපයන ලද ලිපිනයට,

(අ) ඡන්ද පත්‍රිකාවක් ;

(ආ) අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියක් ;

(ඇ) මේ උපයගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් ලියුම් කවරයට වඩා කුඩා විය යුතු වුවද , " ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන්න සහ ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කර ඇති අංකය ලකුණු කළා වූවද තැපැල් ඡන්ද පත්‍රිකාව විධිමත් ලෙස ලකුණු කොට ඇති එය නැවත එවනු ලබන විට එය බහාලිය යුතු වුවද ලියුම් කවරයක් සහ ;

(ඇ) ඉහත සඳහන් ලේඛන ආපසු යවනු ලැබීම පිණිස ලියුම් කවරයක් හැකිතාක් ඉක්මනින් තැපැලෙන් යවනු ලැබිය යුතුය.

(10) තැපැල් ඡන්දදායකයන් ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් තැනැත්තන් විසින් පාවිච්චි කළ යුතු "ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය" හා අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඒවා නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය මේ පනතේ නවවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග අනුව විය යුතුය.

(11) තැපැල් ඡන්දදායකයෙකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් තැනැත්තක් වෙත නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාවක් මේ ආඥාපනතෙහි "තැපැල් ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(12) ඡන්ද විමසීමක් පැවැත්වීමට ඇති යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් සෑම තැනැත්තකුගේම ඡන්ද හිමි නාමලේඛනයේ සඳහන් නම , ලිපිනය සහ අංකය දැක්වෙන (මේ ආඥාපනතේ "තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තු" යනුවෙන් සඳහන් කරනු ලබන) ලැයිස්තුවක් හැකිතාක් ඉක්මනින් පිළියෙල කළ යුතුය. නවවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් ලැයිස්තුව පිළියෙල කිරීම සම්බන්ධයෙන් නියම කර ඇති යම් ආකාරයකින් ඒ ලැයිස්තුව පිළියෙළ කරනු ලැබිය යුතුය.

4 0 (1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා විසින් -

(අ) එක් එක් ඡන්ද කොට්ඨාසයක එක් එක් ඡන්ද පොළක් භාරව කටයුතු කිරීම සඳහා (මෙහි මින්මතු "ඡන්ද ස්ථානාධිපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කළ යුතු ය ;සහ

ඡන්ද ස්ථානාධිපතිවරුන් පත් කිරීම.
(1977 අංක 24 & 48)

(ආ) ඡන්ද පොළක් සම්බන්ධයෙන් ඡන්ද ස්ථානාධිපතිවරයා වශයෙන් එක් තැනැත්තකුට වඩා වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත්කර ඇති විඑම ඡන්ද ස්ථානාධිපතිවරුන්ගෙන් එක් අයෙකු එම ඡන්ද පොළෙහි ජ්‍යේෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වශයෙන් පත් කළ යුතු අතර ජ්‍යේෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු කෙරෙහි ද ඒ ඡන්ද විමසීමේ දී ඡන්ද විමසීම

පැවැත්වීම සඳහා වූ සියලු කටයුතු මෙහෙයවීම කෙරෙහි ද සාමාන්‍ය අධීක්ෂණය කළ යුතුය.

(2) අසනීප වීම හෝ වෙනත් හේතුවක් නිසා යම් ඡන්ද ස්ථානාධිපතිවරයකුට යම් ඡන්ද විමසීමක දී මේ ආඥාපනත යටතේ වූ ස්වකීය කාර්යය ඉටු කිරීමට නොහැකි වූ විටෙක තේරීම් භාර නිලධරයාට වෙනත් තැනැත්තකු පත් කිරීමට ද කාලයක් නොමැති අවස්ථාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තමා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා නියෝජ්‍යයකු පත් කළ හැකිය. එකී සෑම පත් කිරීමක් ම හැකිතාක් ඉක්මණින් තේරීම්භාර නිලධරයා වෙත වාර්තා කළ යුතු අතර ඒ තේරීම් භාර නිලධරයා විසින් ඒ පත්වීම ස්ථිර කළ හැකිය .

(3) සුදුසු යයි තමා කල්පනා කරන්නේ නම්, තේරීම් භාර නිලධරයා විසින් ස්වකීය ඡන්ද විමසීම් ප්‍රදේශයෙහි වූ යම් ඡන්ද පොළක් බාරව කටයුතු කළ හැකි අතර, ඡන්ද ස්ථානාධිපතිවරයන්ට අදාළ වන මේ ආඥාපනතේ විධිවිධාන ඡන්ද ස්ථානාධිපතිවරයා සම්බන්ධයෙන් තේරීම් භාර නිලධරයා විසින් හෝ තේරීම් භාර නිලධරයා සම්බන්ධයෙන් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හෝ කළ යුතු දෑ පිළිබඳ වූ අවශ්‍ය සුළු වෙනස් කිරීම් සහිතව ඒ තේරීම් භාර නිලධරයාට අදාළ විය යුතුය.

(1977 අංක 24 & 48)

41. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ සෑම ඡන්ද විමසීමක ම ඡන්දය දීම. 38 වන වගන්තිය යටතේ දැන්වීමක් මගින් තත් කාර්යය සඳහා නියම කරන ලද දිනයේ පෙ.ව. 7.00 ට ආරම්භ කළ යුතු අතර, එදින ප.ව. 4.00 ට අවසන් කළ යුතුය.

42. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ සෑම ඡන්ද විමසීමකදී ම ඡන්ද පත්‍රිකා මගින් ඡන්දය දිය යුතුය. එක් එක් ඡන්ද දායකයාගේ ඡන්ද පත්‍රිකාව මෙහි මින් මතු නියම කරනු ලබන ආකෘතිය අනුව වූ ද, විස්තර ඇතුළත් වන්නාවූ ද ඡන්ද පත්‍රිකාවකින් සමන්විත විය යුතුය.

ඡන්දය දීමේ කාලය
(1977 අංක 24 & 14)

ඡන්ද පත්‍රිකා මගින් ඡන්දය දිය යුතු බව.
(1977 අංක 24 & 50)

43. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාසයක් සඳහා තත්කාලයේ බලපවත්නා ඡන්ද හිමි නාම ලේඛනය ඒ කොට්ඨාසය සඳහා වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට තැනැත්තකු හිමිකම් ලබන්නේ ද, නොලබන්නේ ද යන වග නිශ්චය කිරීමේ කාර්යය සඳහා තීරණාත්මක සාක්ෂිය විය යුතු අතර ඒ ලේඛනයෙහි නම ඇතුළත් යම් තැනැත්තකුගේ ඡන්දය දීමේ අයිතිවාසිකම කෙරෙහි ඒ තැනැත්තාගේ නම එම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි විනිශ්චයට භාජනව ,පවත්නා යම් අභියාචනයකින් හානියක් නොවිය යුතු ය.

ඡන්ද හිමි නාම ලේඛනය ඡන්දය දීමේ අයිතිවාසිකම් පිළිබඳ තීරණාත්මක සාක්ෂි විය යුතු බව.
(1977 අංක 24 & 51)

තවද එවැනි යම් අභියාචනයක් විනිශ්චයට භාජනව පවත්නා අතරතුර එවැනි යම් තැනැත්තකු විසින් දෙනු ලබන යම් ඡන්දයක් එවැනි අභියාචනයක් විනිශ්චයට භාජනව නොපවත්නා විටෙක මෙන් වලංගු විය යුතු අතර අභියාචනය පිළිබඳව පසුව කෙරෙන තීරණය එම ඡන්දය කෙරෙහි බල නොපැයුතුය.

එසේ වුවද දූෂිත ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට හෝ වරදකරු කරනු ලැබීම හේතුකොටගෙන හෝ මැතිවරණ විනිශ්චයකාරවරයකුගේ වාර්තාවක් හේතුකොටගෙන හෝ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 52 වන හෝ 53 වන වගන්තියට යටතේ වූ වරදකරු කරනු ලැබීම හේතුකොටගෙන, නැතහොත් එම ආඥාවේ 4අ වන වගන්තිය ක්‍රියාත්මක වීම හේතුකොටගෙන එම ආඥාව යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්ද දීමට අපොහොසත්වන යම් තැනැත්තකු මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දුනහොත්,

ඔහු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතුය. තවද ;

එසේම තවදුරටත් බහු ඡන්දය දීම සම්බන්ධයෙන් අදාළ 82 වන වගන්තියේ විධි විධාන අතුරින් කිසිවක් කඩ කිරීම සඳහා යම් දණ්ඩනයකට යම් තැනැත්තකු යටත්වීම කෙරෙහි මේ වගන්තියෙහි වූ කිසිවක් බල නොපැයුතුය.

44. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ එක් එක් ඡන්ද විමසීමේ කාර්ය සඳහා ඒ ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා විසින් -

(අ)ඡන්ද විමසීම පැවැත්වීම හා ඡන්ද ගණන් කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කළ යුතුය ;

(ආ)යම් කිසි වේලාවකදී ඡන්දදායකයන් සෑහෙන සංඛ්‍යාවක් ඉඩකඩ සැපයීමටත්, ඡන්ද පත්‍රිකා ලකුණු කරන විට ඡන්දදායකයන් නොපෙනෙන ලෙස ඔවුන් ආවරණය වී ඇති බවට වගබලා ගැනීමටත් අවශ්‍ය ආවෘත ස්ථාන සංඛ්‍යාවක් ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ එක් එක් ඡන්ද පොළ සඳහා සැපයීය යුතුය ;

(ඇ)යම් ඡන්ද පොළක් සඳහා වෙන් කර ඇති ඡන්දදායක සංඛ්‍යාව සඳහා තේරීම් භාර නිලධරයාගේ මතය පරිදි, අවශ්‍ය විය හැකි ඡන්ද පත්‍රිකා සහ ඡන්ද පෙට්ටි සංඛ්‍යාවක් එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත සැපයිය යුතුය ;

(ඈ)ඡන්දදායකයන්ට ඡන්ද පත්‍රිකා ලකුණු කිරීමට හැකි වනු පිණිස වූ ද්‍රව්‍ය ද, ඡන්ද පත්‍රිකාවල මුද්‍රා තැබීම හෝ නිල ලකුණින් ඒවා සිදුරු කිරීම සඳහා උපකරණ ද, ඒ කොට්ඨාසයේ සඳහා තත් කාලයෙහි බලපවත්නා ඡන්ද හිමි නාමලේඛනයේ පිටපත් හෝ ඒ ඡන්ද පොළ සඳහා වෙන් කර ඇති ඡන්දදායකයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ ඒ කොටසෙහි පිටපත් හෝ එක් එක් ඡන්ද පොළට සැපයීය යුතුය.

(ඉ)මේ ආඥාපනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ඡන්ද විමසීම ඵලදායී ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය වෙනත් ක්‍රියා හා දේ කළ යුතුය.

ඡන්ද පොළවල්වල දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතු බව.
(1977 අංක 24 & 53)

45. (1) ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර සෑම ඡන්ද පොළක් ම ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් -

(අ)ඡන්ද පොළෙන් පිටත සහ එහි සෑම ආවෘත ස්ථානයක ම, ඡන්දදායකයන්ගේ මග පෙන්වීම සඳහා උපදෙස් දෙන දෙවන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දැන්වීමක් ; සහ;

(ආ)එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් සඳහන් කර ඇති අපේක්ෂකයන්ගේ නම් ද එක් එක් පක්ෂයකට හෝ කණ්ඩායමකට වෙන්කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද ස්වාධීන කණ්ඩායම් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවක දී නාම යෝජනා පත්‍රයේ සඳහන් පරිදි එක් එක් කණ්ඩායමකට වෙන්කර දී ඇති හඳුනාගැනීමේ අංක ද නිශ්චිතව දැක්වෙන දැන්වීමක් ඡන්ද පොළෙන් පිටත ;

(2) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම සිංහලෙන් දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් විය යුතුය.

46. සෑම ඡන්ද පෙට්ටියක්ම එය තුළට ඡන්ද පත්‍රිකා දැමිය හැකි ලෙසත්, පෙට්ටිය විවෘත නොකොට එයින් ඡන්ද පත්‍රිකා ඉවතට නොගත හැකි ලෙසත් තැනිය යුතුය.

47. සෑම ඡන්ද පත්‍රිකාවක්ම තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර-

(අ) ඡන්ද විමසීමට තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම්, සිංහල අකාරාදී අනුපිළිවෙලට සකස් කොට, ඒ ඒ පක්ෂයේ නමට කෙළින්, ඒ ඒ පක්ෂයට වෙන්කර දී ඇති ලකුණ සමග සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් ඇතුළත් විය යුතු අතර, ඊට ඉක්බිතිව ම, ඡන්ද විමසීම සඳහා තරග කරන " ස්වාධීන කණ්ඩායම්" ඇත්නම්, ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන නැවත සඳහන් කොට, අනුක්‍රමික අංක අනුපිළිවෙළ අනුව ඒ එක් එක් කණ්ඩායම සඳහා වූ හඳුනාගැනීමේ අංකයද ඊට කලින් යොදන ලද ඒ එක් එක් කණ්ඩායමට වෙන් කර දී ඇති ලකුණ ද එහි ඇතුළත් විය යුතු අතර, එම ලකුණ ඉදිරියෙන් ඡන්දය සලකුණු කිරීම සඳහා හිස් කොටුවක් ද ඉදිරියෙන් ඡන්දය සලකුණු කිරීම සඳහා හිස් කොටුවක් ද ඇතුළත් කර තිබිය යුතු ය. ඡන්ද දායකයකු විසින් එම ලබා දී ඇති කොටුව තුළ ඡන්දය සලකුණු කළ යුතුය.

ඡන්දපත්‍රිකා (1977 අංක 24 & 54)

(ආ) එය නැමිය හැකි විය යුතුය.

(ඇ) එහි පිට පැත්තේ අංකයක් මුද්‍රණය කොට තිබිය යුතුය. තවද

(ඈ) එහි මුහුණතෙහි එම අංකයම මුද්‍රණයකොට ඇති උප පත්‍රිකාවක් එයට අමුණා තිබිය යුතුය.

48 (1) නිල ලකුණ රහසාව තබා ගත යුතුය.

(2) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමකදී පාවිච්චි කරන ලද නිල ලකුණු අවුරුදු හතක කාලයක් ගත වන තුරු ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා වූ වෙන යම් ඡන්ද විමසීමකදී පාවිච්චි නොකළ යුතුය.

49 (1) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නැතහොත් එහි බලයලත් නියෝජිතයා විසින් සහ එක් එක් ස්වාධීන කණ්ඩායම් නායකයා විසින්, ඡන්ද විමසීම පැවැත්වෙන අතරතුර එක් එක් ඡන්ද පොළෙහි දී ඒ පක්ෂය හෝ කණ්ඩායම හෝ නියෝජනය කිරීම පිණිස (මෙහි මින්මතු " ඡන්ද ස්ථාන නියෝජිතයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් දෙදෙනකුට වැඩි නොවන සංඛ්‍යාවක් පත්කළ හැකිය. ඒ සෑම පත්කිරීක්ම පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් එසේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් හා ලිපින එහි සඳහන් කොට එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ එහි බලයලත් නියෝජිතයා විසින් සහ එක් එක් ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් එම ඡන්ද පොළෙහි දී ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ඡන්දය විමසීම ආරම්භවීමට පෙර හෝ ඒ අතරතුර දිය යුතුය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ පත් කරන ලද ඡන්ද ස්ථාන නියෝජිතයකු මියගියහොත් හෝ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්,

අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ එහි බලය ලත් නියෝජිතයා විසින් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් ඔහු වෙනුවට වෙනත් ඡන්ද ස්ථාන නියෝජිතයකු පත් කළ හැකි අතර, එසේ පත් කරන ලද ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නම හා ලිපිනය සඳහන් ලියවිල්ලකින් වූ දැන්වීමක් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත වහාම දිය යුතුය.

(3)

(i) යම් පළාත් පාලන ආයතනයක සභියකු ලෙස තත් කාලයෙහි ධූරය දරන ; නැතහොත්

(ii) එම ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු වන

කිසිම තැනැත්තකු එම ආයතනයේ ඡන්ද විමසීම් ප්‍රදේශයේ යම් ඡන්ද පොළක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක ඡන්ද ස්ථාන නියෝජිතයා ලෙස පත්කරනු ලැබීමට හෝ එවැන්නකු ලෙස ක්‍රියා කිරීමට සුදුස්සකු නොවිය යුතුය.

එසේ වුවද එම ආයතනයේ සභිකයකු වශයෙන් තත් කාලයෙහි ධූරය දරන යම් තැනැත්තකු විසින්, තමා අපේක්ෂකයකු වන යම් ඡන්ද විමසීමකදී තමාගේ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ ඡන්ද ස්ථාන නියෝජිතයකු ලෙස ක්‍රියා කළ හැකිය.

(4) මේ වගන්තියෙන් නියමිත දැන්වීම, යථා පරිදි පත් කරනු ලැබූ යම් ඡන්ද ස්ථාන නියෝජිතයකු සම්බන්ධයෙන් දී ඇත්නම් ඒ ඡන්ද ස්ථාන නියෝජිතයාට ඡන්ද විමසීම පැවැත්වෙන කාලය තුළ තමා පත් කරනු ලැබූ ඡන්ද පොළට පැමිණ සිටිය හැකිය.

50. යම් තැනැත්තකු යම් ඡන්දදායක කණ්ඩායමකට අයත් වන්නේ ද ඒ ඡන්දදායකයා කණ්ඩායම සඳහා වෙන් කර ඇති ඡන්ද පොළෙහි දී හැර වෙනත් කිසිම ඡන්දපොළක දී ඒ තැනැත්තා ඡන්දය දීම පිණිස ඇතුළත් කර ගනු නොලැබිය යුතුය.

ඡන්ද පොළට ඇතුළුකර ගැනීම (1977 අංක 24 & 56)

(3)* ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම ඡන්ද පොළෙහි මනා පැවැත්ම රැක ගත යුතු අතර, වරකට ඇතුළු කළ යුතු ඡන්දදායකයාගේ සංඛ්‍යාව විධිමත් කළ යුතුය. තවද ඔහු විසින් අපේක්ෂකයන්, ඡන්ද ස්ථාන නියෝජිතයා හෝ නියෝජිතයන්, රාජකාරියෙහි නියුක්ත පොලිස් නිලධරයන් සහ නිල වශයෙන් ඡන්ද පොළෙහි සේවයෙහි යොදවා ඇති තැනැත්තන් හැර සෙසු සියලු තැනැත්තන් ඡන්ද පොළෙන් බැහැර කළ යුතුය.

(1977 අංක 24 & 56)

(4) යම් තැනැත්තකු ඡන්ද පොළෙහි නොමනා ලෙස හැසුරුනහොත් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නිත්‍යානුකූල අණට කීකරුවීම පැහැර හැරියහොත් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ තැනැත්තා යම් පොලිස් නිලධරයකු ලවා නැතහොත් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හෝ තේරීම් භාර නිලධරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ වෙන යම් තැනැත්තකු ලවා ඡන්ද පොළෙන් වහාම ඉවත් කර විය හැකිය.

(5) (අ) ඡන්ද පොළකින් (4) වැනි උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ තැනැත්තකුට ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අවසරය ඇතිව හැර, ඡන්ද විමසීම පැවැත්වෙන වේලාව තුළ ඡන්ද පොළට යළිත් ඇත්ළු වීමට ඉඩ නොදිය යුතුය. තවද ;

(ආ) ඡන්ද පොළකින් (4) වැනි උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ තැනැත්තකු ඒ ඡන්ද පොළෙහි දී යම් වරදක් කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා සිටී නම්, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ඔහු පැමිණ විය හැකි වනතෙක් අත්අඩංගුවේ තැබිය හැකිය.

එසේ වුවද, මේ උපවගන්තියෙන් පවරන ලද බලතල, යම් ඡන්ද පොළක දී ඡන්දය දීමට හිමිකම් ඇති යම් ඡන්දදායකයකුට ඒ ඡන්ද පොළෙහි දී ඡන්දය පොළෙහි දී ඡන්දය දීමේ අවස්ථාවක් ලැබීමෙන් වැළැක්වෙන පරිදි ක්‍රියාවෙහි නොයෙදිය යුතුය.

5 1. ඡන්දය විමසීම ආරම්භ කිරීමට පෙරාතුව ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොළට පැමිණ සිටින තැනැත්තන්ට ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව බලා ගත හැකි වන සේ පෙන්වා ඉනික්බිතිව ඊට යතුරු ලා මුද්‍රාව නොකඩවා එය විවෘත නොකළ හැකි වන ආකාරයට ඒ මත ස්වකීය මුද්‍රාව තබා, ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා එය තමාට පෙනෙන පරිදි තැබිය යුතුය. තවද එසේ යතුරු ලා මුද්‍රා තැබූ පරිදි ම එය තබා ගත යුතුය.

---

*(2) වැනි උපවගන්තිය ඉවත් කරන ලදී. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතේ 56 වැනි වගන්තිය බලන්න.

ඡන්ද පෙට්ටිවල මුද්‍රා තැබීම.

52.(1) යම් ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් යම් ඡන්දදායකයකු ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින අවස්ථාවේ දී නමුත් ඉන්පසුව නොව (මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු) පහත දැක්වෙන ප්‍රකාශ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ කරන ලෙසත් එය පිළිගනිමින් අත්සන් කරන ලෙසත්, ඒ ඡන්ද දායකයාට නියම කළ හැකිය. තවද එසේ කරන ලෙස ඡන්ද ස්ථාන නියෝජිතයකු විසින් එසේ කරන ලෙස ඡන්දදායකයාට කියම කළ යුතුය. ඒ ප්‍රකාශ මෙසේය.

පළමුවැන්න..........................................................................පදිංචි
(ලිපිනය)

..........................................................................................................
(සම්පූර්ණ නම)

වන මා මේ කොට්ඨාසය සඳහා දැනට බලබවත්නා ඡන්දහිමි නාමලේඛනය ඒ.බී වශයෙන් නම සඳහන් තැනැත්තා ම වන බව මෙයින් ප්‍රකාශ කරමි.

.................................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ සළකුණ)

වර්ෂ 20...........ක් වූ .......................මස ....................වැනි දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්රකාශ කරන ලදී.

දෙවැන්න.......................................................................................පදිංචි
(ලිපිනය)

.............................................................................................................
(සම්පූර්ණ නම)

වන මම "මෙම කොට්ඨාසය සඳහා සභිකයන්" තෝරා පත්කර ගැනීම පිණිස වූ මෙම ඡන්ද විමසීමේ දී මෙහි දී හෝ වෙනත් ස්ථානයකදී හෝ මා විසින් ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

..............................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ සළකුණ)

වර්ෂ 20...........ක් වූ ........................මස ....................වැනි දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..............................................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

(2) (අ) එකී යම් ප්‍රකාශනයක් කිරීම යම් තැනැත්තකු ප්‍රතික්ෂේප කරගතහොත්, ඔහුට ඡන්ද පත්‍රිකාවක් දීම ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ප්‍රත්ක්ෂේප කළ හැකිය.

(අ) යම් තැනැත්තකු විසින් එකී යම් ප්‍රකාශයක් කිරීමේ දී ඕනැකමින් ම බොරු ප්‍රකාශයක් කළහොත් , ඔහු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතුය.

(3) යම් ඡන්දදායකයකු වෙත ඡන්ද පත්‍රිකාවක් කළ යුතු අවස්ථාවක-

(අ) ඒ ඡන්ද පත්‍රිකාවෙහි නිල ලකුණිනින් මුද්‍රා තැබිය යුතුය. නැතහොත් එහි නිල ලකුණ තෙරපිය යුතුය. නැතහොත් එහි නිල ලකුණ සිදුරු කළ යුතුය.

(ආ) ඡන්ද හිමි නාමලේඛනයේ පිටපතෙහි දැක්වෙන ඒ ඡන්දදායකයාගේ අංකය නම සහ විස්තරය හඬ නගා කියවිය යුතුය.

(ඇ)ඒ ඡන්දදායකයාගේ අංකය උප පත්‍රිකාවෙහි සටහන් කර, ඡන්ද පත්‍රිකාව එයින් වෙන් කළ යුතුය. තවද ;

(1953 අංක 25 & 17) (ඈ)ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාවක් ලැබූ බව දැක්වීම පිණිස, එහෙත් ඔහු ලැබූ ඒ ඡන්ද පත්‍රිකාව කුමක්දැයි නොදක්වා නාමලේඛනයෙහි ඔහුගේ අංකය ඉදිරියෙහි ලකුණක් තැබිය යුතුය.

53. ඡන්ද පත්‍රිකාව ලැබුණු විට ඡන්දදායකයා ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හෝ ඒ නිලධරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් පෙන්වනු ලබන ආවෘත ස්ථානය තුළට වහාම යා යුතු අතර, මේ ආඥාපනත යටතේ ඡන්ද දායකයන්ට මග පෙන්වීම සඳහා දී ඇති උපදෙස්වලට හැකිතාක් අනුකූලව එහි දී ඒ ඡන්ද පත්‍රිකාව රහසින් ලකුණු කර, තම ඡන්දය නොපෙනෙන සේ ඡන්ද පත්‍රිකාව නැමිය යුතුය. ඉනික්බිතිව නිල ලකුණ අනාවරණය වන සේ ඔහු විසින් ඒ පත්‍රිකාවේ

පිටුපස ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙන්වා එසේ නැවූ ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයා ඉදිරිපිට දී ඡන්ද පෙට්ටිය තුළට බහා ලිය යුතුය.

53අ. (1) යම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී -

ඡන්දය දෙන ආකාරය

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකුට උචිත පරීක්ෂණය කිරීමට ඉඩ දීම යම් ඡන්දදායකයකු ප්‍රතික්ෂේප කළ හොත් ; හෝ

(ආ) ඒ පරීක්ෂණයට ඉඩ දුන් පසු, උචිත ලකුණෙන් ඒ ඡන්දදායකයාට ඒ වන විටත් සළකුණු කරනු ලැබ ඇති බව ඒ පරීක්ෂණයෙන් අනාවරණය වුවහොත් ; හෝ

ඡන්දදායකයා පරීක්ෂා කිරීම හා උචිත ලකුණ සලකුණු කිරීම. (1965 අංක 15 & 11)

(ඇ) ඒ පරීක්ෂණයට ඉඩ දීමෙන් පසු, උචිත ලකුණෙන් ඒ ඡන්දදායකයා සලකුණු නො කරනු ලැබූ බව පරීක්ෂණයේ දී අනාවරණය වන නමුත් උචිත ලකුණෙන් ඒ ඡන්දදායකයා සළකුණු කිරීමට ඒ නිලධරයාට හෝ තැනැත්තාට ඉඩ දීම ඒ ඡන්දදායකයා ප්‍රතික්ෂේප කළහොත් ඒ ඡන්දදායකයාට කිසිම ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකළ යුතුය. තව ද මේ ආඥාපනතේ වෙන යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය දීමේ හිමිකම් ඒ අනුව ඒ ඡන්දදායකයාට නොලැබිය යුතුය.

(2) ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හත්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල ලැයිස්තුවක (1) වන උපවගන්තිය යටතේ එම ඡන්ද පොළෙහි දී ඡන්ද පත්‍රිකාවක් බාරදෙනු නොලැබූ එක් එක් ඡන්දදායකයාට අදාළ පහත දැක්වෙන විස්තර ඇතුළත් කළ යුතුය.

(අ) ඡන්ද විමසීම පවත්වනු ලබන්නා වූ ඡන්ද විමසීම් ප්‍රදේශයේ ඡන්ද හිමි නාම ලේඛනයේ එම ඡන්දදායකයාගේ අංකය ;

(ආ) එම ලේඛනයේ දැක්වෙන පරිදි එම ඡන්දදායකයාගේ නම සහ ලිපිනය ; සහ

(ඇ) එම ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකාව භාරදෙනු නොලැබූ හේතුව එම ලේඛනය මේ ආඥාපනතෙහි “53අ වැනි වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර දෙනු නොලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව” යනුවෙන් හඳුන්වනු ලැබේ.

(3) මේ වගන්තියෙහි -

(අ) “උචිත ලකුණ” යන යෙදුමෙන් නොමැකිය හැකි තින්තෙන් කරන ලද ලකුණක් අදහස් වේ ;

(ආ) ඡන්දදායකයකු පරීක්ෂා කිරීමට හෝ සළකුණු කිරීමට සම්බන්ධවන හෝ ඊට අදාළවන යම් පද සම්බන්ධයකදී “උචිත” යන යෙදුමෙන් -

(i) ඔහුගේ වම් අතේ සුළැඟිල්ල හෝ ඒ සුළැඟිල්ල නොමැති නම්, ඔහුගේ වම් අතේ වෙන යම් ඇඟිල්ලක් ; හෝ

(ii) ඔහුගේ වම් අතේ ඇඟිලි සියල්ලම නොමැති නම්, ඔහුගේ දකුණු අතේ සුළැඟිල්ල හෝ ඒ සුළැඟිල්ල නොමැති නම්, ඔහුගේ දකුණු අතේ වෙන යම් ඇඟිල්ලක් ; හෝ

(iii) ඔහුගේ වම් අතේ හා දකුණු අතේ ඇඟිලි සියල්ලම නොමැති

නම්, ඒ ඡන්දදායකයාට තිබෙන ඔහුගේ වම් අතේ හෝ දකුණු අතේ කෙළවර අදහස් වේ.

(4)

(අ)මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී යම් ඡන්දදායකයකගේ ශරීරයෙහි උචිත ලකුණක් හෝ ඒ ලකුණක් හෝ ඒ ලකුණ ලෙස හැඟෙන හෝ වැරදීමකින් ඒ ලකුණ ලෙස සළකුණු ලැබිය හැකි ලකුණක් නිසි බලය නොමැතිව තබන ; හෝ

(ආ) ඒ ඡන්ද විමසීමේදී යම් ඡන්දදායකයකුගේ ශරීරයෙහි තබනු ලැබූ යම් උචිත ලකුණක් නිසි බලය නොමැතිව වංචනික විරූපී කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

54.(1) යම් ඡන්දදායකයකු විසින් ඉල්ලා සිටි විටක, ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට මැනවයි හැඟේ නම්, ඡන්ද ස්ථාන නියෝජිතයන් පැමිණ සිටියහොත් ඔවුන්ට පෙනෙන සේ ද, ඇසෙන සේ ද, 45 වන වගන්තිය යටතේ වූ මඟපෙන්වීම්වල දැක්වෙන ඡන්දය දීමේ ක්‍රමය ඔහු විසින් ඒ ඡන්දදායකයාට පහදා දිය හැකිය. එහෙත් එසේ කිරීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ මඟ පෙන්වීමක් ලෙස ඡන්දදායකයා විසින් තේරුම්ගත හැකි යම් ක්‍රියාවක් කිරීමෙන් ඔහු තරයේ වැළකිය යුතුය.

ඡන්දදායකයන්ට ඡන්දය දිය හැකිවන සේ සහාය වීම.
(1977 අංක 24 & 59)

(2) අන්ධභාවය හෝ වෙනත් ශාරීරික හේතුවක් නිසා 45 වැනි වගන්තිය යටතේ වූ මඟ පෙන්වීම්වලට අනුකූලව ඡන්දය දීමට අපොහොසත් ඡන්දදායකයකු විසින් ඉල්ලා සිට විට, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොළෙහි තම කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු විසින් ඡන්ද පොළෙහි තම කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඔහු විසින් මෙහෙයවනු ලබන ආකාරයෙන් ලකුණු කළ යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළ බහාලීමට සැලැස්විය යුතුය.

55. යම් ඡන්ද හිමි ප්‍රදේශයක් සඳහා යම් ඡන්ද විමසීමක දී ප්‍රතියුක්තයකු මඟින් ඡන්දය දීමට කිසිම ඡන්දදායකයකුට හිමිකම් නොමැත්තේ ය.

(1965 අංක 15 & 12)

56. ඡන්ද හිමි නාමලේඛනයෙහි නම සඳහන් එක්තරා ඡන්දදායකයකු ලෙස පෙනී සිටින තැනැත්තකු , එම ඡන්දදායකයා ලෙස වෙන තැනැත්තකු ඡන්ද දීමෙන් පසු ඡන්ද පත්‍රිකාවක් ඉල්ලනු ලැබුවහොත් 52 (1) වැනි වගන්තියේ දක්වා ඇති පළමුවන ප්‍රකාශය කොට එය පිළිගෙන අත්සන් කළ කලිහි, වෙනත් යම් ඡන්දදායකයකු මෙන් ඡන්ද පත්‍රිකාවක් ලැබීමට හා ලකුණු කිරීමට ඔහුට හිමිකම් ඇති නමුත් එම ඡන්ද පත්‍රිකාව අනෙක් ඡන්ද පත්‍රිකාවලින් වෙනස් වූ වර්ණයකින් යුත් (මෙහි මින් මතු "ද්විත්ව ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් හඳුන්වනු ලබන) ඡන්ද පත්‍රිකාවක් විය යුතුය. එම ඡන්ද පෙට්ටිය තුළට දැමීම වෙනුවට ඡන්ද ස්ථානාධිපතිවරයාට දෙනු ලැබිය යුතු අතර, ඔහු විසින් ඡන්ද හිමි නාමලේඛනයෙහි දැක්වෙන ඡන්ද දායකයාගේ නම සහ පිටසන් කළ යුතුය. නාමලේඛනයෙහි දැක්වෙන ඡන්ද දායකයාගේ නම සහ ඔහුගේ අංකය "ද්විත්ව ඡන්ද පත්‍රිකා ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන

ලැයිස්තුවක ඇතුළත් කළ යුතුය. ද්විත්ව ඡන්ද පත්‍රිකා වෙනම පැකැට්ටුවක බහා තැබිය යුතු අතර ගණන් කරන නිලධරයා විසින් එම ඡන්ද පත්‍රිකා ගණන් කරනු නොලැබිය යුතුය.

ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීම තහනම් බව
(1977 අංක 24 & 60)
ද්විත්ව ඡන්ද පත්‍රිකා
(1977 අංක 24 & 61)

57. ස්වකීය ඡන්ද පත්‍රිකාව ඡන්ද පත්‍රිකාවක් ලෙස නිසි ආකාරයෙන් පාවිච්චි කළ නොහැකි වනසේ අනවධානයෙන් පරිහරණය කළ ඡන්දදායකයකු විසින් එසේ අනවධානයෙන් පරිහරණය කළ ඡන්ද පත්‍රිකව ඡන්ද ස්ථානාධිපතිවරයා ට භාරදී ඡන්ද ස්ථානාධිපතිවරයාට ඒත්තු යන ලෙස අනවධානයේ සිද්ධිය ඔප්පු කරනු ලැබූ කල්හි, ඔහු විසින් එසේ භාර දෙන ලද (මෙහි මින් මතු "නරක් වූ ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද පත්‍රිකාව වෙනුවට වෙනත් ඡන්ද පත්‍රිකාවක් ලබාගත හැකිය. ඒ නරක් වූ ඡන්ද පත්‍රිකාව වහාම අවලංගු කළ යුතුය.

**ඡන්ද විමසීම අවසන් කිරීම**

58. ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වේලාවන් පසු කිසිම ඡන්ද පත්‍රිකාවක් ඡන්දදායකයකුට භාර නොදිය යුතුය. එහෙත් ඡන්ද පත්‍රිකාවක් ලබාගත් යම් ඡන්දදායකයකු ඉහත කී වේලාවේ දී යම් ඡන්ද පොළක් තුළ සිටියහොත් ඒ ඡන්දදායකයකුට ඔහුගේ ඡන්දය සටහන් කිරීමට ඉඩ දිය යුතුය.

නරක් වූ ඡන්ද පත්‍රිකා

59. (1) එක් එක් ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද විමසීම් අවසන් කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් ඡන්ද ස්ථාන නියෝජිතයන් ඉදිරිපිටදී -

(අ) ඒ ඡන්ද පොළේ දී පාවිච්චි කරනු ලැබූ එක් එක් ඡන්ද පෙට්ටිය ඡන්ද විමසීම් ආරම්භ කළ වේලාවේ දී තිබුණු ආකාරයෙන් යතුරු දමා තිබිය යුතු අතර ඡන්ද විමසීම අවසන් කිරීමෙන් පසු යම් ඡන්ද පත්‍රිකා ඊට ඇතුළු කිරීම වැළැක්වීම පිණිස මුද්‍රා තබනු ලැබූ එක් එක් ඡන්ද පෙට්ටියේ යතුරත් සමග මුද්‍රා තබනු ලැබූ ඒ එක් එක් ඡන්ද පෙට්ටිය ;

(ආ) එකට තබනු ලැබූ පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා ;

(ඇ) ද්විත්ව ඡන්ද පත්‍රිකා ;

(ඈ) ලකුණු කළ ඡන්ද හිමි නාමලේඛනයේ පිටපත් සහ ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා ;

(ඉ) ද්විත්ව ඡන්ද ලැයිස්තුව ; සහ

(ඊ)53අ වැනි වගන්තිය යටතේ ඡන්ද පතිකා නොදෙන ලද ඡන්දදායකයන්ගේ ලැයිස්තුව වෙන වෙනම පැකට්ටුවල දමා ඒ පැකට්ටුවලට තමාගේ මුද්‍රාවෙන් හා මුද්‍රා තැබීමට කැමති එම ඡන්ද ස්ථාන නියෝජිතයනගේ මුද්‍රාවලින් මුද්‍රා තබා ගණන් කිරීමේ නිලධරයාට භාරදිය යුතුය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත භාර දෙනු ලැබූ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව දැක්වෙන්නාවූ ද -

(අ) ඡන්ද පෙට්ටියේ ඡන්ද පත්‍රිකා ;

(ආ) පාවිච්චි නොකරන ලද සහ නරක් වූ ඡන්ද පත්‍රිකා ; සහ

(ඇ) ද්විත්ව ඡන්ද පත්‍රිකා යන ශීර්ෂතල යටතේ ඒ පිළිබඳ ගිණුම් පෙන්වන්නා වූ ද (මෙහි මින් මතු "ඡන්ද පත්‍රිකා ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සාදනු ලැබූ ප්‍රකාශයක් සමග ඒ පැකට්ටු බාරදිය යුතුය.

59අ. (1) එක් එක් කොට්ඨාසයක ඡන්ද පොළවල් එකකට වඩා ඇති අවස්ථාවක දී එක් එක් ඡන්ද පොළක ඡන්ද ගණන් කිරීම අදාළ තේරීම්භාර නිලධරයා විසින් තීරණය කරන පරිදි, සිදුකළ යුතු ය.

(2) එක් එක් ඡන්ද පොළක ජ්‍යේෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ එක් ඡන්ද ස්ථානාධිපතිවරයෙකු පමණක් සිටින විට එම ඡන්ද ස්ථානාධිපතිවරයා එම ඡන්ද පොළෙහි ගණන් කිරීමේ නිලධරයා වශයෙන් කටයුතු කළ යුතු අතර , එම ඡන්ද පොළෙහි කාර්ය මණ්ඩලය ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු ය. කෙසේ වුවත් , එම ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට හෝ එම කාර්යමණ්ඩලයේ සිටින නිලධරයකුටම එම ඡන්ද පොළේ කටයුතු කරගෙන යාමට නොහැකි බව හෝ එම කටයුතු කිරීමට නුසුදුසු බව හෝ තේරීම්භාර නිලධරයාට හැඟියන්නේ නම්, එම ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වෙනුවට වෙනත් ගණන් කිරීමේ කාරිය මණ්ඩලයක් හෝ එම කාර්ය මණ්ඩලයේ සිටින නිලධරයකු වෙනුවෙට වෙනත් නිලධරයකු හෝ තේරීම්භාර නිලධරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

ඡන්ද ගණන් කිරිම

(3) කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ විධානයන්ට යටත්ව ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් තේරීම්භාර නිලධරයා විසින් 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකුගෙන් එක් අයකු හෝ එක් ඡන්ද ස්ථානාධිපතිවරයකු පමණක් පත්කර ඇතිවිට එම ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ එක් එක් කොට්ඨාසය සඳහා ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා වශයෙන් පත්තළ යුතුය. තේරීම්භාර නිලධරයා විසින් එම අවස්ථාවේදී ම ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි සහායකයන් හා ලිපිකරුවන් හා වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් , අවස්ථාවෝචිත පරිදි ගණන් කිරීමේ නිලධරයා හට ඔහුගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් සහාය වීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(4) යම් ඡන්ද පොළක ගණන් කිරීමේ නිලධරයකු වශයෙන් යම් තැනැත්තකු කටයුතු කිරීම සම්බන්ධයෙන් බලයලත් නියොජිතයන් විසින් යම් විරෝධතාවක් ඉදිරිපත් කරනු ලබන විට,

හෝ යම් ඡන්ද පොළකට පත්කර ඇති ගණන් කිරීමේ නිලධරයාට එම ගණන් කිරීමේ කටයුතු සිදුකරගෙන යාමට නොහැකි බව හෝ එම නිලධරයා ගණන් කිරීමේ නිලධරයා වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බව තේරීම්භාර නිලධරයාට හැඟීයන්නේ නම් , අවස්ථාවෝචිත පරිදි පළමුව සඳහන් කළ නිලධරයා වෙනුවට ගණන් කිරීමේ නිලධරයකු ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ සහකාර තේරීම්භාර නිලධරයකු, තේරීම්භාර නිලධරයා විසින් පත්කරනු ලැබිය හැකි ය".

59ආ. (1) 59 වන වගන්තියේ විධිවිධාන නොතකා, ඡන්දය දීම අතරතුර හෝ ඉන්පසුව ඡන්දපොළෙහි ඇතිවන යම් සිද්ධීන් හෝ බාධාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් හෝ වෙනත් යම් ආරක්ෂක හේතූන් මත එම ඡන්දපොළෙහි දී ඡන්ද ගණන් නොකළ යුතු බව එම ඡන්දපොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයාගේ මතය වන විට, එම ඡන්දපොළ පිහිටා ඇති ඡන්ද කොට්ඨාසයේ ඡන්දය දීම අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් තේරීම් භාර නිලධරයා වෙත එම කරුණ දැන්විය යුතු අතර, ඉන්පසුව එම තේරීම්භාර නිලධරයා විසින් ඡන්ද

ගණන් කරනු ලබන අලුත් ස්ථානය තීරණය කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද ගණන් කරනු ලබන ස්ථානයක් වෙනස් කිරීමේදී ඡන්ද ගණන් කිරීමට නියමිත අලුත් ස්ථානය සහ ඡන්ද ගණන් කිරීම ආරම්භවීමට නියමිත වේලාව පිළිබඳ ප්‍රමාණවත් දැන්වීමක්, එම සහකාර තේරීම්භාර නිලධරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත ඉන්පසුව 60 වන වගන්තිය යටතේ පත්කරනු ලබන එම වේලාවේදී ඡන්ද ගණන් කරනු ලබන ස්ථානයේ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් වෙත දෙනු ලැබිය යුතු ය.

(3) සහකාර තේරීම්භාර නිලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ,

අලුත් ස්ථානය පිළිබඳව තේරීම්භාර නිලධරයා වෙත දැන්වීමෙන් අනතුරුව අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ ඡන්ද පොළෙහි කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සිදු කළ යුතු ය.

ඡන්ද ගණන් කරනු ලබන ස්ථානය වෙනස් කිරීම.

6.0 පළාත් පාලන ආයතනයක යම් ඡන්ද කොට්ඨාසයක් සඳහා වන යම් ඡන්ද විමසීමක දී එක් එක් ඡන්ද පොළෙහි ඡන්ද ගණන් කිරීමේ කටයුතුවලට සහභාගීවීම සඳහා (මෙහි මින්මතු "ගණන් කිරීමේ නියෝජිතයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් දෙදෙනකු පත් කිරීමට අවස්ථාවෝචිත පරිදි,එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක බලයලත් නියෝජිතයාට හිමිකම තිබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ නියෝජිතයනගේ නම්, ලිපිනයන් සහ ජාතික හැඳුනුම්පත් අංක ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට ලිඛිතව දිය යුතු ය. අපේක්ෂකයකුට ඡන්දය ගණන් කරන අවස්ථාවේ දී ඡන්ද පොළේ රැඳී සිටිය හැක්කේ ගණන් කිරීමේ නියෝජිතයකු වශයෙන් පමණි.

61.(1) එක් එක් ඡන්ද පොළෙහි ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්දය දීම අවසන් කළපසු හැකි ඉක්මනින් ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී ඡන්ද ගණන් කිරීම සඳහා කටයුතු පිළියෙල කළ යුතුය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද ගණන් කිරීම නිමවීමෙන් පසු එකී ගණන් කිරීමෙන් ලත් ප්‍රතිඵලය 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කොට්ඨාසය සඳහා පත්කරනු ලැබූ ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන වේලාව සහ එවැනි ඡන්ද ගණන් කිරීමක ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව සහ ස්ථානය එම "කොට්ඨාසයේ තරග කරන සියලුම අපේක්ෂකයන් වෙතට ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය".

ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.

61අ. යම් ඡන්ද ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ තැපැල් ඡන්ද පත්‍රිකා නවවන උපලේඛනයේ දක්වා ඇති නියෝගවලට අනුකූලව වෙනම ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී හෝ තේරීම්භාර නිලධරයා විසින් නිශවය කරනු ලැබිය හැකි පරිදි මධ්‍යස්ථාන ගණනක දී ගණන් කරනු ලැබිය යුතුය.

62. (1) ගණන් කිරීමේ නිලධරයා, ඔහුට සහාය වීමට පත් කරනු ලැබූ තැනැත්තන් සහ ගණනක් කිරීමේ නියෝජිතයන් හැර ගණනක් කිරීමේ නිලධරයාගේ කැමැත්ත ඇතිව මිස කිසිම තැනැත්තකු ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ නොසිටිය යුතුය.

ගණන් කිරීම කරනු ලබන වේලාව සහ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීම.

(2) ගණන් කිරීමේ නිලධරයා ඡන්ද ගණන් කිරීමට පෙර, ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී එක් එක් ඡන්ද පෙට්ටිය විවෘත කොට, එහි ඇති ඡන්ද පත්‍රිකා එළියට ගෙන එහි වූ ඡන්ද සංඛ්‍යාව ගණන් කර වාර්තාගත කළයුතු අතර ඉන් පසු ඡන්ද පෙට්ටිවල තිබුණු සියලු ඡන්ද පත්‍රිකා එකට මිශ්‍ර කළ යුතුය.

(3) ගණන් කිරීමේ නිලධරයා ඡන්ද පත්‍රිකා ගණන් කොට වාර්තාගත කරන අතර දී සහ ඡන්ද ගණන් කරන අතර දී ඡන්ද පත්‍රිකා මුහුණත උඩකුරුව සිටින සේ තැබිය යුතු අතර ඒ පත්‍රිකාවල පිටුපස මුද්‍රිත අංක යම් තැනැත්තකු විසින් දැකීම වළක්වාලීම සඳහා නිසි සියලු පූර්වෝපායයන් යෙදිය යුතුය.

63. (1) (අ) නිල ලකුණ දරනු නොලබන යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.
(1987 අංක 24 & 20)

"(ආ)එය මත එක් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වඩා වැඩි සංඛ්‍යාවකට ඡන්දය සලකුණු කොට ඇත්නම්" ;

(ඇ) පිට පැත්තෙහි මුද්‍රිත අංකය හැර , ඡන්දදායකයා හඳුනාගත හැකි යම් දෙයක් ලියනු ලැබූ හෝ ලකුණු කරනු ලැබූ යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

ගණන් කිරීම.
(1977 අංක 24 & 65)

"(ඈ)ලකුණු කොට නොමැතිනම් හෝ ඡන්දය ලකුණු කොට ඇත්තේ කවර පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද යන්න අවිනිශ්චිත වීම හේතුවෙන් අවලංගු වේ නම්" ;

(2) ඡන්ද පත්‍රිකාවක් මත කරනු ලැබූ යම් ලකුණකින් ඡන්දදායකයා තමාගේ ඡන්දය දීමට ඇති චේතනාවත්, තමගේ ඡන්දය දෙනු ලබන පිළිගත් දේශපාලන පක්ෂයක් නැතහොත් ස්වාධීන කණ්ඩායමත් පැහැදිලිව දක්වන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, මේ ආඥාපනතේ විධිවිධාන යටතේ ඡන්දදායකයන්ගේ මග පෙන්වීම සඳහා දෙනු ලැබූ විධානවලට සෑම අන්දමින්ම අනුකූලව ඡන්ද පත්‍රිකාව ලකුණු කොට නොතිබීම පමණක් හේතුකොට ගෙන ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වැනි උපවගන්තිය යටතේ එම ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකාවක් ව්‍යාජ හෝ කූට ඡන්ද පත්‍රිකාවක් නොවන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක නිල ලකුණින් මුද්‍රා තබා නොතිබීම හෝ සිදුරු කර නොතිබීම පමණක් හේතුකොට ගෙන ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය. මේ උපවගන්තියෙහි ඉහත සඳහන් විධිවිධාන යටගේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප නොකිරීමට තීරණයක් ගැනීමට පෙර ගණන් කිරීමේ නිලධරයා විසින් ගණන් කිරීමේ නියෝජිතයන් පැමිණ සිටින්නේ නම් ඒ එක් එක් ගණන් කිරීමේ නියෝජිතයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස්වලට සවන් දිය යුතු ය.

(4) ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් ඡන්ද පත්‍රිකාවක් ඔහු විසින් ගණන් නොකළ යුතුය.

(5) ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් හේතුව යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව වෙන වෙනම දැක්වෙන ප්‍රකාශයක් සකස් කළ යුතු අතර යම් ගණන්

කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම මත එම ප්‍රකාශය පිටපත් කර ගැනීමට ඔහුට ඉඩ දිය යුතු ය.

"(6) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයකට සහ ස්වාධීන කණ්ඩායමකට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව වචනයෙන් මෙන් ම ඉලක්කමෙන් වූ ලිඛිත ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතුය. තවද එසේ පිළියෙල කරන ලද ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු අතර, ඔහුගේ ලිපිකරුවන් අතුරින් එක් තැනැත්තකු විසින් ද පැමිණ සිටින සහ අත්සන් කිරීමට කැමැත්තක් දක්වන ගණන් කිරීමේ නියෝජිතයන් විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය". සහ

(7) ගණන් කිරීමේ නිලධරයා විසින් (6) වන උපවගන්තියෙහි සඳහන් ලිඛිත ප්‍රකාශයක් කිරීමට පෙර එම ගණන් කිරීමේ නිලධරයා විසින් අවශ්‍යයයි සළකණු ලබන නැවත ගණන් කිරීම් සංඛ්‍යාවක් කරනු ලැබිය හැකිය. ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම මත නැවත ගණන් කිරීමක් හෝ නැවත ගණන් කිරීම් කරනු ලැබිය යුතු අතර යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ හෝ සියලු ගණන් කිරීමේ නියෝජිතයින්ගේ ඉල්ලීම මත එසේ කරනු ලැබිය යුතු උපරිම නැවත ගණන් කිරීම් සංඛ්‍යාව දෙකක් නොඉක්මවිය යුතුය.

(8) යම් ඡන්ද පත්‍රිකාවක් පිළිබඳව මතුවන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(1987 අංක 24 & 21)

63අ. 62 වන වගන්තිය හෝ 63 වන වගන්තිය යටතේ ගණන් කිරීමේ නිලධරයකු සතු බලතල, කාර්ය හෝ කටයුතු කිසිවක් ඒ නිලධරයාගේ අධීක්ෂණය හා විධානය යටතේ ක්‍රියා කරන ඔහුගේ සහායකයන්ගෙන් හෝ ලිපිකරුවන්ගෙන් යම් කෙනෙක් විසින් ඒ නිලධරයා සඳහා සහ ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකි ය. ඉටු කළ හැකි ය. නැතහොත් කළ හැකි ය.

64. (1) ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට ගණන් කරනු ලැබූ සහ ප්‍රත්ක්ෂේප කරනු ලැබූ ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ නිලධරයා විසින් වෙන වෙනම පැකැට්ටුවල බහා මුද්‍රා තැබිය යුතුය.

"(2) පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු නරක් වූ ඡන්ද පත්‍රිකා, ද්විත්ව ඡන්ද පත්‍රිකා, ඡන්දහිමි නාමලේඛනයේ ලකුණු කරනු ලැබූ පිටපත්, නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාවල උපපත්‍රිකා, ද්විත්ව ඡන්ද ලැයිස්තුව, 53අ වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා නිකුත් නොකරන ලද ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව, ඡන්ද පත්‍රිකා ගිණුම, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශ සහ 62 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඡන්ද ගණන් කිරීම පිළිබඳ වාර්තාව සමඟ (1) වන උපවගන්තියේ සඳහන් මුද්‍රා තබන ලද පැකට්ටු ද එක් එක් ගණන් කිරීමේ නිලධරයා විසින්, 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පත්කරන ලද කොට්ඨාසය භාරව සිටින ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයාට භාර දිය යුතු ය.

65. (1) 59අ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කොට්ඨාසය භාරව පත් කරනු ලැබූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා විසින්, 64 වන වගන්තියේ සඳහන් ලේඛන සහා නවවන උපලේඛනයේ 28(ඇ) වන නියෝගය යටතේ වූ ප්‍රකාශය ලැබීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් එකී කොට්ඨාසය සඳහා තම

අපේක්ෂකයා ලෙස නාමයෝජනාපත්‍රය මඟින් නම් කරනු ලැබූ සහ එකී කොට්ඨාසයේ ඡන්ද සංඛ්‍යාවෙන් වැඩි ම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් වූ අපේක්ෂකයාගේ නම එකී කොට්ඨාසය සඳහා තේරී පත් වූ සභිකයා වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය. තව ද ඔහු විසින්, එකී කොට්ඨාසයේ ඡන්ද විමසීමේ දී තරග කළ අන් සියලු පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ද ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) යම් පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර හෝ යම් ස්වාධීන කණ්ඩායම් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර හෝ යම් ස්වාධීන කණ්ඩායම් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර සමාන ඡන්ද සංඛ්‍යාවක් ඇති අවස්ථාවක සහ එක් ඡන්දයක් එකතු කිරීම මඟින් එකී පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයා තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම් ලබන විටෙක, එකී අමතර ඡන්දය ලබා දිය යුතු පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම නිශ්චය කිරීම ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට ඔහු ඉදිරියේ දී ලොතරැයි ඇදීම මඟින් සිදුකළ යුතු ය.

වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයා සභිකයකු වශයෙන් ප්‍රකාශයට පත් කිරීම.

(3) කොට්ඨාසයක් සඳහා තෝරාපත්කර ගන්නා අපේක්ෂකයා සභිකයකු වශයෙන් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ගණන් කිරීමේ නිලධරයා විසින් 64 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් ලේඛන ලැබීමෙන් ඉක්බිතිව ම එසේ ලැබුණු සියලුම ලේඛන තේරීම්භාර නිලධරයා වෙත භාරදිය යුතු ය.

65අ. (1) බහු සභික කොට්ඨාසයකි සම්බන්ධයෙන් වන විට, ඒ කොට්ඨාසයට තේරී පත් වූ සභිකයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු අපේක්ෂයන් සංඛ්‍යාව එකී කොට්ඨාසයේ ඡන්ද විමසීමට තරඟ කළ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධින කණ්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාව මත පදනම් විය යුතු අතර, ඡන්ද ගණන් කිරීමේ නිලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත්, පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයා එකී කොට්ඨාසයට තේරී පත් වූ සභිකයන් ලෙස තෝරාපත් කර ගත යුතු ඉතිරි සභිකයන් ඒ ආකාරයෙන් ම ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) යම් බහු සභික කොට්ඨාසයක ඡන්ද විමසීමකදී කවර හෝ යම් හේතුවක් නිසා පිළිගත් තනි දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් පමණක් තරග කරනු ලැබුවේ නම්, එකී බහු සභික කොට්ඨාසයට තේරී පත්වන සභිකයන් ලෙස ප්‍රකාශයට පත්කළ යුතු අපේක්ෂකයන් අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් අවස්ථාවෝචිත පරිදි එකී පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් භාරදුන් නාමයෝජනා පත්‍රයේ ඇතුළත් වූ අමතර තැනැත්තන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් තැනැත්තන් අතුරෙන් නම් කරනු ලැබිය යුතු ය.

65.අඅ. (1) පළාත් පාලන ආයතනයක් සඳහා යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තෝරා පත්කර ගත් සභිකයන් සංඛ්‍යාව, 65 ආ වගන්තියේ (3) උපවගන්තිය යටතේ නිශ්චිත වශයෙන් තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක දී, යම් කාන්තා සභිකයකු ඇතුළත් නොවන අවස්ථාවක, එවිට මේ පනතේ (3) වන (4) වන උපවගන්තිවල විධිවිධාන අදාල නොවිය යුතු ය.

බහු සභික කොට්ඨාසයක් සඳහා තේරී පත්වන අපේක්ෂකයන් ප්‍රකාශයට පත් කිරීම.

(2) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් පළාත් පාලන ප්‍රදේශයක ප්‍රකාශ කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට විස්සකට අඩු ප්‍රමාණයක් ලබාගෙන ඇති සහ සභිකයන් තුන් දෙනෙකු තෝරා පත්කර ගෙන හෝ තෝරා යවනු ලැබ ඇති අවස්ථාවක දී, (3) වන සහ (4) වන උපවගන්ති ප්‍රකාරව එම පිළිගත් දේශපාලනය පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් කාන්තා සභිකයන් තෝරා යැවීම අවශ්‍ය නොවන්නේ ය.

(3) මේ වගන්තියේ (2) වන උපලේඛනයේ සඳහන් කරන ලද දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් හැර පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වලින් එක් එක් පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගනු ලබන සහ තෝරා යවනු ලබන කාන්තා සභිකයන් වෙන් කිරීම ඒ පළාත් පාලන ආයතනවල සියලු කොට්ඨාසවල වෙනත් පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාව සහ එයට අදාල විය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රමය අවශ්‍ය වෙනස්කම් සහිතව සැකිල්ලට ගනිමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

කාන්තා සභිකයන් වෙන් කිරීම.

(4) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් නොවන යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් යම් පළාත් පාලන ප්‍රදේශයක සියලු කොට්ඨාස සඳහා තෝරා පත්කර ගත් කාන්තා සභිකයන් සංඛ්‍යාව,(3) වන උපවගන්තියේ නියමයන්ට අනුව බෙදා වෙන් කරන ලද සංඛ්‍යාවට වඩා අඩුවන අවස්ථාවක දී, එම අඩුවන සාමාජිකයන් සංඛ්‍යාව 9 වන වගන්තිය යටතේ සභිකයකු වීම සඳහා නුසුදුසු වන්නා වූ කාන්තා අපේක්ෂිකාවන් හැර පළමු නාමයෝජනාපත්‍රයේ හෝ අතිරේඛ නාමයෝජනාපත්‍රයේ වූ කාන්තා අපේක්ෂිකාවන් අතරින් යැවිය යුතු ය.

65ආ. (1) ඡන්ද විමසීම් ප්‍රදේශයේ සියලු කොට්ඨාස සඳහා තෝරාපත් කරගනු ලැබූ සභිකයන් සංඛ්‍යාව පිළිබඳව 65 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කිරීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ නිශ්චය කරනු ලබන පරිදි එම පළාත් පාලන ආයතනය සඳහා තෝරා ගනු ලැබිය යුතු සභිකයන්ගේ සංඛ්‍යාව මේ වගන්තියේ මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට බෙදා වෙන්කොට දීම සිදු කළ යුතු ය.

"(2) පළාත් පාලන ඡන්ද විමසීමක දී එක් එක් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ සියලු අපේක්ෂකයන් ලබාගත් සම්පූර්ණ වලංගු ඡන්ද සංඛ්‍යාව එම පළාත් පාලන බල ප්‍රදේශය සඳහා තේරී පත්විය යුතු සහ තෝරා යැවිය යුතු මුළු සභිකයන් සංඛ්‍යාවෙන් බෙදනු ලැබිය යුතු ය. (යම් භාගයක් ඉතිරි වුවහොත්, එය සැලකිල්ලට නොගෙන) එම ලැබෙන සංඛ්‍යාව මෙහි මින්මතු මේ වගන්තියෙහි "තීරක අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ".

(3) ඉන්පසු, අදාල පළාත් පාලන බල ප්‍රදේශයේ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ එකතුව, අදාල පළත් පාලන බල ප්‍රදේශයේ එක් එක්

පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් තෝරා පත්කර ගනු ලැබීමට සහ තෝරා පත්කර ගනු ලැබීමට සහ තෝරා යැවීමට හිමිකම් ඇති තැනැත්තන් සංඛ්‍යාව නිශ්චිතව සොයා ගැනීමේ කාර්යය සඳහා, තීරක අංකයෙන් බෙදිය යුතු ය. මෙකී ක්‍රමයෙන් සොයාගත් සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන විට, මේ උපවගන්තියේ කාර්යය සඳහා අවශ්‍ය සංඛ්‍යාව එකී පූර්ණ සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.

තෝරා ගනු ලැබීමට සහ තෝරා පත් කර යැවීමට හිමිකම් ලබන අපේක්ෂකයන්

"(4) (3) වන උපවගන්තියේ ප්‍රකාරව අවස්ථාවෝචිත පරිදි එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් අදාල පළාත් පාලන ආයතනයේ සභිකයන් ලෙස තෝරා පත්කර ගැනීමට සහ තෝරා යැවීමට හිමිකම් ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව තහවුරු කර ගැනීමේ දී එම පළාත් පාලන ආයතනය සඳහා එම පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ සෘජුවම තෝරා පත්කර ගනු ලැබූ සභිකයන් සංඛ්‍යාව -

(අ) (3) වන උපවගන්තිය යටතේ සභිකයන් ලෙස තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු බවට තහවුරු කර ගත් සභිකයන් සංඛ්‍යාවට, වඩා වැඩි නම්, එම වැඩිපුර සිටින සංඛ්‍යාව මැතිවරණ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය ; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ සභිකයන් ලෙස තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු බවට තහවුරු කර ගත් සංඛ්‍යාවට වඩා අඩු නම්, එම අමතරව අවශ්‍ය වී ඇති සභිකයන් සංඛ්‍යාව, අදාළ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් අවස්ථාවෝචිත පරිදි තේරී පත් වී ඇති අපේක්ෂකයන් හැර 9 වන වගන්තිය යටතේ සභිකයකු වශයෙන් තේරීමට නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයන්, පළමු නාම යෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයන් අතරින් තෝරා යැවිය යුතු ය.

(5) යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් හෝ තෝරා ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාව (3) වන උපවගන්තියේ සඳහන් ක්‍රමය මගින් තහවුරු කර ගනු ලැබීම අවසානයේ දී,

(4) වන උපවගන්තිය යටතේ තෝරාගැනීම සඳහා තවත් සභිකයන් සංඛ්‍යාවක් ඉතිරිව ඇති විට, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම් විසින් (3) වන උපවගන්තියේ යටතේ ලබාගත් ඉහළ ම අගය ඇති භාග සංඛ්‍යාව මත පදනම්ව එකී ඉතිරි සභික සංඛ්‍යාව වෙන්කර දිය යුතු ය.

(6) තේරීම්භාර නිලධරයා විසින්, තේරී පත් වී ඇති හෝ (9) වන වගන්තිය යටතේ සභිකයකු වශයෙන් තේරී පත්වීමට නුසුදුස්සකු නොවන අපේක්ෂකයන් හැර, අවස්ථාවෝචිත පරිදි එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් පළමු නාමයෝජනා පත්‍රයෙන් හෝ අතිරේඛක නාමයෝජනා පත්‍රයෙන් තෝරා පත්කර ගැනීමට හෝ තෝරා පත්කර යැවීමට හිමිකම් ලබා ඇති කාන්තා සභිකයන් ඇතුළුව යම් සභිකයන් ප්‍රමාණයක් මෙම වගන්තියේ (3) වන උපවගන්තිය සහ 65අඅ වගන්තියේ (3) උපවගන්තිය යටතේ තෝරා පත්කර යැවීමට හිමිකම් ඇත්තේ ය".

(7) ඉන්පසු, අදාළ ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා විසින් මේ වගන්තිය යටතේ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ නම් ප්‍රකාශයට පත්කළ යුතුය.

66.(1) යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් මෙම ආඥාපනතේ 65 වන වගන්තිය යටතේ එක් එක් කොට්ඨාසය සඳහා සභිකයන් වශයෙන් තෝරාපත් කර ගනු ලැබූ අපේක්ෂකයන් සහ 65අ වගන්තිය යටතේ තෝරාගනු ලබන අපේක්ෂකයන් ප්‍රකාශයට පත් කරනු ලැබීමේදී එම පළාත් පාලන ආයතනයෙහි ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා විසින් -

(අ) පළාත් පාලන ආයතනයේ සභිකයන් වශයෙන් තෝරාපත් කරගනු ලැබූ හෝ තෝරා ගනු ලබන සියලු ම අපේක්ෂකයන්ගේ නම් නිශ්චිතව සඳහන් කරනු ලැබූ දැන්වීමක් පළ කළ යුතු ය. තව ද ;

(ආ)ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයකද, ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා මඟින් ප්‍රතිඵලය කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) ප්‍රතිඵල පිළිබඳ වාර්තාව ලැබුණු පසු කොමසාරිස්වරයා විසින් එම පළාත් පාලන ආයතනයේ සභිකයන් වශයෙන් තෝරාපත් කරගනු ලැබූ අපේක්ෂකයන්ගේ නම් වහා ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

66අ. (1) යම් පළාත් පාලන ආයතනයක සභිකයකුගේ ධූරය, අවස්ථාවෝචිත පරිදි, (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත, හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යන පනත්වල විධිවිධාන ප්‍රකාරව පුරප්පාඩු වූ අවස්ථාවක එම පළාත් පාලන ආයතනය පිහිටා ඇත්තේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක ද එම ප්‍රදේශය සඳහා පත් කරන ලද තේරීම් භාර නිලධරයා විසින් එවැනි පුරප්පාඩුවක් ඇති වන්නේ,

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරිම.

(අ) එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ යම් කොට්ඨාශයක් සඳහා ඡන්දයෙන් තෝරා ගනු ලැබූ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් වන විට අවස්ථාවෝචිත පරිදි, එම සාමාජිකයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගේ හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්, එම ඡන්ද ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාශයේ ඇතිවිට පුරප්පාඩුව පිරවීම සඳහා තේරී පත් වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ සභිකයකු වශයෙන් තේරී පත්වීමට නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයන් හැර පළමු නාම යෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් වෙනත් යම් අපේක්ෂකයකු සභිකයකු වශයෙන් තෝරා පත්කර ගැනීමට පුරප්පාඩුව ඇති වී දවස් තිහක් ඇතුළත නාම යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය යුතු ය. හෝ ;

(ආ)මේ ආඥාපනතේ 65අ වගන්තිය යටතේ තෝරාගනු ලැබූ යම් සභිකයකු සම්බන්ධයෙන් වන විට, එම ධුරය හිස් වූ අපේක්ෂකයා පිළිගත් දේශපාලන පක්ෂයකින් ද නැතහොත් ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු ද යන්න මත පදනම්ව, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගෙන්, එම පුරප්පාඩුව පිරවීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගෙන්, එම පුරප්පාඩුව පිරවීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීම.

පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාරව තේරීපත් වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයන් හැර පළමු නාම යෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් වෙනත් යම් අපේක්ෂකයකු, පුරප්පාඩු ඇති වී දින තිහක් ඇතුළත නාමයෝජනා කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය.

"එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක කාන්තා සභිකයකු සම්බන්ධයෙන් පුරප්පාඩුවක් ඇති වී අවස්ථාවක දී, තේරී පත්වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති කාන්තා අපේක්ෂිකාවන් නොවන්නා වූ ද, පළමු නාමයෝජනා පත්‍රයේ හෝ අතිරේක නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් වූ ද, කාන්තා අපේක්ෂිකාවන් නම් කිරීමෙන් පමණක් එකී පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය".

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පළාත්පාලන ආයතනයක සභිකයකුගේ පුරප්පාඩුවක් පිරවීමට තෝරාපත්කරගනු ලැබූ අපේක්ෂකයකු ඔහු අනුප්‍රාප්තවනු ලැබුයේ කවර සභිකයකු ගේ ධූරයටද, එකී සභිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති ධූරකාලය සඳහා පමණක් ධූර දැරිය යුතු ය.

(1අ) පළමු නාම යෝජනා පත්‍රයේ සහ අතිරේත නාමයෝජනා පත්‍රයේ සඳහන් අපේක්ෂකයන්ගෙන් (1) වන උපවගන්තියේ සඳහන් යම් පුරප්ඩුවක් පිරවීම සඳහා නම් කිරීමට කිසිදු තැනැත්තකු නොමැති අවස්ථාවක දී, එම පළාත් පාලන ආයතනය පිහිටා ඇත්තා වූ ඡන්ද ප්‍රදේශය සඳහා පත් කරන ලද තේරීම් භාර නිලධරයා විසින්, එම පුරප්පාඩුව ඇති වීමේ දින සිට දින තිහක කාලයක් ඇතුලත, එම පුරප්පාඩුව පිරවීමට මේ පනතේ 8 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන වෙනත් යම් තැනැත්තකු එම ඉල්ලීමේ දින සිට දින තිහක් ඇතුළත නම් කරන ලෙස එම පුරප්පාඩුව සිදුවූ සාමාජිකයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක කාන්තා සභිකයකු සම්බන්ධයෙන් පුරපුපාඩුවක් ඇති වී ඇති අවස්ථාවක් වන විට මේ පනතේ 8 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන කාන්තා අපේක්ෂිකාවක් නම් කිරීමෙන් පමණක් එකී පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය".

66ආ. (1) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් එම පළාත් පාලන ආයතනයේ මුළු ආසන සංඛ්‍යාවෙන් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ලබාගෙන ඇති අවස්ථාවකදී, කොමසාරිස්වරයා විසින් එම පළාත් පාලන ආයතනයේ සාමාජිකයන් වශයෙන් තේරීපත්ව ඇති අපේක්ෂකයන්ගේ නම් 66 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රසිද්ධ කිරීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ තේරී පත් වූ සාමාජිකයන් අතරින් එම පළාත් පාලන ආයතනය සඳහා පිළිවෙලින් නගරාධිපතිවරයකු සහ නියෝජ්‍ය නගරාධිපතිවරයකු ප්‍රකාශයට පත්කරනු ලැබිය යුත්තේ කවර සභිකයන් ද යන්න නිශ්චය කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන ලද

නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධූරය එම පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව ඇතුළත පුරප්පාඩු වන අවස්ථාවක දී, ඒ පුරප්පාඩුව ඇති වූ බව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර,

තේරීම්භාර නිලධරයා විසින් මෙම වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අවස්ථාවෝචිත පරිදි එම නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන්, අවස්ථාවෝචිත පරිදි, එම පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ සභිකයන් අතරින් නව නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් පත්වන සභිකයන් නිශවයකොට එය දින තිහක් ඇතුළත දී තේරීම්භාර නිලධරයාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිය යුතු ය. එම තීරණය ලැබීමෙන් පසුව, එම පළාත් පාලන ආයතනයේ, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් සඳහන් කර ඇති සභිකයාගේ නම තේරීම්භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය. ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය.

යම් පිළාගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ආසන සංඛ්‍යාවෙන් සියයට පනහකට වැඩියෙන් ලබා ඇති අවස්ථාවක දී නගරාධිපතිවරයා ප්‍රකාශයට පත් කිරීම.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉහත කී දින තිහක කාලය ඇතුළත එවැනි සන්නිවේදනයක් නොලැබී ඇති අවස්ථාවක දී, තේරීම්භාර නිලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි ධූරය හිස් කරන ලද නගරාධිපති හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අයත් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ලබාගත් සභිකයන්, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා ලෙස නම් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

(4) මෙම වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අවස්ථාවෝචිත පරිදි (252 වන අධිකාර වූ) මහ නගර සභා ආඥාපනතේ 215අ වගන්තිය යටතේ හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 178අ වගන්තිය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය යටතේ නගරාධිපතිවරයා ධූරයෙන් ඉල්ලා අස්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් නගරාධිපතිවරයාගේ ධූරයෙහි පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවකදී, සහ මෙම ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව, නගරාධිපති ධූරයේ ඇති වූ එකී පුරප්පාඩුව පුරවනු ලැබ ඇති අවස්ථාවක දී, සහ එලෙස ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කර ගනු ලැබූ යම් සභිකයකු ඔහු විසින් ම සිය ධූරයෙන් ඉල්ලා අස් වූ අවස්ථාවක දී එසේ ඊට පසුව ඇතිවන පුරප්පාඩුව මෙම ආඥාපනතේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය අනුව පුරවනු නොලැබිය යුතු ය.

එවැනි යම් අවස්ථාවකදී එසේ දෙවන වරට නගරාධිපතිවරයකුගේ පුරප්පාඩුවක් ඇත්වී තිබෙන යම් පළාත් පාලන ආයතනයක් විසුරුවා හරින ලද පළාත් පාලන ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ පවරා ඇති බලතල ප්‍රකාර අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා හෝ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අදාළ පළාත් පාලන ආයතනයේ ඉතිරි කාලසීමාව සඳහා විශේෂ කොමසාරිස්වරයකු ලෙස ධූර දරන විශේෂ කොමසාරිස්වරයකු පත් කළ යුතු ය.

66ඇ. (1) යම් පළාත් පාලන ආයතනයක සමස්ත ආසන සංඛ්‍යාවෙන්

සියයට පනහකට වඩා අඩු සංඛ්‍යාවක් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් විසින් ලබාගෙන ඇති අවස්ථාවකදී, එකී පළාත් පාලන ආයතනයේ පළමු රැස්වීමේදී එම පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා තෝරාපත්කරගනු ලැබිය යුතු ය.

(2) පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 66 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පළාත් පාලන ආයතනයක සභිකයන් වශයෙන් තේරී පත් වී ඇති අපේක්ෂකයන්ගේ නම් පළ කොට සතියක් ඇතුළත සභාවේ පළමු රැස්වීම ඒ සම්බන්ධයෙන් පළ කරනු ලබන දැන්වීමක් මඟින් කැඳවිය යුතු ය. එවැනි දැන්වීමක් රැස්වීම සඳහා නියම කරනු ලබන දිනට දින හතකට වඩා අඩු නොවන කාලයකට පෙර භාර දීම සිදු කළ යුතු අතර -

(අ)භාෂා තුනෙන් ම ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල පළ කළ යුතු ය ; තව ද ;

(ආ)එම සභාවේ එක් එක් සභිකයාට ලියාපදිංචි තැපෑලෙන් යැවීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන සෑම දැන්වීමක ම පළමු රැස්වීමේ දිනය, වේලාව, සහ ස්ථානය නිශ්චිතව දැක්විය යුතු අතර, එසේ නිශ්චිතව දැක්විය යුතු දිනය, කාලය ඉකුත්වීම මත හැර වෙනත් ආකාරයකින් ධුරයෙන් ඉවත්වන සභාවක අනුප්‍රාප්තිකයා ලෙස තේරී පත් වී ඇති සභාවක් සම්බන්ධයෙන් වන විට, සභාවේ සභිකයන් තෝරා පත් කරගනු ලැබීම හෝ නම් කිරීම සම්පූර්ණ කරන ලද දිනට පසුව එළඹෙන එක් මාසයක කාලය ඇතුළත යම් දිනයක් හෝ සභාවේ ධුර කාලය ආරම්භ කිරීම සඳහා නියම කර ඇති දිනයට පසුව එළඹෙන එක් මාසයක කාලය ඇතුළත දිනයක් විය යුතු ය.

පළාත් පාලන ආයතනයේ පළමු රැස්වීම.

(4) (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ සඳහන් දිනයේ දී යම් හේතුවක් මත රැස්වීම පවත්වනු නොලැබූ අවස්ථාවක, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් අවශ්‍ය විට හැකි පරිදි තවදුරටත් පළ කරනු ලබන දැන්වීමක් හෝ දැන්වීම් මඟින් වෙනත් යම් දිනයක දී රැස්වීම කැඳවිය හැකි නමුත් එම වෙනත් දිනය (2) වන උපවගන්තිය යටතේ පළකර ඇති දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති දිනයට පසුව එළඹෙන එක් මසක් ඇතුළත වන දිනයක් විය යුතු ය.

66ඇ. (1) 66ඇ වගන්තිය යටතේ කැඳවනු ලබන පළමු රැස්වීම සහ නගරාධිපතිවරයා තෝරා පත් කර ගනු ලබන තෙක් කැඳවනු ලැබිය හැකි වෙනත් යම් රැස්වීමක මුලසුන (මෙම වගන්තියේ "මුලසුන දරන නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දැරිය යුතු ය.

(2) සභාවේ සභිකයන් එහි පළමු රැස්වීමේ දී තම සභිකයන්ගේ එක් තැනැත්තකු එම සභාවේ නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සභාවේ නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම, එම සභාවේ සාමාජිකත්වයෙන් අඩකට වඩා අඩු නොවන සභිකයන් සංඛ්‍යාවකින් සමන්විත ගණපූරණයක් එම රැස්වීම සඳහා ඇත්තේනම් මිස සිදු නොවිය යුතු ය.

(4) සභාවේ යම් සභිකයකු ඔහුගේ කැමැත්ත ඇතිව එම රැස්වීමට පැමිණ සිටින අනෙකුත් සභිකයන් විසින් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කළ හැකි ය.

(5) එක් සභිකයකුගේ නම පමණක් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක, එම තෝරා පත් කරගැනීම සිදුවන අවස්ථාවේ රැස්වීමේ මුලසුන දරන නිලධරයා විසින් එම තෝරා පත් කරගනු ලැබූ සභිකයා නගරාධිපතිවරයා වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

පළාත් පාලන ආයතනයක පළමු රැස්වීමේදී හෝ වෙනත් යම් රැස්වීමකදී නගරාධිපති සහ නියෝජ්‍ය නගරාධිපති තෝරාපත් කර ගැනීමේ කාර්ය පටිපාටිය.

(6) සභිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකගේ නම් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කරනු ලැබූ අවස්ථාවක, තෝරා පත් කර ගැනීමේ ක්‍රමය, පැමිණ සිටින සාමාජිකයන් විසින් යෝජනා සම්මතයක් මඟින් තීරණය කරනු ලබන විවෘත හෝ රහස්‍ය ඡන්දයක් මගින් විය යුතු ය. එවැනි යෝජනා සම්මතයක් මත පාවිච්චි කරනු ලබන ඡන්ද සංඛ්‍යාව සමානව බෙදී ඇත්නම් තෝරාපත් කර ගැනීමේ ක්‍රමය නිශ්චය කිරීම මුලසුන දරන නිලධරයා ඉදිරියේ ඔහු විසින් නියම කරනු ලබන ආකාරයට කුසපත් ඇදීමෙන් සිදු විය යුතු ය.

(7) නගරාධිපතිවරයා තෝරා පත් කර ගැනීම විවෘත ඡන්දයක් මගින් සිදු කළ යුතු බවට (6) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලැබූ අවස්ථාවක, මුලසුන දරන නිලධරයා පැමිණ සිටින එක් එක් සභිකයාගේ නම අඬ ගැසීමෙන් ඡන්දය දීම පිළිබඳ ඔහුගේ කැමැත්ත විමසා එම කැමැත්ත ඒ ආකාරයට වාර්තා කිරීම මගින් ඡන්දය ලබාගත යුතු ය. යම් සභිකයකු ඡන්දය දීමෙන් වැළකී සිටිනු ලබන අවස්ථාවක මුලසුන දරන නිලධරයා එම සභිකයා ඡන්දය දීමෙන් වැළකී සිටීමේ කරුණ වාර්තාගත කළ යුතු ය.

(8) නගරාධිපතිවරයා තෝරා ප්ත කර ගැනීම රහස්‍ය ඡන්දයෙන් සිදු කළ යුතු බවට (6) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලැබූ අවස්ථාවක, තෝරාපත් කර ගැනීම ඡන්ද පත්‍රිකා මඟින් විය යුතු ය.

(9) නගරාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමේ ක්‍රියාපිළිවෙත අවසානයේ දී, මුලසුන දරන නිලධරයා විසින් ඡන්දයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු ය.

66ඉ.(1) නගරාධිපතිවරයා වශයෙන් තෝරා පති කර ගැනීම සඳහා සභිකයන් දෙදෙනකුට වඩා යෝජනා කොට ස්ථිර කරනු ලැබ ඇති විට, සහ පළමු ඡන්ද විමසීමේ දී අවශේෂ සභිකයන්ට ලැබී ඇති මුළු ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිදු එක් සභිකයකු ලබා නොගත් අවස්ථාවක, මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි එක් සභිකයකු ඡන්ද විමසීමෙන් ඉවත් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, එම ඡන්ද විමසීමේදි අවශේෂ සභිකයන්ට ලැබී ඇති මුළු ඡන්ද සංඛ්‍යාවට වඩි වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිදු එක් සභිකයකු ලබා නොගත් අවස්ථාවක, මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි එක් සභිකයකු ඡන්ද විමසීමෙන් ඉවත් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, එම ඡන්ද විමසීමේ දී අවශේෂ සභිකයන් ලබා ගත් මුළු ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවක් යම් සභිකයකු විසින් ලබාගන්නා තෙක් එක් එක් ඡන්ද විමසීමෙන් පසුව එක් සභිකයකු ඉවත් කරනු ලබමින් හෝ ඡන්ද විමසීම සභිකයන් දෙදෙනකු සම්බන්ධයෙන් පමණක් පවත්වා අවසන් කරනු

ලබන තෙක් , ඡන්ද විමසීම මේ ආකාරයෙන් ම පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි සභිකයකු තෝරා පත්කර ගැනීමෙන් ඉවත් කළ හැකි ආකාරය පහත සඳහන් පරිදි විය යුතු ය -

(අ) එක් සභිකයකු විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව එක් එක් අවශේෂ සභිකයන් විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවට වඩා අඩු නම් එම අඩු ම ඡන්ද සංඛ්‍යාව ලැබූ සභිකයා ඉවත් කළ යුතු ය ; තව ද

අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව කිසිදු සභිකයකු විසින් ලබා නොගත් විට.

(ආ) සියලු ම සභිකයන්ගෙන් එක් එක් සභිකයකු සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගත්තේ නම් හෝ සභිකයන් දෙදෙනකු හෝ ඊට වඩා වැඩි සභිකයන්ගෙන් එක් එක් සභිකයකු සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගත්තේ නම් සහ එම ඡන්ද සංඛ්‍යාව අවශේෂ සභිකයාට හෝ එක් එක් අවශේෂ සභිකයන් ලබාගත් ඡන්ද සංඛ්‍යාවට වඩා අඩුවන විට සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා සභිකයන්ගේ එක් අපේක්ෂ සභිකයකු ඉවත් කළ යුතු අතර, සභිකයන්ගෙන් ඉවත් කළ යුතු සභිකයා නිශ්චය කිරීම මුලසුන දරන නිලධරයා ඉදිරියේ ඔහු විසින් නිශ්චය කළ යුතු ආකාරයට කුසපත් ඇදීමෙන් සිදුකළ යුතු ය.

(3) යම් ඡන්ද විමසීමක දී සභිකයන් දෙදෙනකු සිටින අවස්ථාවක, දෙන ලද ඡන්ද සංඛ්‍යාව සමානව බෙදී යන විට සහ එක් ඡන්දයක් එකතු කිරීම මගින් නගරාධිපතිවරයා වශයෙන් තෝරාපත් වීම සඳහා එක් සභිකයකුට හිමිකම ලැබෙන අවස්ථාවක, එම අතිරේක ඡන්දය දෙනු ලැබූ බවට සැලකිය යුතු සභිකයා තීරණය කිරීම මුලසුන දරන නිලධරයා ඉදිරියේ, ඔහු විසින් නිශ්චය කරනු ලැබිය යුතු ආකාරයට කුසපත් ඇදීමෙන් සිදු කළ යුතු ය.

66ඊ. (1) පළාත් පාලන ආයතනයක ප්‍රථම නියෝජ්‍ය නගරාධිපතිවරයා, අභිනවයෙන් තෝරාපත්කර ගන්නා ලද නගරාධිපතිවරයා මූලාසනය දරන 66ඇ වගන්තිය යටතේ පත්වනු ලබන සභාවේ ප්‍රථම රැස්වීමේදී තෝරා පත් කළ යුතු ය.

(2) 66ඈ සහ 66ඇ වගන්තිවල විධිවිධාන නගරාධිපතිවරයාට අදාළ වනවා සේ ම නියෝජ්‍ය නගරාධිපතිවරයාට ද අදාළ විය යුතු අතර ඒ අනුව එම වගන්තියේ "නගරාධිපතිවරයා" වශයෙන් සඳහන් කරනු ලැබ ඇති සෑම සඳහනක් ම නියෝජ්‍ය නගරාධිපතිවරයා සම්බන්ධයෙන් ද අදාළ කරගත යුතු ය.

66උ. සභාවක නගරාධිපතිවරයාගේ හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධූරය එම සභාවේ නිලකාලය තුළ දී පුරප්පාඩු වන ඕනෑ ම අවස්ථාවක දී, පළාත් පාලන කොමසාරිස්වරයා, 66ඇ වගන්තියේ (2) වන හෝ (4) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව භාරදෙනු ලබන දැන්වීමක් හෝ දැන්වීම් මගින් එවැනි පුරප්පාඩුවීමක් පිළිබඳව ඔහුවෙත දැන්වීමෙන් සති දෙකක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, අලුත් නගරාධිපතිවරයකු හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයකු තෝරාපත් කර ගැනීම සඳහා රැස්වීමක් කැඳවිය යුතු අතර, එවැනි දැන්වීමක හෝ දැන්වීම්වල රැස්වීම සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන දිනය එම පුරප්පාඩුව ඇති වූ දින සිට ඊළඟට එළඹෙන සති හයක කාලය ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, අලුත් නගරාධිපතිවරයකු හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලබන බවට තහවුරු කරනු ලබන දිනයක් විය යුතු ය.".

67. (2) තේරීම්භාර නිලධරයා විසින් සියලු ම ඡන්ද පත්‍රිකා, එක් එක් අපේක්ෂකයා වෙත ලබාදෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රකාශය, ඡන්ද පතිකා ගිණුම, ද්විත්ව ඡන්ද ලැයිස්තුව, උපපත්‍රිකා පැකට්ටු සහ 64 වන වගන්තිය යටතේ ගණන්කිරීමේ නිලධරයන් විසින් එවනු ලබන ඡන්ද හිමි නාමලේඛනවල ලකුණු කරන ලද පිටපත්, එම එක් එක් පැකට්ටුව මත ඒවායේ ඇතුළත් දේ පිළිබඳ විස්තරයක් සහ ඒවා අදාළ වන ඡන්ද විමසීමේ දිනය, සහ ඡන්ද විමසීම පවත්වනු ලැබූ කොට්ඨාසවල නම් පිටසන් කරනු ලබමින් ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද, ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) ඡන්ද විමසීම් නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකා පැකට්ටු සහ සියලු ලේඛන, ඒවා ලැබුණු දින ගණන් ගනු ලබන මාස හයක කාලයක් තමා වෙත තබා ගෙන ඉන් පසු එකී පැකට්ටු සහ ලේඛන විනාශ කිරීමට සැලැස්වීම ඔහු විසින් කළ යුතු ය.

නගරාධිපතිධූරය හෝ නියෝජ්‍ය නගරාධිපතිධූරය හිස් වීම.

(4) (3) වන උපවගන්තියේ සඳහන් යම් ඡන්ද පත්‍රිකා පැකට්ටුවක් හෝ ලේඛන ඡන්ද විමසීම් නිලධරයාගේ භාරයේ තිබිය දී ඒවා පරීක්ෂා කිරීමට කිසිම තැනැත්තකුට හිමිකම් නොලැබෙන්නේ ය. නැතහොත් ඒ නිලධරයා විසින් කිසිම තැනැත්තකුට ඒවා පරීක්ෂා කිරීමට අවසර නොදිය යුතු ය.
එසේ වුවද, මේ උපවගන්තියෙහි සඳහන් මාස හයක කාලය තුළ යම් අවස්ථාවක දී යම් පැකට්ටුවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස අණ කිරීමට හෝ එය පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කිරීමට බලය දීම යම්බලය ඇති අධිකරණයකට ඒ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන කිසිවක් මගින්, තහනම් කෙරෙන ලෙස තේරුම් ගැනීම හෝ සැලකීම නොකළ යුතු ය.

**ඡන්ද විමසීම් පිළිබඳ පොදු විධිවිධාන**

69. මේ ආඥාපනතේ ඡන්ද විමසීම්වලට අදාළ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමක් හේතු කොටගෙන කිසිම ඡන්ද විමසීමක්, ඒ විධිවිධාන මගින් නියමිත ප්‍රතිපත්තිවලට අනුකූලව ඒ ඡන්ද විමසීම පැවැත් වූ බවත් ඒ පැහැළු හැරීම ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බල නොපෑ බවත් පෙනී යයි නම්, අවලංගු නොවිය යුතු ය.

70. (1) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් ආධාර මුදලක් ලබන හෝ ආධාර මුදලක් ලබන හෝ ආධාර මුදලක් ප්‍රදානය කරනු ලබන යම් පාඨශාලාවක් හෝ පාඨශාලාවක යම් කොටසක් ඡන්ද පොළක් ලෙස ගාස්තුවක් නොමැතිව තේරීම්භාර නිලධරයකු විසින් පාවිච්චි කළ හැකි ය.

(2) ඉහත කී පරිදි යම් පාඨශාලාවක් හෝ එහි කොටසක් ඡන්ද පොළක් ලෙස පාවිච්චි කිරීම හේතුකොටගෙන, ඊට සිදු වූ යම් අලාභයක් පියවීම හා එහි පාලන භාර තැනැත්තන් විසින් දරන ලද යම් වියදමක් ගෙවීම තේරීම්භාර නිලධරයකු විසින් කළ යුතු ය.

72.* යම් තැනැත්තකු සිරභාරයට ගැනීමට, ඡන්ද පොළෙන් බැහැර කිරීමට හෝ ඡන්ද පොළෙන් ඉවත් කිරීමට නියම කිරීම හැර, ඡන්ද පොළෙහි දී තමා විසින් කිරීමට මේ ආඥාපනතේ මේ කොටසින් නියමිත හෝ බලය පැවරුණු යම් ක්‍රියාවක්, තමාට සහාය වීම සඳහා පත් කරනු ලැබූ නිලධරයන් මගින් ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් කළ හැකි ය.

72අ. (1)

(අ) ඡන්ද දීම ආරම්භ කිරීම සඳහා වන නියමිත වේලාවේදී ඡන්ද පොළක ඡන්දය දීම ආරම්භ කිරීමට නොහැකි වීම ;

මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකිරීම. (1965 අංක 15 & 15)

(ආ) එවැනි ඡන්දපොළක ඡන්දය දීම ආරම්භ කිරීමට නියමිත වේලාවේ දී ඡන්දය දීම ආරම්භ කළ ද ඡන්දය දීම අවසන් කිරීමේ නියමිත වේලාව වනතුරු එය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම ;

68 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ඡන්ද පොළවල් ලෙස පාඨශාලා පාවිච්චි කිරීම.

(ඇ)ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පාලනයෙන් බැහැර කිසියම් හේතුවක් නිසා එම ඡන්ද පොළේ දී ඡන්දය දීම පැවැත්වීමට නොහැකි වීම ;

(ඈ)ඡන්දය දීමක දී බාධා කිරීමක් සිදුවන අවස්ථාවක ඡන්ද ස්ථාන නියෝජිතයන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට තර්ජනය කිරීම, මරණයට පත්කිරීම හෝ ඡන්දපොළෙන් පිටතට පළවා හැරීම

(ඉ)මාර්ගයේ යම් අවහිරතාවක් නිසා ඡන්දපොළ කාර්ය මණ්ඩලයට ඡන්දපොළට පැමිණීමට නොහැකි වීම ;

(ඊ)ඡන්ද පොළේ දී සාමයට බාධාවන යම් සිදුවීමක් නිසා ඒ ඡන්ද පොළේ දී ඡන්දය පැවැත්වීම අපහසු වීම ;

ඡන්ද ස්ථානාධිපතිවරයාට සහායවීම සඳහා පත් කරනු ලැබූ නිලධරයන් මගින් ඔහුට ක්‍රියා කිරීමට හැකි බව.

(උ)කිසියම් තැනැත්තකු විසින් බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි තුළට දැමීම; හෝ

(ඌ)කිසියම් ඡන්දපොළක සැබෑ, නිදහස්, සාධාරණ සහ රහස් ඡන්දය දීමක් නොමැති වීම,

ඡන්ද පොළවලදී බාධා කිරීම.

යන ස්වභාවයේ වූ ඇතැම් සිදුවීම් එම ඡන්ද පොළෙහි සිදු වූ අවස්ථාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් වහාම තේරීම්භාර නිලධරයා වෙත දැනුම් දිය යුතු අතර, එවිට ඔහු විසින් එම සිද්ධිය කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ යම් තොරතුරක් ලැබීම මත සහ එම තොරතුරෙහි නිරවද්‍යභාවය සොයා බැලීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් පරීක්ෂණ සිදු කිරීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම ඡන්ද පොළෙහි ඡන්දය දීම අවලංගු බව ප්‍රකාශයට පත් කළ යුතු ය.

73. මෙම ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක් සඳහා තෝරාපත්කර ගනුලැබූ අපේක්ෂකයකු වෙනුවෙන් ගණන්කිරීම් නියෝජිතයකු පත්කරනු ලැබුවේ නම් , එකී නියෝජිතයාට ඉටුකිරීම සඳහා නියම කරනු ලැබිය හැකි යම් ක්‍රියාවක් හෝ දෙයක් , එකී අපේක්ෂකයාට තමා වෙනුවෙන් ඉටු කිරීමට හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කරනු ලබන යම් නියෝජිතයකුට සහය වීම හෝ සිදුකළ හැකි ය. එසේ වුව ද,

මෙම වගන්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර එවැනි යම් නියෝජිතයකු විසින් ලබාදිය යුතු යයි නියම කරනු ලබන ප්‍රකාශන අපේක්ෂකයා විසින් ලබාදිය යුතු ය.

74. මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී අපේක්ෂකයාගේ නියෝජිතයා හෝ නියෝජිතයන් ඉදිරියේ දී කරන ලෙස මේ ආඥාපනත යටතේ නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ යම් ක්‍රියාවක් හෝ නියෝජිතයන් ඒ කාර්යය සඳහා නියම කරනු ලැබූ වේලාවට සහ ස්ථානයට පැමිණ නොසිටිය ද එම ක්‍රියාව හෝ දෙය අන්‍යාකාරයකින් යථාපරිදි කර ඇත්නම් එම නියෝජිතයා හෝ නියෝජිතයන් ඒ කාර්යය සඳහා නියම කරනු ලැබූ වේලාවට සහ ස්ථානයට පැමිණ නොසිටිය ද එම ක්‍රියාව හෝ දෙය අන්‍යාකාරයකින් යථාපරිදි කර ඇත්නම් එම නියෝජිතයා හෝ නියෝජිතයන් එම නියමකොට ඇති වේලාවට සහ ස්ථානයට නියමිත කාර්යය සඳහා පැමිණ නොසිටීම මඟින් එම ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය.

75. මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී ඡන්දය දුන් කිසි ම තැනැත්තකුට තමා ඡන්දය දුන්නේ කා සඳහා ද යන වග ප්‍රකාශ කරන ලෙස ඒ ඡන්ද විමසීම ප්‍රශ්න කෙරෙන යම් නඩු කටයුත්තක දී නියම නොකළ යුතු ය.

අපේක්ෂකයකුට තමාගේ ම ඡන්ද ස්ථාන නියෝජිතයා හෝ ගණන් කිරීමේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කළ හැකිය; නැතහොත් එවැනි නියෝජිතයකුට සහය විය හැකිය.

75අ. ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයා ලෙස නම් කරනු ලබන යම් තැනැත්තකු, පළාත් පාලන ආයතනයක ඡන්දයක් පැවැත්වීමට නියමිත කාලය තුළ හෝ ඊට පසුව මියගිය අවස්ථාවක, එම ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් ඔහුගේ බලයලත් නියෝජිතයා ලෙස නම් කරන ලද තැනැත්තා එම ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා ලෙස සැලකිය යුතු ය.

76. (1) සෑම තේරීම් භාර නිලධරයකු ම විසින් ද මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්ද පොළකට හෝ ඡන්ද ගණන් කරන අවස්ථාවක හෝ පැමිණ සිටිමට බලය පවරනු ලැබූ සෑම නිලධරයකු ම, ඡන්ද නියෝජිතයකු ම හෝ ගණන් කිරීමේ නියෝජිතයකු ම විසින් ද, ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය දීම ආරම්භ කිරීමට පෙර නැතහොත් ඡන්ද විමසීම ආරම්භ කිරීමෙන් පසු පත් කරනු ලැබූ නියෝජිතයකු සම්බන්ධයෙන් වූ විට, ඒ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීමට පෙර, හතර වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූල රහස්‍යතා ප්‍රකාශයක් කළ යුතුය.

අපේක්ෂකයන්ගේ නියෝජිතයන් පැමිණ නොසිටීම.

තේරීම් භාර නිලධරයකු සම්බන්ධයෙන් වූ විට සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට ඒ ප්‍රකාශය කළයුතු අතර, වෙන යම් නිලධරයකු හෝ නියෝජිතයකු සම්බන්ධයෙන් වූ විට සමාදාන විනිශ්චයකාරවරයකු හෝ තේරීම් භාර නිලධරයා හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා ඉදිරිපිට ඒ ප්‍රකාශය කළ යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද පොළකට හෝ ඡන්ද ගණන් කරන අවස්ථාවක හෝ පැමිණ සිටින සෑම තේරීම් භාර නිලධරයකු ම විසින් ද සෑම නිලධරයකු ම, ඡන්ද නියෝජිතයකුම හෝ ගණන් කිරීමේ නියෝජිතයකුම විසින් ද ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව රැක ගත යුතු අතර රැක ගැනීමට ආධාර ද කළ යුතු ය.

ඡන්දය හෙළිදරව් කිරීම තහනම් බව.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයකු හෝ නියෝජිතයකු

වන කිසිම තැනැත්තකු විසින් -
(අ) නීතියෙන් බලය පවරන ලද යම් කාර්යයක් සඳහා හැර -

(i) ඡන්ද පොළක දී ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කළ හෝ නොකළ නැතහොත් ඡන්දය දී ඇති හෝ නැති යම් ඡන්දදායකයකුගේ ඡන්ද හිමි නාමලේඛනයෙහි සඳහන් වන්නා වූ නම හෝ අංකය පිළිබඳ වූ ; හෝ

(ii) නිල ලකුණ පිළිබඳ වූ යම් තොරතුරක් ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර යම් තැනැත්තකුට දැනුම් නොදිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ ඡන්ද විමසීමේ ඡන්ද ගණන් කිරීමේහි දී යම් ඡන්ද පත්‍රිකාවක පිටුපස ඇති අංකය සොයා දැනගැනීමට හෝ සොයා දැනගැනීමටත් තැත් කිරීම හෝ නොකළ යුතුය ; නැතහොත්

(ඇ) එක්තරා ඡන්ද පත්‍රිකාවක් මගින් යම් ඡන්දයක් ලැබූ අපේක්ෂකයා කවරකු දැයි යන්න පිළිබඳව ඒ ගණන් කිරීමේ දී ලබාගත් යම් තොරතුරක් කිසිවකුට දැනුම් නොදිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් නිලධරයකු හෝ නියෝජිතයකු වන හෝ නොවන කිසිම තැනැත්තකු විසින් -

(අ) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ස්වකීය ඡන්ද සටහන් කිරීමෙහි යෙදී සිටින ඡන්දදායකයකුට බාධා කිරීම හෝ බාධා කිරීමට තැත් කිරීම ; හෝ

(ආ) ඡන්ද පොළක දී ඡන්දදායකයකු එම ඡන්ද විමසීමේ දී ඡන්දය දීමට සූදානම්ව සිටින්නේ හෝ ඡන්දය දී ඇත්තේ පිළිගත් කවර දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද යන තොරතුරු ඒ ඡන්ද පොළෙහි දී අන්‍යාකාරයකින් ලබා ගැනීම හෝ ලබා ගැනීමට හෝ තැත් කිරීම ; හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී එම ඡන්ද පොළෙහි ඡන්දදායකයකු ඡන්දය දීමට සූදානම්ව සිටින්නේ හෝ ඡන්දය දී ඇත්තේ පිළිගත් කවර දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද යන්න පිළිබඳව හෝ එම ඡන්ද පොළෙහි දී ඡන්දදායකයකුට දෙනු ලැබූ ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තේ සඳහන් අංකය පිළිබඳව ලබාගන්නා ලද යම් තොරතුරක් යම් තැනැත්තකුට යම් වේලාවක දී දැනුම්දීම ; හෝ

(ඈ) ඡන්දදායකයකු ඡන්ද පත්‍රිකාව ලකුණු කළ පසු, තමාගේ ඡන්ද පත්‍රිකාව එසේ ලකුණු කරනු ලැබුවේ කවර පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට පක්ෂව හෝ විරුද්ධව ද යන
(1977 අංක 24 & 77) වග යම් තැනැත්තකුට දැනගත හැකි වන පරිදි ඒ ඡන්ද පත්‍රිකාව ප්‍රදර්ශනය කිරීමට කෙළින්ම හෝ අන් අයුරකින් එම ඡන්ද විමසීමේ දී ඒ ඡන්දදායකයා පෙළඹවීම නො කළ යුතු ය.

(5) මේ ආඥාපනතින් බලය පැවරුණු කාර්ය සඳහා ක්‍රියා කරන ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඉහත කී කාර්යය සඳහා බලය පවරනු ලැබ ඒ කාර්ය සඳහා ක්‍රියා කරන තැනැත්තකු හැර කිසිම තැනැත්තකු විසින්, මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී යම් ඡන්දදායකයකුට ඡන්ද පත්‍රිකාවක් ලැබීමෙන් පසු ද ඔහු එය ඡන්ද පෙට්ටියක් තුළට බහාලීමට පෙර ද ඒ ඡන්දදායකයා සමග කවර වූ හෝ අන්දමකින් අදහස් හුවමාරු නො කළ යුතු ය.

(1977 අංක 24 & 77) 76අ. මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීමක් පැවැත්වීමේ දී යම් දුෂ්කරතාවක් පැන නගින අවස්ථාවක යම් විශේෂ හෝ කලින් අපේක්ෂා නොකළ අවස්ථාගත කරුණු හෝ මෙම ආඥාපනත මගින් විධිවිධාන සලස්වා නොමැති කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ වෙනස් කිරීමක් සිදුකිරීමක් සඳහා යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වෙනස් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමේ අරමුණින් අවශ්‍ය යයි සලකනු ලබන විධාන,

කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නිකුත් කළ හැකි ය.

**ඡන්ද විමසීම්වලට අදාළ වැරදි**

77.76 වන වගන්තියේ විධිවිධානවලින් යමක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

78.(1)

(අ) යම් නාමයෝජනා පත්‍රයක් කූට ලෙස පිළියෙළ කරන හෝ වංචනික ලෙස විරූපී කරන හෝ වංචනික ලෙස විනාශ කරන හෝ කූට ලෙස පිළියෙළ කරන ලද්දක් බව දැන දැනම යම් නාම යෝජනා පත්‍රයක් තේරීම් භාර නිලධරයකුට භාර දෙන,

කොමසාරිස්වරයා විසින් නිකුත් කිරීම.

(ආ) යම් ඡන්ද පත්‍රිකාවක් හෝ යම් ඡන්ද පත්‍රිකාවක වූ නිල ලකුණක් කූට ලෙස පිළියෙළ කරන හෝ එහි ව්‍යාජ අනුකරණයක් කරන හෝ එය වංචනික ලෙස විරූපී කරන හෝ වංචනික ලෙස විනාශ කරන ; හෝ

(ඇ) නිසි බලය නොමැතිව යම් තැනැත්තකුට යම් ඡන්ද පත්‍රිකාවක් සපයන ; හෝ

(ඈ) යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් වන නොහොත් යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුගෙන් මිලට ගන්නා හෝ මිලට ගැනීමට ඉදිරිපත් වන ; හෝ

(ඉ) 52 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නිල ලකුණ යොදා ඇති යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයෙහි තබා ගැනීමට මේ ආඥාපනත යටතේ හිමිකම් ලත් තැනැත්තකු නොවී සිටිය දී එකී යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයෙහි තබා ගෙන සිටින ; හෝ

(ඉඉ) ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොළක් තුළ දී ඕනෑකමින් ම ප්‍රදර්ශනය කරන ; හෝ

(ඊ) මේ ආඥාපනත යටතේ ඡන්ද පෙට්ටියක් තුළ බහාලීමට තමාට බලය ඇති ඡන්ද පත්‍රිකාව නොවන යම් දෙයක් යම් ඡන්ද පෙට්ටියක් තුළ බහාලන ; හෝ

(උ) නිසි බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොළකින් පිටතට ගෙන යන ; හෝ

(ඌ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කොට ඇති යම් ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පත්‍රිකා පැකට්ටුවක් නිසි බලය නොමැතිව විනාශ කරන ලබා ගන්නා විවෘත කරන හෝ අන් ලෙසකින් ඊට යමක් කරන ; හෝ

(එ) යම් ඡන්ද පත්‍රිකාවක් හෝ ඒ ඡන්ද විමසීමේ දී ඡන්ද පත්‍රිකාවක් ලෙස සැලකෙන හෝ පාවිච්චි කළ හැකි වන කිසිවක් නිසි බලය නොමැතිව මුද්‍රණය කරන ; හෝ

(ඒ) ඡන්ද පෙට්ටියක් තුළ බහාලනු ලැබීමෙන් පසු ඡන්ද පත්‍රිකාවක් ඉවතට ගැනීමට, එය විකෘති කිරීමට හෝ එය වංචනිකව වෙනස් කිරීමට උපයෝගී කරගත හැකි යම් උපකරණයක්, සූත්‍රයක් හෝ යන්ත්‍රයක් ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා සාදන, තනන, ශ්‍රී ලංකාවට ආනයනය කරන, තම සන්තකයෙහි තබා ගන්නා සපයන හෝ පාවිච්චි කරන, නැතහොත් ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා එය සෑදීමට, තැනීමට, ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට, සැපයීමට හෝ පාවිච්චි කිරීමට සලස්වන ; හෝ

(1987 අංක 24 & 27)

(ඔ) මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක හෝ මේ පනතේ නවවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යටතේ තමා වෙත එවන ලද යම් අනන්‍යතා ප්‍රකාශ පත්‍රයක ඕනෑකමින්ම අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඕ) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක් හෝ යම් අනන්‍යතා ප්‍රකාශ පත්‍රයක් හෝ නවවන උපලේඛනයේ දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවල අර්ථානුකූලව වූ යම් ආවරණ ලියුම් කවරයක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන්‍යාකාරයකින් එය වෙනස් කරන නැතහොත් එයට අයුතු යමක් කරන,

සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතුය.

මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාට එරෙහිව යම් බලපෑමක්, සාහසිකකමක් හෝ අවහිරයක් කරන හෝ කරන බවට තර්ජනය කරන නැතහොත් තමා විසින් ම හෝ වෙන යම් කෙනෙකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාට එරෙහිව යම් ලෞකික හෝ අධ්‍යාත්මික පීඩාවක්, පිඩුවක්, හානියක් හෝ අලාභයක් කරන හෝ කරන බවට තර්ජනය කරන ; හෝ

(1987 අංක 24 & 27)

(2) පැහැරගෙන යාමෙන්, නීති විරෝධී බලකිරීමෙන් හෝ යම් වංචනික උපායකින් හෝ උපක්‍රමයකින් යම් ඡන්දදායකයකුට ඔහුගේ ඡන්දය බලය ඒ ඡන්ද විමසීමේ දී නිදහස් ලෙස පාවිච්චි කිරීමට බාධා පමුණුවන හෝ එසේ කිරීම වළක්වන නැතහොත් යම් ඡන්දදායකයකුට තම ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකීමට එමගින් බලකරන, පොළඹවන හෝ බලපෑමක් කරන ; හෝ

(1987 අංක 24 & 27)

(3) යම් ආගමික හෝ ආගමික සංවිධානයක යම් සාමාජිකයකු හෝ අනුගාමිකයකු ඒ ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකී සිටීමට පෙළඹවීම හෝ බල කිරීම සඳහා හෝ ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ යම් ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නැතහොත් ආධාර දීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන -

(අ) ඒ ආගමේ හෝ ආගමික සංවිධානයේ ඒ සාමාජිකයාට හෝ අනුගාමිකයාට හෝ ඒ සාමාජිකයාගේ හෝ අනුගාමිකයාගේ පවුලේ යම් සාමාජිකයකුට ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා සාමාන්‍යයෙන් කටයුතු කිරීමේ දී හිමිකම් ලබන යම් අධ්‍යාත්මික සේවාවක්, මෙහෙයක් හෝ ප්‍රතිලාභයක් ප්‍රතික්ෂේප කරන හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරන ; හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ ආගමෙන් හෝ ආගමික සංවිධානයෙන් බැහැර කරන හෝ බැහැර කරන බවට තර්ජනය කරන ඒ ආගමේ හෝ ආගමික සංවිධානයේ සාමාජිකයකු හෝ නිලධරයකු වන්නාවූ ;හෝ

(4) යම් තැනැත්තකුට යම් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ඡන්ද විමසීමේ දී යම් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දීමට හෝ අධාර දීමෙන් වැළකී සිටීමට පෙළඹවීම හෝ බලකිරීම සඳහා හෝ ඒ තැනැත්තා ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන නැතහොත් ඒ ඡන්දය විමසීමේදී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතකොටගෙන-

(1977 අංක 24 & 79)

(අ) ඒ තැනැත්තාගේ සේවා නියුක්තිය අවසාන කරන හෝ අවසාන කරන බවට තර්ජනය කරන ; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් එකී සේවා නියුක්තියෙහි සාමාන්‍යයෙන් යෙදීමේ දී එවකට භුක්ති විඳිමින් සිටි හෝ ඔහු විසින් භුක්ති විඳින්නට තිබුණු යම් ප්‍රතිලාභයක් හෝ සේවාවක් ඔහුට

ඒ තැනැත්තාගේ සේවායෝජකයා වන්නා වූ ; හෝ

(5) යම් ඡන්ද විමසීමක දී නාමයෝජනා දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිවම වූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ යම් වේලාවක -

(අ) ඒ ඡන්දය විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ හෝ ඒ ඡන්ද විමසීමේ දී පයම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධින කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස හෝ ඡන්දය දීමෙන් වැළකී සිටින ලෙස යම් ඡන්දදායකයකු පෙළඹවීමේ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් වචන පවසන්නා වූ ; හෝ

(1977 අංක 24 & 79)

(ආ) ඒ කාර්යය සඳහා, යම් ආගමික රැස්වීමක දී යම් අත් පත්‍රිකාවක් ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, සළකුණක්, ධජයක් හෝ පතාකයක් බෙදා හරින්නා වූ හෝ ප්‍රදර්ශණය කරන්නා වූ ; හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීමට අනුබල දීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත්නාවූ හෝ පැවැත්වීමට සලස්වන්නා වූ ,

සෑම තැනැත්තකුම අයුතු බලපෑමේ වරද කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

79,80 සහ 81 වන වගන්තිය මෙයින් ඉවත් කරනු

81අ.(1) ඡන්ද පොළක ඡන්ද විමසීමක් කරනු ලබන යම් දිනයක ඒ ඡන්ද පොළට ඇතුළු වන ස්ථානයේ සිට සැතපුමකින් හතරෙන් කොටසක දුරක් ඇතුළත කිසිම තැනැත්තකු විසින් පහත දැක්වෙන ක්‍රියාවලින් යමක් නොකළ යුතු ය-

(අ) ඡන්ද ආයාචනය කිරීම ;

(ආ) යම් ඡන්දදායකයකුගේ ඡන්දය ඉල්ලීම ;

"(1අ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක නාමයෝජනා කාලසීමාවේ පළමු දිනයෙන් ආරම්භ වන හා එම ඡන්ද විමසීමේදී ඡන්දය දෙනු ලබන දිනයට ඉක්බිතිව ම වූ දිනයෙන් අවසාන වන කාලසීමාව තුළ -

(අ) බලයේ සිටින දේශපාලන පක්ෂයෙන් තරග කරන යම් නිශ්චිත අපේක්ෂකයකුගේ වාසියට ඡන්දය දීමට ඡන්ද දායකයන්ට බලපෑමක් ඇතිවිය හැකි යම් ආණ්ඩුවේ ආයතනයක් හෝ රාජ්‍ය ව්‍යාපාරයක් තුළ අවශ්‍ය නොවන පත්වීම් ලබාදීම, නෙකල යුතු ය.

(ආ) ඡන්දය දීම පැවැත්වෙන අතරතුර හෝ ඡන්දය ගණන් කරනු ලබන අවස්ථාවේ දී කිසිදු අමාත්‍යවරයකු හෝ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකු විසින් ඡන්ද දායකයකු වශයෙන් හැර කිසිදු ඡන්ද පොළකට ඇතුළු නොවිය යුතු ය.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ විධිවිධානවලින්" යන වචන වෙනුවට "(1) හෝ (1අ) උපවගන්තිවල විධිවිධානවලින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ (5) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ විධිවිධාන" යන වචන වෙනුවට "(1) හෝ (1අ) උපවගන්තිවල විධිවිධාන" යන වචන අදේශ කිරීමෙන්.

"(ඈ) යම් ඡන්ද දායකයකු විසින් යම් අපේක්ෂකයකුට හෝ යම් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් ඡන්දය පාවිච්චි නොකරන ලෙස පෙළඹවීම."

(ඉ) ඡන්ද විමසීමට අදාලව (යම් නිල අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක් හෝ දැන්වීමක් නොවන) යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක් හෝ දැන්වීමක් හෝ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට 37 වැනි වගන්තිය යටතේ වෙන් කරන ලද යම් ලකුණක් බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම.

(2) යම් ඡන්ද පොළක ඡන්ද විමසීමක් කරනු ලබන යම් දිනයක කිසිම තැනැත්තකු විසින් ඡන්දය දීම සඳහා ඡන්ද පොළට පැමිණෙන යම් තැනැත්තෙකුට කරදරයක් වන සේ නැතහොත් ඡන්ද පොළෙහි සේවයේ යෙදී සිටින නිලධරයන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ වැඩට බාධා ඇති වන සේ,

(අ) ඡන්ද පොළක් ඇතුළත හෝ ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟ හෝ ඡන්ද පොළ අසල වූ යම් පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයකදී යම් මෙගපෝනයක හෝ ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ මිනිස් කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම සඳහා වූ වෙනත් උපකරණයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියාත්මක කිරීම හෝ නොකළ යුතුය.

(ආ) ඡන්ද පොළක් ඇතුළත හෝ ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟ හෝ ඡන්ද පොළ අසල වූ යම් පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයක දී කෑගැසීම හෝ වෙනත් අන්දමකින් නීතිවිරෝධී ලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය.

(2අ) (අ) යම් ඡනිද විමසීම් ප්‍රදේශයක යම් ඡන්ද විමසීමකදී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයකු වන කිසිම තැනැත්තකු විසින් එම ඡන්ද විමසීමේ දී, ඡන්ද විමසීම් පැවැත්වෙන දිනයේ, දී ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයා තෝරා පත් කර ගැනීමට අනුබල දීමේ යම් කාර්යයක් සඳහා ඒ අපේක්ෂකයාගේ සාමාන්‍ය වාසස්ථානය නොවන ඒ ප්‍රදේශයෙහි (තාවකාලික වූ හෝ අන්‍යාකාර) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් පාවිච්චි නොකළ යුතු ය ; නැතහොත්

(ආ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක දී නාමයෝජනා භාර ගැනීමේ කාලයේ පළමු දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේදී ඡන්ද විමසීම පැවැත්වෙන දිනයට ඉක්බිතිවම වූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, යම් වේලාවක යම් වර්ෂයක මැයි මස 1 වැනි දින පැවැත්වෙන පෙරහැරක් නැතහොත් ආගමික හෝ සාමාජීය කාර්ය සඳහා පැවැත්වෙන යම් පෙරහැරක් නොවන යම් පෙරහැරක් පවත්වා ගෙන යාම, පැවැත්වීම හෝ එයට සහභාගී වීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය. හෝ

(ඇ) මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් කාලය තුළ පවත්වනු ලබන හෝ මෙහෙයවනු ලබන යම් පෙරහැරක දී එකී (ආ) ඡේදයෙහි සඳහන් ඡන්ද විමසීමකට අනුබල දෙනු ඇතැයි සළකනු ලබන යම් ක්‍රියාවක් හෝ දෙයක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(3) (1) වන උප වගන්තියේ, (2) වැනි උපවගන්තියේ හෝ (2අ) වැනි උප වගන්තියේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(4)(2) වන උපවගන්තියේ විධිවිධාන කඩකිරීමක් වැළැක්වීම සඳහා පොලිස් නිලධරයකු විසින් යුක්ති සහගත ලෙස අවශ්‍ය වන පියවරක් ගැනීම හා බලය පාවිච්චි කිරීම කළ හැකි අතර, ඒ කඩකිරීම සඳහා පාවාච්චි කරන ලද යම් උපකරණයක් තහනමට ගැනීම ද ඔහු විසින් කළ හැකි ය.

(5) මේ වගන්තියෙහි සඳහන් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක්ම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූල සංඥේශය වරදක් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වරදක් සඳහා නඩුවක්, නීතිපතිවරයාගේ අනුමැතිය නොමැතිව නොපැවරිය යුතු ය.

81ආ. (1) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී නාමයෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භ වන හා ඒ ඡන්ද විමසීමේ දී ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම වූ දිනයෙන් අවසාන වන කාලසීමාව තුළ, ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකු තෝරා පත් කර පත් කර ගනු ලැබීමට අනුබල දීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින්-

(1963 අංක 9 & 17)
(1965 අංක 15 & 18)

(අ) ඒ ඡන්ද විමසීමේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයකු ගෙනයාම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක හැර පොදු හෝ පෞද්ගලික කිසිම ස්ථානයක යම් කොඩියක් හෝ පතාකයක් ; හෝ

(1963 අංක 9 & 17)

(ආ) ඒ ඡන්ද විමසීමේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කරනු ලැබූ යම් අපේක්ෂකයකුට ආධාර වශයෙන් යම් ස්ථානයක රැස්වීමක් පැවැත්වීමට ඇති යම් දිනයක ඒ ස්ථානය තුළ හෝ ඒ ස්ථානයෙහි හැර, මහජනයාට යාමට අයිතිවාසිකමක් ඇති හෝ ඉඩ දී ඇති යම් ස්ථානයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, හෝ සළකුණක් ; හෝ

(ඇ) යම් මහා මාර්ගයක් මත හෝ හරහා යම් අත් පත්‍රිකාවක් ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, සලකුණක්, කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයකු ගෙනයාම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක් තුළ හෝ වාහනයක හැර යම් වාහනයක් තුළ හෝ වාහනයක යම් අතු පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දුන්වීම් කොළයක්, දැන්වීමක් හෝ සළකුණක් ,

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කරන සැම තැනැත්තකුම වරදක් කරන අතර මහෝස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි සඳහන් වරදක් කිරීමට තැත් කරන සැම තැනැත්තකුම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ සැම වරදක්ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූල සංඥේය වරදක් විය යුතුය.

(5) (1) වැනි උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමක් වැළැක්වීම සඳහා පොලිස් නිලධරයකු විසින් යුක්ති සහගත ලෙස අවශ්‍ය වන පියවරක් ගැනීම හා බලය පාවිච්චි කිරීම කළ හැකි අතර ඒ කඩකිරීම සඳහා පාවිච්චි කරන ලද යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොලයක්, දැන්වීමක්, ලකුණක්, ධජයක් හෝ පතාකයක් තහනමට ගැනීම හා ඉවත් කිරීම ද, ඔහු විසින් කළ හැකි ය.

81ඇ. (1) ඡන්ද පොළට හෝ ඡන්ද පොළෙහි සිට යම් ඡන්දදායකයකු ගෙන යාමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින් යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, ණයට දීම, සේවයෙහි යෙදවීම, කුලියට ගැනීම, ණයට ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ කුලියට දීමට, ණයට දීමට, සේවයෙහි යෙදීමට, කුලියට ගැනීමට, ණයට ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දීම හා අනුබල දීම හෝ නොකළ යුතු ය.

(1963 අංක 9 & 17)

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කරන සැම තැනැත්තකුම වරදක් කරන අතර මහෝස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(1963 අංක 9 & 17)

(3) මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධානවල කුමක් සඳහන්ව ඇත්ද-

(අ) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තෙකුට ඔහු පදිංචි ස්ථානයේ සිට මුහුද හෝ මුහුදෙහි ශාඛාවක් හෝ මුහුදු කඩිත්තක් නැතහොත් ගංගාවක් හරහා නොගොස් තම ඡන්ද පොළ කරා එළඹිය නොහැකිවන අවස්ථාවක, ඔහුට ඡන්ද පොළ කරා ළගා වීමට හැකිවීම සඳහා ප්‍රවාහන ක්‍රමයක් පාවිච්චි කිරීම (1) වැනි උපවගන්තියේ විධිවිධාන කඩ නොකිරීමක් ලෙස සැලකිය යුතු ය;

(1963 අංක 9 & 17)

(1963 අංක 9 & 17)

(ආ) ලංකා ගමනාගමන මණ්ඩලය, ලංකා දුම්රිය සේවය හෝ කොළඹ මහ නගර සභාව මගින් සැපයෙන යම් මහජන ගමනාගමන සේවකයකින් ඡන්ද පොළට හෝ ඡන්ද පොළෙහි සිට හෝ තැනැත්තකු ඔහුගේම වියදමින් ප්‍රවාහනය කිරීම හෝ එසේ ප්‍රවාහනය කරනු ලැබීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් තමාගේ වියදමින් එබඳු සේවයක් පාවිච්චි කිරීම (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ නොකිරීමක් ලෙස සැලකිය යුතු ය.

ඡන්ද පොළට හෝ ඡන්ද පොළෙහි සිට ප්‍රවාහනය කිරීමට අදාළ විධිවිධාන.
(1965 අංක 15 & 20)

(ඇ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ තේරීම්භාර නිලධරයකු, ඒ ප්‍රදේශයේ යම් ඡන්ද විමසීමකදී ඡන්ද විමසීම සිදු කිරීමට ඇති දිනයට දින හතකට පෙර, ඔහුට ලැබෙන පරිදි (පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයකු නොවන) යම් තැනැත්තකු විසින්, ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් ශාරීරික දුර්වලතාවක් නිසා ඔහුට ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට පයින් හෝ මේ උපවගන්තියෙහි (ආ) ඡේදයෙහි සඳහන් යම් මහජන ප්‍රවාහන සේවයකින් හෝ යාමට ඒ තැනැත්තාට නොහැකි යැයි සෑහීමට පත් වූ අවස්ථාවක,ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට යාමේ කාර්යය සඳහා යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිත බලයක් ඒ තේරීම්භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි අතර, ඒ අනුව එසේ තමා ගෙන යාමේ කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට (1) වැනි උප වගන්තියෙහි විධිවිධාන කඩ කිරීමක් ලෙස සළකනු නොලැබිය යුතු ය.

(4) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් මේ අඥාපනත යටතේ පැවැත්වෙන යම් ඡන්ද විමසීමකදී (1) වැනි උපවගන්තියෙහි විධිවිධාන කඩකරමින් යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කරනු ලබන අවස්ථාවක යම් පොලිස් නිලධරයකු විසින් ඒ වාහනය, ජල යාත්‍රාව හෝ සතා නවත්වා තහනමට ගෙන පොලිස් ස්ථානයකට රැගෙන ගොස් ඡන්ද විමසීම අවසාන වන තුරු එහි රඳවාගත හැකිය.

(5) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට ඒ ක්‍රියාව කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු මරා රාජධානිය සතු විය යුතු යැයි ප්‍රකාශ කරමින් අධිකරණයක් විසින් ආඥාවක් කළ හැකි ය.

81ඇ. (1) යම් ප්‍රවෘත්ති පත්‍රයක -

(අ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී එම ඡන්ද විමසීමේ දී තරඟ කරන පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකුගේ කථාවල් හෝ කටයුතු සම්බන්ධයෙන් හෝ පිළිබඳ ; හෝ

(ආ) යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක ඒ

අපේක්ෂකයා විසින් ඒ ඡන්ද විමසීම පවත්වා ගෙන යාම හෝ එහි ලා වැරදි ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් හෝ පිළිබඳව ,

යම් අසත්‍ය ප්‍රකාශයක් පළ කරනු ලැබූ හා ඒ ප්‍රකාශය ඒ ඡන්ද විමසීමෙහි ප්‍රතිඵලය කෙරෙහි බලපෑ හැකිවන අවස්ථාවක දී, එසේ එය පල කරනු ලැබූ වේලාවෙහි ඒ ප්‍රවෘත්ති පත්‍රයෙහි අයිතිකරු, කළමනාකරු, සංස්කාරක,ප්‍රකාශක හෝ ,

වෙනත් එවැනි නිලධරයකුව සිටි හෝ එවැනි තත්ත්වයකින් ක්‍රියා කරනු ලැබුවේ යැයි කියනු ලබන සෑම තැනැත්තකු ම ඒ පළ කිරීම කරන ලද්දේ තමාගේ අනුමතය හෝ අනුදැනුම නොමැතිව බව සහ ඒ ත්ත්වයෙන් වූ ස්වකීය කටයුතුවල ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත්ව තමා විසින් යෙදිය යුතුව තිබුණු සියලු උද්යෝගය ඒ පළ කිරීම වැළැකිවීම සඳහා තමා විසින් යෙදන ලද බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ එක් එක් තැනැත්තා වරදක් කරන්නේ ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වරදක් කරන යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නො ඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට නැතහොත් ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "ප්‍රවෘත්ති පත්‍රය" යන යෙදුමට යම් සංග්‍රහයක්, සඟරාවක්, ප්‍රතිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ.

82. මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී එකම ඡන්ද විමසීටම් ප්‍රදේශයේ එකම කොට්ඨාසයේ දී හෝ වෙනත් ඡන්ද විමසීම් ප්‍රදේශවලදී හෝ යම් තැනැත්තකු විසින් එක් වරකට වඩා ඡන්දය දෙනු ලැබුවහොත් හෝ එසේ ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත් ඒ තැනැත්තා වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු එකක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

**"දූෂණ ක්‍රියා"**

82අ. (1) යම් ඡන්ද විමසීමක දී -

(අ) ජීවත්ව සිටින හෝ මියගොස් ඇති හෝ ව්‍යාජ පුද්ගලයකු වූ හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෞද්ගලිකව හෝ තැපෑලෙන් ඡන්දය දෙන ; හෝ

(ආ) තමාගේ ම නමින් හෝ නම යටතේ ඒ ඡන්ද විමසීමේ දී එක් වරකට වඩා ඡන්දය දෙන,

සෑම තැනැත්තකුම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥේශයේ වරදක් විය යුතු හොර ඡන්ද දීමේ වරදට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ) පෞද්ගලිකව ඡන්දය දීමේ කාර්ය සඳහා පත්‍රිකාවක් ඉල්ලුම් කොට ඇති ; හෝ

(ආ) තැපැල් ඡන්ද දායකයකු ලෙස සලකනු ලැබීමට ඉල්ලුම් කරන ඇති ; හෝ

බහු ඡන්දය දීම
(1977 අංක 24 & 84)

(ඇ) තැපෑපෙන් ඡන්දය දීමේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් වලංගු ලෙස හෝ නොඑසේ ම ලකුණු කොට ඒවා ඇති, තැනැත්තකු ඡන්දය දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

හොර ඡන්ද දීම

82ආ. මේ ආඥාපනත යටතේ ඡන්ද විමසීමකට පෙර, ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද විමසීමකින් පසු තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා උදෙසා හෝ ඒ තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ඡන්දය ඒ ඡන්ද විමසීමෙහි දී දීමට හෝ දීමෙන් වැළකී සිටීමට දූෂිත ලෙස බලපෑමේ කාර්ය සඳහා නැතහොත් ඒ ඡන්ද විමසීමෙහි දී එබඳු යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමට නැතහොත් ඡන්දය දීමෙන් වැළකීමට සූදානම්ව සිටීම නිසා ලෙ◌ින්ම හෝ අන් අයුරකින් යම් කෑමක්, බීමක්, අන්නපාපයක් හෝ ආහාර ද්‍රව්‍යයක් දෙන හෝ සපයන නැතහොත් දීමට හෝ සැපයීමට සලස්වන හෝ දීමෙහි හෝ සැපයීමෙහි ලා ආධාර දෙන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට සලස්වන නැතහොත් යම් කෑමක්, බීමක් අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබාගත හැකි වනු පිණිස යම් මුදලක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් ඉහත සඳහන් පරිදි දෙන හෝ සපයන නැතහොත් දීමෙහි හෝ සැපයීමෙහි ලා ආධාර වන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට පොරොන්දු වන සෑම තැනැත්තකුම සහ එවැනි යම් කෑමක්, බීමක් හෝ අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් නැතහොත් එවැනි යම් මුදලක් හෝ බලපත්‍රයක් දූෂිත ලෙස භාරගන්නා හෝ ලබාගන්නා හෝ නැතහොත් එවැනි යම් කෑමක් , බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබාගත හැකි වනු පිණිස එවැනි වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් යොදා ගන්නා සෑම ඡන්ද හිමියකුම සංග්‍රහ කිරීමේ වරදට වරදකරු විය යුතු ය.

සංග්‍රහ කිරීම

82ඇ. (1) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකී සිටීමට ඒ තැනැත්තා පෙළඹවීම හෝ ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ තැනැත්තා මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන කෙලින්ම හෝ අන් අයුරකින් තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඔහුට එරෙහිව යම් බලපෑමක්, සාහසික, නැතහොත් අවහිර කිරීමක් කරන හෝ කරන බවට තර්ජනය කරන හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඔහුට එරෙහිව යම් ලෞකික හෝ අධ්‍යාත්මික පීඩාවක් , පාඩුවක් , හානියක් , අලාභයක් පමුණුවන හෝ පමුණුවන බවට තර්ජනය කරන නැතහොත් පැහැර ගෙන යෑමෙන්, උත්තර්ජනය කිරීමෙන් හෝ යම් වංචනික උපායකින් හෝ උපක්‍රමයකින් යම් ඡන්ද හිමියකුට ඔහුගේ ඡන්ද බලය නිදහස් ලෙස පාවිච්චි කිරීමට බාධා පමුණුවන හෝ එසේ කිරීම වළක්වන නැකහොත් එවැනි යම් ඡන්ද විමසීමකට දී යම් ඡන්ද හිමියකුට තම ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට එමගින් බල කරන, පොළඹවන හෝ කැමති කරවන සෑම තැනැත්තකුම අයුතු

බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක නාමයෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ යම් වේලාවක ,

(අ) ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ඡන්දය දෙන ලෙස හෝ දීමෙන් වළකින ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීමේ කාර්ය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් වචන පවසන ; හෝ

අයුතු බලපෑම්

(ආ) ඒ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත්පත්‍රිකාවක්, ප්‍රදානපත්‍රයක්, දැන්වීම් කොළයක් , චිත්‍රයක් , දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, ලකුණක් ,සළකුණක්, කොඩියක් හෝ පතාකයක් බෙදාහරින හෝ ප්‍රදර්ශනය කරන ; හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට තෝරා පත් කර ගැනීම හෝ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ඡන්ද ව්‍යාපාරය හෝ ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට සලස්වන සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(3) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකී සිටීමට ආගමික, සංඝ්ඝීතියක හෝ සංවිධානයක යම් සාමාජිකයකු හෝ අනුගාමිකයකු පෙළඹවීම සඳහා හෝ ඔහුට බල කිරීම සඳහා, නැතහොත් ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන, හෝ ඔහු ඒ ඡන්ද විමසීමේ දී එවැනි යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන -

(අ) ඒ සාමාජිකයාට හෝ අනුගාමිකයාට හෝ ඒ සාමාජිකයාගේ හෝ අනුගාමිකයාගේ පවුලේ යම් සාමාජිකයකුට ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා සාමාන්‍යයෙන් කටයුතු කිරීමේ දී හිමිකම් ලබන යම් අධ්‍යාත්මික සේවාවක්, මෙහෙයක් හෝ ප්‍රතිලාභයක් ප්‍රතික්ෂේප කරන හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරන ; හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ ආගමික සංඝීතියේ හෝ සංවිධානයෙන් බැහැර කරන හෝ බැහැර කරන බවට තර්ජන කරන ආගමික අංස්ථීතියේ හෝ සංවිධානයේ යම් සංවිධානයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(4) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ඡන්ද විමසීමේ දී

යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්නාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකුගේ සේවායෝජයකු වන්නා වූ යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තා පෙළඹවීම සඳහා ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ වෙනත් තැනැත්තා ඒ ඡන්ද විමසීමෙහි දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ඡන්දය දී තිබීම,

හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන, හෝ ඔහු ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන -

(අ) ඒ වෙනත් තැනැත්තාගේ සේවා නියුක්තිය අවසන් කරහොත් හෝ අවසන් කරන බවට තර්ජනය කරහොත් හෝ ; නැතහොත්

(ආ) ඒ වෙනත් තැනැත්තා විසින් එකී සේවා නියුක්තියෙහි සාමාන්‍යයෙන් යෙදී සිටීමේ දී එවකටත් ඔහු භුක්ති විඳිමින් සිටි හෝ ඔහු විසින් භුක්ති විඳින්නට තිබුණු යම් ප්‍රතිලාභයක් හෝ සේවාවක් ඔහුට ප්‍රතික්ෂේප කරතහොත් හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරතහොත්,

ඒ සේවායෝජක අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතුය.

82ඇ. පහත සඳහන් තැනැත්තන් එනම් -

(අ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, ඡන්ද හිමියකු සඳහා නැතහොත් යම් ඡන්ද හිමියකු වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන, ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟ වන, හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඒ ඡන්ද හිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන ලෙස තැනැත්තකුම ;

(ආ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් නැළකී සිටීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, ඒ ඡන්ද හිමියා හෝ ඡන්ද හිමියා සඳහා හෝ යම් හිමයකු වෙනුවෙන් වෙනත් යම් තැනකට හෝ යම් තැනැත්තකු සඳහා නැතහොත් වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තකු සඳහා කෙලින්ම හෝ අන් අයුරකින් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තිකයක් දෙන හෝ ලබා දෙන නැතහොත් දීමට හෝ ලබා දීමට එකඟ වන හෝ ඉදිරිපිට වන හෝ පොරොන්දුවන හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද හිමියකු ඡන්ද විමසීමක දී ඡන්දය දී තිබීම හෝ දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන බහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකු ම ;

(ඇ) පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස යම් තැනැත්තකු පත් කර ගැනීම හෝ මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ලබාදීම හෝ සිදු කිරීමෙහි ලා උත්සාහ කිරීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා

වෙනුවෙන් වෙනත් යම් තැනැත්ත්කු මඟින් හෝ ඒ තැනැත්තා හෝ ඒ තැනැත්තා සඳහා කෙළින් හෝ අන් අයුරකින් ඉහත කී පරිදි එවැනි යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක් ,පොරොන්දුවක්, ලබාදීම හෝ එකඟවීමක් දෙන හෝ කරන සෑම තැනැත්තකු ම ;

(ඇ) එවැනි යම් තෑග්ගක් , ණයක් , යෝජනාවක් , පොරොන්දුවක්, ලබාදීමක් හෝ ගිවිසුමක් ලැබුණු විටක,නැතහොත් එවැනි යම් තෑග්ගක් , ණයක් , යෝජනාවක් , පොරොන්දුවක් ලබා දීමක හෝ ගිවිසුමක ප්‍රතිපලය වශයෙන්, පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස යම් තැනැත්තකු තෝරාපත් කර ගැනීම හෝ මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී යම් ඡන්ද හිමියකු හෝ ඡන්දය ලබාදීම සිදුකරන හෝ සිදු කිරීමෙහි යෙදෙන හෝ සිදු කිරීමෙහි ලා පොරොන්දු වන නැතහොත් උත්සාහ කරන සෑම තැනැත්තකුම ;

(ඉ) මේ ආඥාපනත යටතේ යටතේ වූ යම් ඡන්ද විමසීමක දී අල්ලස් වශයෙන් යම් මුදලක් හෝ එහි යම් කොටසක් වියදම් කළ යුතු ය යන චේතනාවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස ඒ මුදල හෝ එහි යම් කොටසක් කලින් දෙන, ගෙවන හෝ ගෙවීමට සළස්වන නැතහොත් ඒ ඡන්ද විමසීමේ දී අල්ලස් වශයෙන් වියදම් කරන ලද යම් මුදලක් සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් නිදහස් කිරීම හෝ ආපසු ගෙවීම සඳහා දැන දැනම යම් තැනැත්තකුට යම් මුදලක් ගෙවන හෝ ගෙවීමට සළස්වන සෑම තැනැත්තකුම ;

(ඊ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකට පෙර හෝ යම් ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර, ඒ ඡන්ද විමසීමේදී ඡන්දය දීම හෝ ඡන්දය දීමට එකඟවීම නැතහොත් ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට එකඟවීම හේතුකොටගෙන තමා සඳහාම හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා යම් මුදලක් , තෑග්ගක් , ණයක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් , නිලයක් , තනතුරක් හෝ සේවා නියුක්තියක් තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙලින්ම හෝ අනු අයුරකින් ලබාගන්නා හෝ ලබා ගැනීමට එකඟවන, හෝ ඒ සඳහා ගිවිසුමක් ඇති කර ගන්නා සෑම ඡන්ද හිමියකු ම ;

(උ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමකින් පසු ඒ ඡන්ද විමසීමේ දී යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නැතහොත් ඡන්දය දීමට හෝ ඡන්දය හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවා තිබීම හේතුකොටගෙන යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙලින්ම හෝ අන් අයුරකින් ලබා ගන්නා සෑම තැනැත්තකු ම ;

(ඌ) මේ ආඥාපනත යටතේ ඡන්ද විමසීමකදී යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීම හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමට එකඟ වීම හෝ ඡන්දය දීමට එකඟව සිටීම හේතුකොටගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන්, නැතහොත් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට සහය දී තිබීම හෝ සහාය වීමට එකඟව සිටීම හේතුකොටගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තැගි කරන ලෙස හෝ ණයට දෙන නැතහොත්

යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කිරීමට හෝ ණයට දීමට පොරොන්දු වන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් ලබා දෙන ලෙස නැතහොත් යම් නිලයක්,

තනතුරක් හෝ සේවා නියුක්තියක් ලබා දීමට පොරොන්දු වන ලෙස ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාමයෝජනා කරනු ලැබ ඇති යම් අපේක්ෂකයකු වෙත නැතහොත් ඔහුගේ නියෝජිතයා හෝ නියෝජිතයන් වෙත තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළින්ම හෝ අන් අයුරකින් ඉල්ලුම් කරන සෑම තැනැත්තකු ම ;

(එ) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී අපේක්ෂකයකු ලෙස නාමයෝජනා ලැබීමට හෝ අපේක්ෂකයා වීමෙන් වැළකී සිටීමට හෝ අපේක්ෂකයකු වී ඇත්නම් ඉල්ලා අස්වීමට හෝ එකඟ වන ලෙස වෙනත් යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින්ම හෝ තමා වෙනුවෙන් යම් තැනැත්තකු මගින් කෙළින්ම හෝ අන් අයුරකින් ඒ වෙනත් තැනැත්තාට යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දෙන හෝ ලබාදෙන හෝ යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දීමට එකඟ වන නැතහොත් ලබාදීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට ඉදිරිපත්වන හෝ පොරොන්දු වන නැතහොත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ ඒ වෙනත් තැනැත්තාට හෝ ඒ වෙනත් තැනැත්තා සඳහා හෝ හෝ ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන හෝ ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟ වන නැතහොත් ලබාදීම හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට ඉදිරිපත් වන හෝ පොරොන්දු වන සෑම තැනැත්තකු ම , අල්ලස් වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

82ඉ.(1)

(අ) හොර ඡන්ද දීමේ වරද සිදු කරන හෝ හොර ඡන්ද වරද සිදු කිරීමෙහි ලා ආධාර කරන, අනුබල දෙන, උපදෙස් දෙන හෝ ඒ වරද කිරීම සිදු කරවන ; හෝ

(ආ) සංග්‍රහ කිරීමේ, අයුතු බලපෑමේ හෝ අල්ලස් පිළිබඳ වරද සිදු කරන ; හෝ

(ඇ) මේ ආඥාපනත යටතේ ඡන්ද විමසීමකට පෙර හෝ ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා යම් අපේක්ෂකයකුගේ පෞද්ගලික චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් සිද්ධි පිළිබඳ වූ යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ පළ කරන ; හෝ

(ඈ) මේ ආඥාපනත යටතේ ඡන්දය විමසීමකට පෙර හෝ ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා ඒ ඡන්ද විමසීමේ යම් අපේක්ෂකයකු ඉල්ලා අස්වූ බවට යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ පළ කරන,

සෑම තැනැත්තකුම , දූෂණ ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, මේ උපවගන්තියේ

(අ) ඡේදයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට, බරපතල වැඩ ඇතිව මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා,බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකුම ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලයක් සඳහා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට හෝ ඒ වරදකරු කැනු ලැබීමේ හේතුවෙන් අශක්නුතාවට පත් විය යුතු අතර ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කර ලනු ලැබ සිටියේ නම්, ඔහුගේ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින සිට නිශ්ප්‍රභා විය යුතුය.

(3) දූෂණ ක්‍රියාවක් සඳහා වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

82ඊ. (1) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී සභිකයකු වශායන් තෝරා පත්කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයන් අතුරින් යම් නියෝජිතයකු විසින් හෝ ඡන්ද විමසීම සම්බන්ධයෙන් යම් දූෂණ ක්‍රියාවක් සිදු කරනු ලැබූ අවස්ථාවක , ඒ අපේක්ෂකයා මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ කල්හී, හොර ඡන්ද දීමේ වරද සම්බන්ධයෙන් වන විට මාස දොළහක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාළයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ඔහු යටත් විට යුතු ය.

එසේ වුව ද ඒ අපේක්ෂකයා විසින් -

(අ) ඡන්ද විමසීමේ දී තමා විසින් කිසිම දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු නොකරන ලද බව සහ එවැනි යම් වරදක් සිදු කර ඇත්තේ තමාගේ නියමයන්ට පටහැනිව හා තමාගේ අනුමතය හෝ දායකත්වය නොමැති බව ; හෝ

(ආ) ඡන්ද විමසීමේ දී දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා සිදු කිරීම වැළැක්වීම සඳහා තමා විසින් සියලු යුක්තිසහගත ක්‍රියාමාර්ග ගන්නා ලද බව ; හෝ

(ඇ) වෙනත් සියලු කරුණු සැළකිල්ලට ගනු ලැබූ විට, තමා විසින් හෝ තම නියෝජිතයන් විසින් සිදු කරන ලද කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකින් ඒ ඡන්ද විමසීම තොර වූ බව,

මහේස්ත්‍රාත්වරයාට ඔප්පු කරනු ලැබුවහොත්, ඔහුගේ නියෝජිතයන් අතුරින් යම් නියෝජිතයකු විසින් සිදු කරන ලද සංග්‍රහ කිරීමේ හෝ අයුතු බලපෑමේ වරදින් සමන්විත එවැනි දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් , ඒ අපේක්ෂකයා මේ වගන්තිය යටතේ වරදකරු කරනු නොලැබිය යුතු ය.

යම් ඡන්ද විමසීමක දී පරාජිත

(2) දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ සෑම තැනැතකුම , ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක

අපේක්ෂකයකු විසින් කරන ලද දූෂණ ක්‍රියාවන් සම්බන්ධයෙන් වූ දඬුවමට හා අශක්නුතාවට අදාළ විශේෂ විධිවිධාන.

කාලයක් සඳහා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ ආඥාපනත යටතේ වූ ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හෝ සභිකයකු ලෙස තෝරා පත්කර ගනු ලැබීමට හෝ ඒ වරදකරු කරනු ලැබීම හේතුවෙන් අශක්නුතාවට පත් විය යුතු අතර,

ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු එලෙස තෝරාගනු ලැබ සිටියේ නම් ඔහුගේ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින දිට නිශ්ප්‍රභා විය යුතුය.

(3) මේ ආඥාපනත යටතේ වූ විමසීමක දී සභිකයකු ලෙස තෝරා පත් කරගනු නොලැබූ යම් අපේක්ෂකයකුට විරුද්ධව නීතිපතිවරයාගේ අනුමතය ඇතිව හැර මේ වගන්තිය යටතේ වූ දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

(4) මේ ආඥාපනත යටතේ වූ ඡන්ද විමසීමක දී සභිකයකු ලෙස තෝරා පත් කර ගනු නොලැබූ අපේක්ෂකයකුට විරුද්ධව, ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ දූෂණ ක්‍රියාවකට 82ඉ වැනි වගන්තිය යටතේ නඩු පවරනු ලැබීම, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවක් නිවාරණය වෙතැයි හෝ වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය. නැතහොත් එසේ අර්ථ නිරූපනය කරනු නොලැබිය යුතු ය.

**නීති විරෝධී ක්‍රියා**

82 උ. (1) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී -

(අ) ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට ඡන්ද හිමියන් ගෙනයාම හේතුකොටගෙන කවර හෝ වර්ගයක වාහන හෝ ප්‍රවාහන සතුන් කුලියට ගැනිම සඳහා හෝ දුම්රිය ගාස්තු හෝ අන්‍යාකාරයකින් කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතුය . නැතහොත් ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇතිකර ගනු නොලැබිය යුතු ය ; නැතහොත්

(ආ) යම් ඇමතීම් පත්‍රිකාවක්, හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ගෙයක්, ඉඩමක් , ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම හේතුකොටගෙන නැතහොත් යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හේතුකොට ගෙන ඡන්ද හිමියකු කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය. නැතහොත් ඡන්ද හිමියකු සමග කිසිම ගිවිසුමකි ඇතිකර ගනු නොලැබිය යුතුය.

(2) මේ ආඥාපනත අනුව ඉඩදෙනු ලැබිය හැකි, යම් ව්‍යාතිරේකයකට යටත්ව, ඡන්ද විමසීමකට පෙර හෝ ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද විමසීමකින් පසුව හෝ මේ වගන්තියේ විධිවිධාන කඩකරමින්, දැන දැනම යම් ගෙවීමක් කරනු ලැබුවහොත්, නැතහොත් ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇතිකරගනු ලැබුවහොත්, ඒ ගෙවීම කළ හෝ ගිවිසුම ඇතිකර ගත් තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධාන කඩ කිරීමක් බව දැන දැනම ඒ ගෙවීම ලබන හෝ එවැනි යම් ගිවිසුමකට පාර්ශවකරුවකු වන යම් තැනැත්තකු ද නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(3) මේ ආඥාපනතින් හෝ ඒ යටතේ ඉඩදෙනු ලැබූ හෝ ඉඩදෙනු ලැබිය හැකි යම් ප්‍රකාශිත ව්‍යාතිරේකවලට යටත්ව, යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීම ආරම්භ වන වේලාවට එක් පැයකට

ඇතැම් වියදම් නීති විරෝධී ක්‍රියා විය යුතු බව.

පෙර එක් පැයකින් අවසන් වන්නා වූ ද ඒ ඡන්ද විමසීම් අවසන් කරන ලද වේලාවට පසු එක් පැයකින් අවසන් වන්නා වූ ද කාලය ඇතුළත යම් තැනැත්තකු විසින් ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයෙහි -

(අ) ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට ඡන්දදායකයන් ගෙන යාමේ කාර්යය සඳහා ; හෝ

(ආ)

(i) යම් නීත්‍යානුකූල කටයුක්තක් නැතහොත්

(ii) යම් නිල කටයුත්තක්, එනම් තමා විසින් දරනු ලබන හෝ කරනු ලබන හෝ කරගෙන යනු ලබන යම් නිලයක් සේවයකින් හෝ සේවා නියුක්තියකින් පැනනැගෙන්නා වූ හෝ කර්තව්‍යයක් ඉටු කිරීම පිණිස නොවන වෙනස් යම් කාර්යයක් සඳහා ,

යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, අතමාරුව දීම, සේවයෙහි යෙදවීම, කුලියට ගැනීම අතමාරුව ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීමට, අතමාරුව දීමට, සේවයෙහි යෙදවීමට , කුලියට ගැනීමට, අතමාරුව ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර හෝ අනුබල දීම හෝ කරනු නොලැබිව යුතු ය.

මේ උපවගන්තියෙහි විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) දැන්වීම් නියෝජිතයකු වශයෙන් ගාස්තු අයකර පත්‍රිකා හා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම ඡන්ද හිමියකුගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුත්ත වන අවස්ථාවක, ඒ ඡන්ද හිමියාට කරනු ලබන ගෙවීමක් හෝ ඔහු සමග ඇති කරගනු ලබන ගිවිසුමක් , ඒ ගෙවීම හෝ ගිවිසුම හෝ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී කරන ලද්දේ නම් හෝ ඇති කර ගනු ලැබුවේ නම්, මේ වගන්තියේ අර්ථානුකූලව එය නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ආ) ඡන්ද විමසීමක දී ඡන්ද හිමියන්ට ස්වකීය පදිංචි ස්ථානයෙහි සිට මුහුද හෝ මුහුදෙහි ශාඛාවක් හෝ මුහුදු කඩිත්තක් නැතහොත් ගංගාවක් හරහා නොගොස් තම ඡන්ද පොලවල් කරා ළඟාවිය නොහැකි වන අවස්ථාවක, ඒ ඡන්ද හිමියන්ගේ ඡන්ද පොළවල් කරා ඔවුන් මුහුදින් ගෙන යාම පිණිස හෝ ඔවුන්ගේ ඡන්ද පොළවලට ළඟාවීම සඳහා ඔවුන්ට ගඟින් එතෙර විය හැකි වනු පිණිස හෝ විධිවිධාන සලස්වනු ලැබිය හැකිය .

(ඇ) යම් මහජන ප්‍රවාහන සේවයකින් යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තකු තමාගේ ම වියදමින් ඡන්දය විමසන ස්ථානයට හෝ ඡන්දය විමසන ස්ථානයේ සිට යාමට සහ ඒමට හෝ නැතහොත් ඡනද් විමසන ස්ථානයේ සිට තමාට යාමේ සහ ඒමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් තමාගේ වියදමින් එබඳු සේවයක් පාවිච්චි කිරීම හෝ මේ වගන්තියෙහි අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ඈ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීමක් පත්වනු ලැබීමට ඇති දිනට දින හතකට පෙර ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා වූ තේරීම්භාර නිලධරයාට ලැබෙන පරිදි යම් තැනැත්තකු විසින්

හෝ ඒ තැනැත්තා වෙනුවෙන් අපේක්ෂකයකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ ලිඛිත ඉල්ලීමක් අනුව, යම් ශාරීරික දුර්වලතාවක් නිසා ඡන්ද විමසන ස්ථානයට සහ ඡන්ද විමසන ස්ථානයේ සිට පයින් හෝ ,මේ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම්,

මහජන ප්‍රවාහන සේවයකින් යාමට සහ ඒමට ඒ තැනැත්තාට නොහැකබවට තේරීම්භාර නිලධරයා සෑහිමට පත්වන අවස්ථාවක ඡන්ද විමසන ස්ථානයේ සිට යාමේ සහ ඒමේ කාර්යය සඳහා යම් වාහනයක්,

ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිත බලයක් ඒ තේරීම්භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට ලබා දිය හැකි අතර, ඒ අනුව එසේ තමාට යමේ සහ ඒමේ කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වාහනයක් ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීම මේ වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක පවත්වනු ලබන යම් ඡන්ද විමසීමක දී යම් පොලිස් නිලධරයකු විසින් ස්වකීය මෙහෙයවීමෙන් ම හෝ යම් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත පොලිස් නිලධරයකු විසින් පැවැත්විය යුතු යයි මෙයින් නියම කරනු ලබන විමර්ශනයකින් පසු හෝ යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු (1) වැනි උපවගන්තියේ හෝ (3) වැනි උපවගන්තියේ විධිවිධාන කඩකරමින් පාවිච්චි කරනු ලබන බවට ඒ පොලිස් නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ නිලධරයා විසින් ඒ වාහනය, ජල යාත්‍රාව හෝ සතා නවත්වා තහනමට ගෙන පොලිස් ස්ථානයට ගෙන ගොස් ඡන්දය විමසීම අවසන් වෙනතෙක් එහි රඳවා තබාගත යුතු ය.

(6) මේ වගන්තියෙහි අර්ථානුකූල වූ නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, ඒ ක්‍රියාව සිදුකිරීමෙහි ලා හෝ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු ජනරජය සතු කළ යුතු යයි ප්‍රකාශ කරමින් ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කළ හැකි ය.

82ඌ. (1) යම් අසත්‍ය ප්‍රකාශයක් -

(අ) මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඒ ඡන්ද විමසීම කරන යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ කණ්ඩායමක යම් අපේක්ෂකයකුගේ කථා හෝ කටයුතු සම්බන්ධයෙන් හෝ පිළිබඳ ; නැතහොත්

(ආ) ඒ අපේක්ෂකයා විසින් හෝ එවැනි යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඒ ඡන්ද විමසීම පවත්වාගෙන යාම හෝ එහි ලා කටයුතු කිරීම සම්බන්ධයෙන් හෝ පිළිබඳ,

යම් ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබූ හෝ යම් විද්‍යුත් මාධ්‍යයක් ඔස්සේ විකාශනය කරනු ලැබූ සහ ඒ ප්‍රකාශය ඒ ඡන්ද විමසිමෙහි ප්‍රතිඵල කෙරෙහි බල පෑ හැකි වන අවස්ථාවක දී එසේ පළ කරනු ලැබූ හෝ විකාශනය කරනු ලැබූ වේලාවෙහි ඒ ප්‍රකාශය පළකරනු ලැබූ ප්‍රවෘත්ති පත්‍රයෙහි හෝ ඒ අසත්‍ය ප්‍රකාශය විකාශනය කරනු ලැබූ සංස්ථාවෙහි හෝ බලපත්‍රලත් ගුවන්විදුලි හෝ රූපවාහිනී මධ්‍යස්ථානයෙහි අයිතිකරු, කලමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් සමාන නිලධරයකු නැතහොත් එවැනි තත්ත්වයෙන් ක්‍රියා කරනු ලැබුවේ යයි කියනු ලබන

එක් එක් තැනැත්තකුම , ඒ පළකිරීම හෝ විකාශනය කිරීම කරන ලද්දේ තමාගේ අනුමතය හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ඒ තත්ත්වයෙන් වළ ස්වකීය කටයුතුවල ස්වභාවය හා සියලු අවස්ථාගත කරුණු කෙරෙහි සැලකිලිමත්ව තමා විසින් ගත යුතුව තිබුණු සියළු උද්යෝග ඒ පළකිරීම හෝ විකාශනය වැළැක්වීම පිණිස තමා විසින් ගන්නා ලද බව ඒ තැනැත්තා නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියෙහි, "ප්‍රවෘත්ති පත්‍රය" යන යෙදුමට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශයක් ඇතුළත් වේ.

ප්‍රවෘත්ති පත්‍රවල හෝ විද්‍යුත් මාධ්‍යවල අසත්‍ය වාර්තා

82එ. (1) පහත දැක්වෙන කාර්යය සඳහා හෝ තත්ත්වයන්ගෙන් හැර, වෙනත් කවර හෝ කාර්යයත් සඳහා හෝ තත්ත්වයකින් කිසිම තැනැත්තකු ගෙවීම් ලැබීමට හෝ ගෙවීම ලබන පොරොන්දුව පිට, සේවයෙහි යොදා ගැනීමට හෝ නියුක්තිය කර ගැනීම මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමකට ආධාර දීමේ කාර්යය සඳහා නොකළ යුතු ය.

(අ) ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර එක් එක් ඡන්ද පොළ සඳහා වූ යම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත්වීම අවලංගු කිරීමට ඇතිවිය හැකි අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, ඒ එක් එක් ඡන්ද පොළ සඳහා එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානය සඳහා 60 වන වගන්තියේ සඳහන් කරනු ලැබූ ගණන් කිරීමේ නියෝජිතයන් ගණනකට නොවැඩි සංඛ්‍යාවක් ;

(ආ) ඡන්ද විමසීම් ප්‍රදේශයේ ප්‍රමාණය සහ ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ ඡන්ද හිමි නාමලේඛනයෙහි වූ ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව කෙරෙහි සැලකිලිමත් ව, ලිපිකරුවන් හා පණිවුඩකරුවන් යුක්තිසහගත සංඛ්‍යාවක් ;

(2) මේ ආඥාපනත අනුව ඉඩදෙනු ලැබිය හැකි යම් ව්‍යාතිරේකයකට යටත්ව ඡන්ද විමසීමකට පෙර, ඡන්ද විමසීමකින් පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද විමසීමකින් පසු මේ වගන්තියේ විධිවිධාන කඩකරමින් යම් තැනැත්තකු සේවයෙහි යොදා ඇතිනම් නැතහොත් සේවයෙහි නියුක්ත කර ඇත්නම්, ඔහු සේවයෙහි යොදාගත් නැතහොත් නියුක්ත කර ගත් තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

82ඒ. මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක් පිළිබඳසඳහන් වන එහෙත් මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකගේ නම් සහ ලිපිනය මුහුණතෙහි නොදැක්වෙන යම් ප්‍රචාරක දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් මුද්‍රණය කරන, පළකරන, බෙදාහරින හෝ ඇලවීමට සලස්වන අපේක්ෂකයකු හෝ ඔහුගේ නියෝජිතයකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වීය යුතුය.

82ඔ. (1) නීති විරෝධී ක්‍රියාවක් සිදු කළ සෑම තැනැත්තකුම ඔහු මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් තුන් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට පළාත් පාලන ආයතන සභිකයකු ලෙස තෝරාපත් කර ගනු ලැබීමට, ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන්, අශක්නුතාවට පත් විය යුතු අතර ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු පළාත් පාලන ආයතන සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබ

සිටියේ නම්, ඔහුගේ ඒ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින සිට නිෂ්ප්‍රභ නිය යුතු ය.

(2) නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

ඡන්ද විමසීම ප්‍රකාශන මුද්‍රණය කිරීම ආදිය

82ඕ. (1) මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී පළාත් පාලන ආයතන සභිකයකු වශයෙන් තෝරාපත් කර ගනු නොලැබූ යම්,අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයන්ගෙන් කිසිවකු විසින් හෝඒ ඡන්ද විමසීම් සම්බන්ධයෙන් යම් නීති විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, ඒ අපේක්ෂකයා රුපියල් තුන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය;

එසේ වුවද ඒ අපේක්ෂකයා විසින් -

නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට දඬුවම.

(අ) ඒ ඡන්ද විමසීමක දී තමා විසින් කිසිදු දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු නොකරන ලද බව සහ නඩු පැවරීමට විෂය කරුණු ඇති නීති විරෝධී ක්‍රියාව සිදු කර ඇත්තේ තමාගේ විධානවලට පටහැනිව හා තමාගේ අනුදැනුම හෝ අපසහායකත්වය නොමැති බව ; සහ

(ආ) ඒ ඡන්ද විමසීමේ දී දූෂණණ හා නීති විරෝධී ක්‍රියා සිදු කිරීම වැළැක්වීම සඳහා තමා විසින් යුක්ති සහගත ක්‍රියාමාර්ග ගන්නා ලද බව ; සහ

(ඇ) ඒ නීති විරෝධී ක්‍රියාව සංයුක්ත වන වරද හෝ වැරදි, සුළු නොවැදගත් හා සීමිත ස්වභාවයේ වරදක් හෝ වැරදි බව ; සහ

(ඈ) ඒ වෙනත් සියලු කරුණු සැලකිල්ලට ගනු ලැබූ විට තමා විසින් හෝ තම නියෝජිතයන් විසින් සිදු කරන ලද කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකින් ඒ ඡන්ද විමසීම තොර වූ බව මහේස්ත්‍රාත්වරයාට ඔප්පු කරනු ලැබුවහොත්, ඔහුගේ නියෝජිතයන් අතුරෙන් යම් නියෝජිතයකු විසින් සිදු කරන ලද එවැනි නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අපේක්ෂකයා මේ වගන්තිය යටතේ වරදකරු කරනු නොලැබිය යුතු ය.

යම් ඡන්ද විමසීමක දී පරාජිත අපේක්ෂකයකු විසින් කරන ලද නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ දඬුවසට හා අශක්නුතාවට අදාළ විශේෂ විධිවිධාන.

(2) නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකුම , ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හෝ පළාත් පාලන ආයතන සභිකයකු ලෙස තෝරාපත් කර ගනු ලැබීමට හෝ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් අශක්නුතාවට පත් විය යුතු අතර ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු පළාත් පාලන ආයතන සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබ සිටියේ නම් ඔහුගේ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබූ දින සිට නිශ්ප්‍රභ නිය යුතු ය.

(3) මේ ආඥාපනත යටතේ වූ ඡන්ද විමසීමක දී , සභිකයකු ලෙස තෝරාපත් කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකුට විරුද්ධව මේ වගන්තිය යටතේ වූ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමැතිය ඇතිව හැර පවරනු නොලැබිය යුතු ය.

(4) මේ ආඥාපනත යටතේ වූ ඡන්ද විමසීමක දී සභිකයකු ලෙස තෝරා පත්කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකුට විරුද්ධව ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවකට 82ඔ වන වගන්තිය යටතේ නඩු පවරනු ලැබීම, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවක් නිවාරණය වෙතැයි හෝ වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය. නැතහොත් එසේ අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

82ක. 77,78,81අ,81ආ,82,82අ,82ආ,82ඇ,82ඈ,82උ,82ඌ,82එ සහ 82ඒ යන වගන්තිවල නිශ්චිතව සඳහන් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු ඒ වරද සඳහා නියමිත යම් දණ්ඩනයකට අතිරේකව ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා යම් පළාත් පාලන ආයතනයකට තෝරා පත්කර ගනු ලැබීමට හෝ එහි අසුන් ගැනීමට හෝ පළාත් පාලන ආයතනයේ සභිකයකු වශයෙන් ඡන්දය දීමට හෝ නුසුදුස්සකු කරනු ලැබිය යුතු ය.

7. මෙහි පහත දැක්වෙන අලුත් කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ 82ක වගන්තියට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ IV .අ කොටස ලෙස බලපැවැත්විය යුතු ය :-

## IV අ වන කොටස

### ඡන්ද පෙත්සම්

82ග. (1) අපේක්ෂකයකු පළාත් පාලන ආයතන සභියකු ලෙස තෝරා පත් කරගනු ලැබීම, යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකට ඔහු වරදකරු වීම නිසා නිෂ්ප්‍රභ වන්නේ ය.

(2) පළාත් පාලන ආයතන සභිකයකු වශයෙන් යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම නිෂ්ප්‍රභ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ පළාත් පාලන ආයතනයේ අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට ඔහු නුසුදුස්සකු වන්නේ ය.

82ච. (1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද විමසීම ඡන්ද පෙත්සමක දී මැතිවරණ විනිශ්වයකාරවරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබිය හැකි පහත සඳහන් හේතු අතුරෙන් යම් හේතුවක් නිසා නිශ්ප්‍රභ කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. එනම් :-

(අ) සාමාන්‍ය අල්ලස, සාමාන්‍ය සංග්‍රහ කිරීම හෝ සාමාන්‍ය බිය ගැන්වීම් නැතහොත් වෙනත් විෂමාචාරයක් හෝ මින් පෙර වෙන වෙනම සඳහන් කර ඇති අවස්ථානුගත කරුණු වලට සමාන වෙන හෝ නොවන වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොටගෙන, ඡන්ද හිමියන්ගේ යම් කොටසක්, ඔවුන් වඩා කැමැත්ත දැක්වූ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයාට ඡන්දය දීමෙන් වැළැක්වුණු බව සහ එමගින් ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි සෑහෙන බලපෑමක් ඇති කළ බව පෙනී ගියහොත්, ඡන්ද විමසීම සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුතින් IV අ කොටස ඇතුළත් කිරීම.

(2) යම් අපේක්ෂකයකු යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීම ඡන්ද පෙත්සමක දී මැතිවරණ විනිශ්වයකාරවරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබිය හැකි පහත සඳහන් හේතු අතුරින් යම් හේතුවක් නිසා, නිශ්ප්‍රභ කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

අපේක්ෂකයකු

වරදකරු වීම නිසා නිශ්ප්‍රභ වීම.

එනම් :-

(අ) අපේක්ෂකයා විසින් නැතහොත් ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ අපේක්ෂකයාගේ යම් නියෝජිතයකු විසින් හෝ ඡන්ද විමසීම සම්බන්ධයෙන් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු කරන බද බව ;

ඡන්ද පෙත්සමක් සත ඡන්ද විමසීම නිශ්ප්‍රභ වීම.

(ආ) අපේක්ෂකයා විසින් යම් තැනැත්තකු ඡන්ද ආයාචකයකු හෝ නියෝජිතයකු හෝ කථා පවත්වන්නකු ලෙස සේවයෙහි යොදවා ගැනීමට පෙර සත් අවුරුද්දක් ඇතුළත ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ නීතිය යටතේ හෝ ජනමත විචාරණ පිළිබඳ නීතිය යටතේ හෝ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව යටතේ හෝ මේ ආඥාපනත යටතේ හෝ නිසි බලය ඇති අධිකරණයක් විසින් හෝ මැතිවරණ විනිශ්චයකාරවරයකුගේ වාර්තාව කරනු ලැබ සිටි බව දැන දැනම ඒ තැනැත්තා පෞද්ගලිකව සේවයෙහි යොදවා ගැනීම.

(ඇ) යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින් තමා සම්බන්ධයෙන් ප්‍රජා අශක්නුතා නියම කර ඇත්තා වූ ද ඒ යෝජනා සම්මතයෙහි නියම කර ඇති එකී පුජා අශක්නුතා කාලසීමාව ඉකුත් වී නොමැති වූ ද තැනැත්තකු බව දැන දැනම ඒ තැනැත්තා ඡන්ද ආයාචකයකු හෝ නියෝජිතයකු හෝ ඔහු වෙනුවෙන් කථා කිරීම සඳහා අපේක්ෂකයකු විසින් පෞද්ගලිකව සේවයෙහි යොදා ගැනීම ;

(ඇ) තෝරා පත් කර ගනු ලැබූ වේලාවෙහි අපේක්ෂකයකු පළාත් පාලන ආයතන සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුස්සකුව සිටි තැනැත්තකු බව,

65. ප්‍රධාන ප්‍රඥප්තියේ 82ජ වගන්තිය එහි සඳහන් " යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා මේ ආඥපනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමකට අදාළ ඡන්ද පෙත්සමක්" යන වචන වෙනුවට " යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාසයක් සඳහා මේ ආඥාපනත යටතේ පවත්වන ලද ඡන්ද විමසීමකට අදාළ ඡන්ද පෙත්සමක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

82ට. පහත සඳහන් තැනැත්තන්ගෙන් යම් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් ගණනක් විසින් මහාධිකරණය වෙත ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යත එනම් :-

(අ) ඒ ඡන්ද විමසීමේදී යම් කොට්ඨාසයක් සඳහා තේරී පත් වූ බව ප්‍රකාශ කරනු ලැබීම හෝ තෝරා පත්කර ගනු ලැබීමට අයිතිවාසිකමක් තිබූ බවට හිමිකම් පාන යම් තැනැත්තේක් ;

(ආ) ඒ ඡන්ද විමසීමේදී යම් කොට්ඨාසයක් සඳහා අපේක්ෂකයකු වී සිටියේ යයි කියා සිටින යම් තැනැත්තෙක් ;

82ඩ. පෙත්සම්කරු හිමිකම් ලබා සිටිය හැකි පහත දැක්වෙන සහන සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඡන්ද පෙත්සමකින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය . එනම් :-

(අ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාසයක් හා සම්බන්ධ ඡන්ද විමසීම අවලංගු බවට වූ ප්‍රකාශයක් ;

(ආ) තෝරා පත් කර ගනු ලැබූ යම් තැනැත්තකු තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබීම අයථා බවට වූ ප්‍රකාශයක් ;

(ඇ) යම් අපේක්ෂකයකු යථා පරිදි තෝරා පත් කර ගනු ලැබූ බවට හා ඔහු තේරී පත් වූ බව ප්‍රකාශ කරනු ලැබීමට තිබුණු බවට වූ ප්‍රකාශයක් ,

ප්‍රධාන ප්‍රඥප්තියේ 82ජ වගන්තිය සංශෝධනය කිරීම.

82ණ. (1) ඡන්ද පෙත්සමක පෙත්සම්කරුවකු විසින් -

පෙත්සමක් ඉදිරිපත් කළ හැක්කේ කවරකු විසින් ද යන වග.

(අ) තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබූ අපේක්ෂකයන් සියලු දෙනාගේ ම හෝ ඔවුන් අතුරින් යම් අපේක්ෂකයකුගේ හෝ තෝරා පත් කර ගැනීම අවලංගු බව හෝ අයථා බව කියා සිටීමට අමතරව තමා ම හෝ වෙනත් යම් අපේක්ෂකයා හෝ යථා පරිදි තෝරා පත් කර ගනු ලැබූ බව වැඩිදුරටත් ප්‍රකාශයක් කරන ලෙස තම ඡන්ද පෙත්සම මගින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක , පෙත්සම්කරු හැර තරඟ කළ සියලුම අපේක්ෂකයන් සහ එවැනි වැඩිදුරටත් වූ ප්‍රකාශයක් කරන ලෙස ඉල්ලා සිටිනු නොලැබූ අවස්ථාවක, තේරී පත් වූ ලෙස ප්‍රකාශ කරනු ලැබූ සියලුම අපේක්ෂකයන් ; සහ

(ආ) යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් තම පෙත්සමෙහි චෝදනා කර ඇත්තේ වෙනත් යම් අපේක්ෂකයකුට හෝ තැනැත්තකුට විරුද්ධව ද ඒ අපේක්ෂකයා හෝ තැනැත්තා, තම පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස එක් කරනු ලැබිය යුතු ය.

හිමිකම් පෑ හැකි සහන.

(2) ඒ වනවිටත් ඡන්ද පෙත්සමක වගඋත්තරකරුවකු නොවන්නා වූ යම් අපේක්ෂකයකුට තත් කාර්යය සඳහා ඔහු විසින් මැතිවරණ විනිශ්වයකාරවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, ඒ පෙත්සමෙහි වගඋත්තරකරුවකු වශයෙන් එක් කරනු ලැබීමට හිමිකම් තිබිය යුතු ය ;

එසේ වුව ද මැතිවරණ විනිශ්වයකාරවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ඇපයක් ගාස්තු වෙනුවෙන් තබනු ලැබුවහොත් මිස, මේ වගන්තියෙහි ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම අපේක්ෂකයකුට සිය මෙහෙයවීමෙන් ම ඒ පෙත්සමෙහි වගඋත්තරකරුවකු වශයෙන් එක් කරනු ලැබීමට හිමිකම් නොතිබිය යුතු ය.

82ත. (අ) මේ ආඥාපනතේ 82ට වැනි වගන්තිය යටතේ පෙත්සමක් ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට ඇති අයිතිවාසිකම ඡන්ද පෙත්සමක් සඳහන් විය යුතු ය;

පෙත්සමක පාර්ශවකරුවෝ.

(ආ) ඡන්ද විමසීම පැවැත් වූ බව සහ එහි ප්‍රතිඵලය ඡන්ද පෙත්සමක සඳහන් විය යුතු ය.

(ඇ) පෙත්සම්කරු විශ්වාසය තබා සිටින වැදගත් කරුණු පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් ඡන්ද පෙත්සමක ඇතුළත් විය යුතු ය.

(ඈ) යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු කරන ලදැයි කියනු ලබන පාර්ශ්වකරුවන්ගේ නම් හා ඒ ක්‍රියාව සිදු කරන ලද දිනය හා ස්ථානය පිළිබඳ හැකිතාක් දුරට වූ සවිස්තර ප්‍රකාශයක් ද ඇතුළුව , පෙත්සම්කරු චෝදනා කර සිටින ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාව පිළිබඳ සම්පූර්ණ විස්තර ඡන්ද පෙත්සමක දැක්විය යුතු අතර ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාව පිළිබඳ චෝදනාව හා එය සිදු කරන දිනය හා ස්ථානය සනාථ කිරීම පිණිස නියමිත ආකෘතියෙහි වූ දිවුරුම් පත්‍රයක් ද ඒ ඡන්ද පෙත්සම සමඟ විය යුතු ය ;

එසේ වුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින් පෙත්සමෙහි ලා සාක්ෂි සඳහන් කළ යුතු බවට නියම වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය, නැතහොත් එසේ අර්ථ නිරූපනය කරනු නොලැබිය යුතු ය.

82ද. (1) පෙත්සම පිළිබඳ සාධාරණ හෝ සාර්ථක විභාගයක් පවත්වනු ලැබීම තහවුරු කර ගැනීම පිණිස, තමාගේ මතය අනුව අවශ්‍ය විය හැකි යම් ආකාරයට, ගාස්තු සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ සුදුසු යයි තමා සලකන යම් නියම මත, ඡන්ද පෙත්සමක සඳහන් යම් දූෂණ හෝ නීතිවිරෝධී ක්‍රියාවක් පිළිබඳ විස්තර සංශෝධනය කිරීමට හෝ විවර්ධනය කිරීමට මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් ඉඩදෙනු ලැබිය හැකි ය. එහෙත් කරන ලදැයි පෙත්සමෙහි කලින් චෝදනා කර නොමැති යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් පිළිබඳ විස්තරය අලුතෙන් ඇතුළත් කිරීම ඒ සංශෝධනයේ හෝ විවර්ධනය කිරීමේ ප්‍රතිඵලය වන්නේ නම් ඒ සංශෝධනය කිරීමට හෝ විවර්ධනය කිරීමට ඔහු විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(2) සෑම ඡන්ද පෙත්සමක් ම හැකිතාක් ඉක්මනින් විභාග කරනු ලැබිය යුතු අතර, ඒ පෙත්සම ඉදිරිපත් කරන ලද දිනයෙන් පසු මාස හයක කාලයක් ඇතුළත එහි විභාගය අවසන් කිරීමට සෑම උත්සාහයක් ම දරනු ලැබිය යුතු ය. ඒ පෙත්සම පිළිබඳ විභාගය අවසන් කරන ලද දිනට පසු අයුතු ප්‍රමාදයකින් තොරව ඒ පෙත්සම පිළිබඳ තීරණය දෙමින් මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් ස්වකීය ආඥාව කළ යුතු ය.

82න. ඡන්ද පෙත්සමක් පිළිබඳ විභාගය අවසානයේ දී , පැමිණිලි කරනු ලැබුවේ යම් සභිකයකු තේරී පත් වූ බවට ප්‍රකාශ කිරීම හෝ ඔහු තෝරා පත් කරගැනීම සම්බන්ධයෙන් ද ඒ සභිකයා යථා පරිදි තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබී ද යන වග නැතහොත් වෙනත් යම් තැනැත්තකු පරිදි තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබුවේ නම් හෝ තෝරා පත් කර ගනු ලැබුවේ නම් ඒ කවරකු ද යන වග එසේ නැතහොත් තෝරා පත්කර ගැනීම අවලංගු වන්නේ ද යන වග මැතිවරණ විනිශචයකාරවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර ඒ නිශ්චය කිරීම ඔහු විසින් ලිඛිතව සහතික කරනු ලැබිය යුතු ය.

මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ක්‍රියා කරනු ලැබීම පිණිස ඒ සහතිකය මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා භාරයේ තබනු ලැබිය යුතු ය.

82ප. ඡන්ද පෙත්සමක් පිළිබඳ විභාගය අවසානයේ දී මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් -

(අ) ඡන්ද විමසීමේ දී යම් අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හා කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයා විසින් හෝ යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු කර ඇතැයි ඔප්පු කර ඇති බව හෝ ඔප්පු කර නොමැති බව සහ එවැනි යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් වී නම්, එහි ස්වභාවය දැක්වෙන ; හා

(ආ) යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරුවන් බව විභාගයේ දී ඔප්පු කරනු ලැබූ යම් තැනැත්තන් වෙතොත් ඔවුන් සියලුදෙනාගේ ම නම් හා විස්තර දැක්වෙන, වාර්තාවක් ද පිළියෙළ කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද ඡන්ද පෙත්සමකට පාර්ශ්වකරුවකු නොවන නැතහොත්

මැතිවරණ විනිශ්චයකාරවරයා ගේ නිශ්චය කිරීම.

අපේක්ෂකයකු නොවන යම් තැනැත්තකුට විරුද්ධව මේ වගන්තිය යටතේ මැතිවරණ විනිශ්චයකාරවරයකු විසින් වාර්තා කරනු ලැබීමට පෙර,එසේ ඒ තැනැත්තාට විරුද්ධව වාර්තා නොකළ යුත්තේ මන්දැයි දැක්වීම පිණිස කරුණු කියා පෑමට සහ සාක්ෂි දීමට හා සාක්ෂි කැඳවීමට, මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් ඔහුට අවස්ථාවක් ලබා දිය යුතුය .

ඒ වාර්තාව මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ක්‍රියා කරනු ලැබීම පිණිස මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා භාරයේ තබනු ලැබිය යුතු ය.

82ඛ. (1) (අ) මැතිවරණ විනිශ්චයකාරවරයකු විසින් 82න වැනි වගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමකින් ; හෝ

(ආ) මැතිවරණ විනිශ්චයකාරවරයකු විසින් කරන ලද වෙනත් යම් තීරණයකින් හෝ ආඥාවකින්,

අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය කලින් ලබාගෙන ඒ අවසරය ඇතිව ශේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ කරන අභියාචනය සඳහා අවසර ඉල්ලීම් වලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වැනි ව්‍යයස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, ශේෂ්ඨාධිකරණය වෙත, අභියාචනය කිරීමේ විශේෂ අවසරය සඳහා වූ ඉල්ලීමකට අදාළ ව ඒ ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබ තිබෙන රීති, මේ වගන්තිය යටතේ කරන ලද සෑම අභියාචනයක් සඳහා අවසර ඉල්ලීමක් සම්බන්ධයෙන් ම අදාළ විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කළ යුතු අතර හැකිතාක් දුරට ඒ අධිකරණයේ වෙනත් කටයුතුවලට මත්තෙහි ඊට ප්‍රමුඛත්වය දෙනු ලැබිය යුතු ය. එක් එක් ඉල්ලීමක් විභාග කිරීම සහ එහි ලා සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි අධිකරණය විසින් සලකන සියලු විධාන, අධිකරණය විසින් දෙනු ලැබිය හැකි ය.

(4) මේ කොටස යටතේ අභියාචනය කිරීම පිණිස අවසරය සඳහා වූ යම් ඉල්ලීමක දී හෝ යම් අභියාචනයක දී පෙනී සිටීමට හෝ නියෝජනය කරනු ලැබීමට නීතිපතිවරයාට හිමිකම ඇත්තේ ය.

82ම. (1) ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු විය හැකි සියලුම ගාස්තු අයකිරීම් හා වියදම් ගෙවීම සඳහා 82ඛ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී හෝ ඊට පසු දින තුනක් ඇතුළත, ඉල්ලුම්කරු වෙනුවෙන් ඇප තබනු ලැබිය යුතු ය.

(2) ඇපය රුපියල් දස දහසකට නොඅඩු මුදලක් විය යුතු ය. මේ වගන්තියෙන් නියමිත ඇපය, මුදල් තැන්පත් කිරීමකින් තැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි වූ ඇපය ඉල්ලුම්කරු විසින් නොතබන ලද්දේ නම් ඒ ඉල්ලීම පිළිබඳ වැඩිදුර නඩු කටයුතු කිසිවක් කරනු නොලැබිය යුතු අතර, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙසත්, වගඋත්තරකරුගේ ගාස්තු ගෙවන ලෙසත් විධාන කෙරෙන ආඥාවක් සඳහා වගඋත්තරකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. ඒ ඉල්ලීම විභාග කිරීමේ හා තීරණය කිරීමේ ගාස්තු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආඥා කරනු ලබන පරිදි ගෙවනු ලැබිය

යුතු අතර එබඳු ආඥාවක් කරනු නොලැබූ විට ඒ ගාස්තු අභියාචනයේ සාමාන්‍ය ගාස්තුවල කොටසක් විය යුතු ය.

(4) ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු ගාස්තු , අය කිරීම් හා වියදම් ගෙවීම සඳහා වූ ඇපය වශයෙන් මුදල් තැන්පත් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ මුදල ගෙවීමෙන් කරනු ලැබිය යුතු ය. තව ද මේ වගන්තිය මගින් ඇප නියමිතව ඇත්තේ යම් කාර්ය සඳහා ද ඒ කාර්ය සඳහා තැන්පත් මුදල අග්‍රවිනිශ්චයකාරවරයා වෙත පැවරී තිබිය යුතු අතර ඒ කාර්ය සඳහා කලින් කළ ඔහු විසින් ඉන් මුදල් ලබා ගත යුතු ය.

ඉල්ලීමක ගාස්තු ආදිය වෙනුවෙන් ඉල්ලුම්කරු විසින් තිබිය යුතු ඇපය.

(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් සම්බන්ධිත සියලු පාර්ශ්වකරුවන්ගේ පරිගණකය සඳහා පොතක් විවෘතව තබා ගත යුතු අතර ඒ පොතෙහි ඒ මුදලෙහි ප්‍රමාණය ද ඒවා අදාළ වන ඉල්ලීම ද කලින් කල ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(6) එසේ තැන්පත් කරන ලද මුදල ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු ගාස්තු, අයකිරීම් හා වියදම් ගෙවනු ලැබීම සුරක්ෂිත කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් හා නොවන විට අග්‍රවිනිශ්චයකාරවරයාගේ ආඥාව පරිදි ආපසු ගෙවීම හෝ යුක්තිය ඉටුවීම පිණිස අවශ්‍ය වන පරිදි අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

(7) ආඥාවක් සඳහා ඉල්ලුම් කිරීමේ අදහස දැනුම් දීමෙන් පසුව හා සියලු සාධාරණ හිමිකම්පෑම් පියවා ඇති බව හෝ ඒ හිමිකම්පෑම සම්බන්ධයෙන් අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නියම කළ හැකි පරිදි අන්‍යාකාරයෙන් ප්‍රමාණවත් විධිවිධාන සළසා ඇති බව ඔප්පු කිරීමෙන් පසුව, ඒ ආඥාව කරනු ලැබිය හැකි ය.

(8) ඒ මුදල තැන්පත් කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවකුගේ නමින් ද ඒ පාර්ශ්වකරුට හෝ එය ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ ගෙවීම කරන මෙන් ඒ ආඥාවෙන් විධාන කළ හැකි ය.

82ය. (1) අභියාචනය සඳහා අවසර දෙනු ලැබූ විට, විභාග කරනු ලැබීමට තිබෙන අභියාචන ලැයිස්තුවෙහි ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් එම පෙත්සම ඇතුළත් කළ යුතු අතර අභියාචනයට විෂය වී ඇති කාරණය, අදාළ පාර්ශ්වකරුවන්ට වැඩිපුර දැනුම්දීමකින් තොරව ,අග්විනිශ්චයකාරවරයා වීසින් ඒ රෙජිස්ට්රාර්වරයා වෙත කරන ලද විධානවලට අනුකූලව, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු තිදෙනෙකුගෙන් සමන්විත මඩුල්ලක් ඉදිරියේ විභාගයට ගත යුතු ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ ඒ අභියාචනයේ යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට, අදාළ අනිකුත් පාර්ශ්වකරුවන් වෙත සාධාරණ දැනුම්දීමකින් පසුව, අභියාචනයේ ගාස්තු සම්බන්ධයෙන් යෝග්‍ය යයි අධිකරණය කල්පනා කරන නියමයක් මත, ඒ අභියාචන විභාගය ඉක්මන් කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනය විභාගය සඳහා ගනු ලැබූ විට, අභියාචනය තහවුරු කිරීම සඳහා අභියාචක කියා සිටින කරුණුවලට සහ වගඋත්තරකරුවන් අභියාචනයට එරෙහිව කියා සිටින කරුණු වලට සවන් දෙනු ලැබිය යුතු ය.

82අඅ. (1) අභියාචනය අදාළ වන්නේ මැතිවරණ විනිශ්චයකාරවරයාගේ නිශ්චය කිරීමක් හෝ තීරණයක් සම්බන්ධයෙන් ද, ඒ නිශ්චය කිරීම හෝ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, අභියාචනයේ පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් පසු ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි ය.

අභියාචනය විභාග කිරීම.

(2) 82න වගන්තිය යටතේ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් කරන ලද නිශ්චය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනයේ දී ප්‍රතිවර්තනය කරනු ලබන අවස්ථාවක ඡන්ද පෙත්සමෙහි පැමිණිලි කරනු ලැබුවේ යම් සභිකයකු තේරී පත් වළ පවට ප්‍රකාශ කිරීම හෝ ඔහු තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ද ඒ සභිකයා යථා පරිදි තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබීම ද හෝ තෝරා පත් කර ගනු ලැබී ද යන වග නැතහොත් තෝරා පත් කර ගැනීම අවලංගු වීතේ ද යන වග ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබීම යුතු අතර, ඒ තීරණය පිළිබඳ සහතිකයන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යම් අභියානයක් අදාළ වන්නේ යම් ඡන්ද පෙත්සමක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද පෙත්සම සම්පූර්ණයෙන් ම හෝ ඒ අධිකරණය විසින් සඳහන් කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් අලුතෙන් විභාග කළ යුතු යයි ආඥා කළ හැකි අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය සුදුසු යයි කල්පනා කරන යම් විධාන දෙනු ලැබිය හැකි ය.

(4) අභියාචනයෙහි ගාස්තු සම්බන්ධයෙන් ද ඡන්ද පෙත්සම ඉදිරිපත් කිරීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ ආනුෂංගික නඩු කටයුතුවල ගාස්තු සම්බන්ධයෙන් ද ශ්‍රේෂ්ඨාධිකරණය සාධාරණ යයි සලකන යම්ආඥාවක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබිය හැකි අතර, ඒ ආඥාව මගින් ම ගාස්තු සම්බන්ධයෙන් මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් කරන ලද යම් ආඥාවක් ප්‍රතිවර්තනය කිරීම හෝ එය වෙනස් කිරීම ද කරනු ලැබිය හැකි ය. තව ද ශ්‍රේෂ්ඨාධිකරණයේ ගාස්තු ප්‍රදානය කිරීම, තක්සේරු කිරීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රීති සෑදිය හැකි ය.

සහතිකය සහ වාර්තාව ජනාධිපතිවරයා වෙත යැවීම.

82අආ. (1) මැතිවරණ විනිශ්චයකාරවරයකු විසින් 82 න වගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වූ ඉල්ලීම මෙහි මින් පෙර දක්වා ඇති කාලය ඇතුළත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ඒ අධිකරණයේ සහතිකය, 82ප වගන්තිය යටතේ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් පිළියෙළ කරන ලද වාර්තාව ද සමග ඒ විනිශ්චයකාරවරයා විසින් ජනාධිපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) 82බ වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, 82න වන වගන්තිය යටතේ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් නිකුත් කරන ලද සහතිකය, 82ප වගන්තිය යටතේ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් පිළියෙළ කරන ලද වාර්තාව ද සමග, ඒ මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යවනු ලැබිය යුතු ය.

(3) මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් කරන ලද නිශ්චය කිරීම අභියාචනයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රවර්තනය කරනු ලැබූ අවස්ථාවක, 82අඅ වගන්තිය යටතේ නිකුත් කරනු කරන ලද ඒ අධිකරණයේ තීරණය පිළිබඳ සහතිකය-

(අ) 82ප වගන්තිය යටතේ මැතිවරණ විනිශ්චයාකරවරයා විසින් පිලියෙළ කරන ලද වාර්තාව කෙරෙහි අභියාචනයේ තීරණය බලපා නොමැති බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන්නේ නම්, ඒ වාර්තාව ; හෝ;

සහතිකයේ ප්‍රතිඵලය

(ආ)82ප වගන්තියේ විධිවිධාන අනුව ඒ වගන්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිලියෙළ කරන ලද වාර්තාවක් අවශ්‍යා යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන්නේ නම් ඒ වාර්තාව ,හා සමග ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

82අඇ. 82අආ වගන්තියෙන් නියමිත පරිදි මැතිවරණ විනිශ්චයකාරවරයකුගේ නිශ්චය කිරීම පිළිබඳ සහතිකය හෝ ශ්‍රේෂ්ඨාධිකරණායේ තීරණය පිළිබඳ සහතිකය ජනාධිපතිවරයා වෙත යවනු ලැබූ විට අවස්ථාවෝචිත පරිදි, ඒ නිශ්චය කිරීම හෝ තිරණය බලාත්මක විය යුතු අතර ඒ අනුව -

(අ) තේරී පත් වූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත්කර ගැනීම හෝ ස්ථිර කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) තේරී පත් වූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත්කර ගැනීම, අවස්ථාවෝචිත පරිදි, ඒ නිශ්චය කිරීමට හෝ තීරණයට අනුකූලව වෙනස් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ඇ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ ඡන්ද විමසීම බලරහිත යයි ප්‍රකාශ කළ යුතු බව ඒ නිශ්චය කිරීමේ හෝ තීරණයේ ප්‍රතිඵලය වන අවස්ථාවක, ඒ සහතිකය තමා වෙත ලැබී එක් මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින්, ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා ඡන්ද විමසීමක් පවත්වන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

82අඇ. (1) (අ) 82අආ වගන්තිය යටතේ තමා වෙත එවන ලද මැතිවරණ විනිශ්චයකාරවරයාගේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව ලැබුණු විට ජනාධිපතිවරයා විසින් වාර්තාවේ පිටපතක් ගැසට් පත්‍රයෙහි වහාම පළකරනු ලැබීමට සැලැස්විය යුතු ය;

සහතිකය සහ වාර්තාව ජනාධිපතිවරයා වෙත යැවීම.

(ආ)

(i) යම් තැනැත්තකු විසින් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු කර ඇති බව (අ) ඡේදයෙහි සඳහන් වාර්තාවෙන් පැවසෙන අවස්ථාවක, එකී වාර්තාවේ සඳහන් දිනයෙහි ඒ තැනැත්තා ඒ ක්‍රියාව සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ සිටියේ නම් යටත් වන අශක්නුතාවලට ම ඔහු යටත් විය යුතු ය. තව ද ඡන්ද පෙත්සමට විෂය වූ ඡන්ද විමසීම් හා සම්බන්ධ යම් නාමයෝජනා පත්‍රයකින්, ඒ තැනැත්තාගේ නම තේරීම්භාර නිලධරයා විසින් කපාහරිනු ලැබිය යුතු ය.

(ii) ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාව ඡන්ද විමසීමක දී අපේක්ෂකයකුව සිටි තැනැත්තකුගේ දැනුම හා කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයා විසින් සිදු කරන ලද බව (අ) ඡේදයෙහි සඳහන් වාර්තාවෙන් පැවසෙන අවස්ථාවක, ඒ තැනැත්තා ද ඉහත කී අශක්නුතාවලට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කර ලද සෑම වාර්තාවක්ම අප්‍රමාදව පරීක්ෂාවෙන් කියවා බැලීම සහ ඡන්ද විමසීමක දී ඡන්දය දීමට නුසුදුස්සකුව සිටින බව වාර්තාවෙන් පෙනී යන සෑම තැනැත්තකුගේම නම ඡන්ද හිමි නාමලේඛනයෙන් අප්‍රමාදව ඉවත් කිරීම සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකුගේම කාර්යය විය යුතු ය.

සහතිකයේ ප්‍රතිඵලය

82අඉ. (1) ඡන්ද විමසීමේ ප්‍රතිඵල ගැසට් පත්‍රයෙහා පළකරනු ලැබූ දින සිට දින විසි එකක් ඇතුළත මෙම ආඥාපනත යටතේ වූ සෑම ඡන්ද පෙත්සමක් ම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද තේරී පත් වූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත් කර ගැනීම දූෂණ හෝ නීති විරෝධි ක්‍රියාවක් හේතුකොටගෙන විවාදයට භාජනය කරන හා යම් සභිකයකු තෝරාපත් කර ගැනීම විවාදයට භාජනය කරනු ලැබී ද ඒ සභිකයා විසින් හෝ සභිකයාගේ නියෝජිතයකු විසින් නැතහොත් සභිකයාගේ සම්බන්ධතාව ඇතිව හෝ ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාව ප්‍රකාර හෝ ඊට ආධාර වශයෙන් ඉහත කී දිනයෙන් පසු මුදල් ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාවක් (ඇ) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාශයක් සම්බන්ධයෙන් වූ ඡන්ද විමසීම බලරහිත යයි ප්‍රකාශ කළ යුතු බව ඒ නිශ්චය කිරීමේ හෝ තීරණයේ ප්‍රතිඵලය වන අවස්ථාවක, ඒ සහතිකය තමා වෙත ලැබී එක් මාසයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින්, ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා ඡන්ද විමසීමක් පවත්වන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

82අඈ. (1) (අ) 82අආ වගන්තිය යටතේ තමා වෙත එවන ලද මැතිවරණ විනිශ්චයකාරවරයාගේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව ලැබුණු විට ජනාධිපතිවරයා විසින් වාර්තාවේ පිටපතක් ගැසට් පත්‍රයෙහි වහාම පළකරනු ලැබීමට සැලැස්විය යුතු ය;

(ආ) (i) යම් තැනැත්තකු විසින් දූෂණ හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු කර ඇති බව (අ) ඡේදයෙහි සඳහන් වාර්තාවෙන් පැවසෙන අවස්ථාවක, එකී වාර්තාවේ සඳහන් දිනයෙහි ඒ තැනැත්තා ඒ ක්‍රියාව සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ සිටියේ නම් යටත් වන අශක්නුතාවලට ම ඔහු යටත් විය යුතු ය. තව ද ඡන්ද පෙත්සමට විෂය වූ ඡන්ද විමසීම් හා සම්බන්ධ යම් නාමයෝජනා පත්‍රයකින් , ඒ තැනැත්තාගේ නම තේරීම්භාර නිලධරයා විසින් කපාහරින් ලැබිය යුතු ය.

(iii) ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාව ඡන්ද විමසීමක දී අපේක්ෂකයකුව සිටි තැනැත්තකුගේ දැනුම හා කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයා විසින් සිදු කරන ලද බව (අ) ඡේදයෙහි සඳහන් වාර්තාවෙන් පැවසෙන අවස්ථාවක, ඒ තැනැත්තා ද ඉහත කී අශක්නුතාවලට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කර ලද සෑම වාර්තාවක් ම අප්‍රමාදව පරීක්ෂාවෙන් කියවා බැලිය සහ ඡන්ද විමසීමක දී ඡන්දය දීමට නුසුදුස්සකුව සිටින බව වාර්තාවෙන් පෙනී යන සෑම තැනැත්තකුගේ ම නම ඡන්ද හිමි නාමලේඛනයෙන් අප්‍රමාදව ඉවත් කිරීම සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

82අඉ. (1) ඡන්ද විමසීමේ ප්‍රතිඵල ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ දින සිට දින විසි එකක් ඇතුළත මෙම ආඥාපනත යටතේ වූ සෑම ඡන්ද පෙත්සමක් ම ඉදිරිපත් කරනු ලැබිය ය.

එසේ වුව ද තේරී පත් වූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරා පත් කර ගැනීම දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් හේතුකොටගෙන විවාදයට භාජනය කරන හා යම් සභිකයකු තෝරා පත්කර ගැනීම විවාදයට භාජනය කරනු ලැබී ද ඒ සභිකයා විසින් හෝ සභිකයාගේ නියෝජිතයකු විසින් නැතහොත් සභිකයාගේ සම්බන්ධතාව ඇතිව හෝ ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාව ප්‍රකාර හෝ ඊට ආධාර වශයෙන් ඉහත කී දිනයෙන් පසු මුදල් ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාවක් සිදු කරන ලදැයි,

නිශ්චිත ම කියා සිටින ඡන්ද පෙත්සමක්, ඒ දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවට සම්බන්ධ වන තාක් ප්‍රමාණයට ඒ ගෙවීම කරන ලද හෝ ක්‍රියාව සිදු කරන ලද දිනයෙන් පසු දින විසිඅටක් කවර හෝ වේලාවක ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) තේරී පතු වූ බව ප්‍රකාශ කිරීම හො තෝරා පත් කර ගැනීම දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදුකරන ලද බවට වූ චෝදනාවක් මත විවාදයට භාජනය කිරීමේ කාර්යය සඳහා නියමිත කාලය ඇතුළත ඉදිරිපත් කරන ලද ඡන්ද පෙත්සමක් , තේරීපත් වූ බව ප්‍රකාශ කිරීම හෝ තෝරාපත් කර ගැනීම දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදුකරන ලද බවට වූ හේතුව මත විවාදයට භාජනය කළ හැකි වන්නේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඇතුළත මැතිවරණ වි නිශ්චයාකාරවරයාගේ අවසරය ඇතිව, සංශෝධනය කරනු ලැබිය හැකි ය.

82අඊ. යම් ඡන්ද විමසීමක දී ඡන්දය දී ඇති කිසිම තැනැත්තකුට, ඔහු විසින් ඡන්දය දෙනු ලැබුවේ කවර පිළිගත් දේශපාලන පක්ෂයට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමට ද යන වග ප්‍රකාශ කිරීමට, ඒ ඡන්ද විමසීම විවාදයට භාජනය කරන යම් නඩු කටයුත්තක දී, නියම කරනු නොලැබිය යුතු ය.

82අඋ. යම් ඡන්ද විමසීමක දී ඡන්දය දෙන කිසිදු ඡන්දදායකයකු හට එම ඡන්ද විමසීම ප්‍රශ්න කරනු ලබන යම් නඩු කටයුත්තක දී ඔහු විසින් ඡන්දය දෙනු ලැබුවේ කවර අපේක්ෂකයකුටද යන්න ප්‍රකාශ කිරීම සඳහා නොකළ යුතු ය.

82අඌ. මේ ආඥාපනත යටතේ ඡන්ද පෙත්සම් පිළිබඳ කාර්යය පටිපාටිය හා පරිචය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සාදන ලද රීතිවලට අනුකූලව විය යුතු ය.

82අඑ. 63 වැනි වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කළ යුතු ද නැද්ද යන්න පිළිබඳව ගණන් කිරීමේ නිලධරයකු විසින් කරන ලද තීරණය ඡන්ද පෙත්සමක දී විවාදයට භාජනය කරනු නොලැබිය යුතු ය.

82අඒ. මේ ආඥාපනත යටතේ ඡන්ද විමසීමක් හා සම්බන්ධ ඡන්ද පෙත්සමක් විභාග කිරීමේ දී ඒ ඡන්ද විමසීමේදී අපේක්ෂකයකු, ඔහුගේ නියෝජිතයන් මගින් සංග්‍රහ කිරීමේ හෝ අයථා බලපෑමේ වරදට හෝ ඒ ඡන්ද විමසීමට අදාළව යම් නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වී ඇති බව, මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් වාර්තා කරනු ලැබුවා වූ සහ කරුණු කියා සිටීමට නීතිපතිවරයාට අවස්ථාවක් දීමෙන් පසුව, ඒ අපේක්ෂකයා විසින් -

ඡන්දය දුන් ආකාරය හෙළිකිරීම තහනම් බව.

(අ) ඒ ඡන්ද විමසීමේ දී ඒ අපේක්ෂකයා විසින් කිසිදු දූෂිත හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු නොකරන ලද බව සහ එකී වාර්තාවේ සඳහන් කර ඇති වැරදි සිදු කරන ලද්දේ ඒ අපේක්ෂකයාගේ අණට පටහැනිව සහ අනුමතියෙන් හෝ අපසහයකත්වයෙන් තොරව බව ;

සහ

අනාවරණය කිරීමට එරෙහි තහනම.

(ආ) ඒ ඡන්ද විමසීමේ දී දූෂණ හා නීති විරෝධී ක්‍රියා සිදු කිරීම වැළැක්වීම පිණිස තමා විසින් සියලු යුක්තිසහගත ක්‍රියාමාර්ග ගන්නා ලද බව ; සහ

(ඇ) එකී වාර්තාවේ සඳහන් කර ඇති වැරදි, සුළු නොවැදගත් හා සීමිත ස්වභාවයේ වැරදි බව ; සහ

(ඈ)වෙනත් සියලු කරුණු සැලකිල්ලට ගනු ලැබූ විට, ඒ ඡන්ද විමසීම, ඒ අපේක්ෂකයා විසින් හෝ ඔහුගේ නියෝජිතයන් විසින් සිදු කරන ලද කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකින් තොර වූ බව,

අධිකරණයට ඔප්පු කර ඇති බව මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් වැඩිදුරටත් වාර්තා කරනු ලැබුවා වූ අවස්ථාවක, ඒ අපේක්ෂකයා තෝරා පත්කර ගැනීම ඒ වාර්තාවේ සඳහන් කර ඇති වැරදි හේතුවෙන්, නිෂ්ප්‍රභ නොවිය යුතු අතර, ඒ අපේක්ෂකයා, මේ ආඥාපනත යටතේ කිසිදු අශක්නුතාවකට පාත්‍ර නොවිය යුතු ය.

82අඔ. ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් -

(අ)ඡන්ද විමසීමකදී අපේක්ෂකයකුගේ හෝ ඔහුගේ යම් නියෝජිතයන්ගේ හෝ වෙනත් තැනැත්තකුගේ හෝ ක්‍රියාවක් නැතහොත් නොකර හැරීමක්, මේ වගන්තිය නිසා නොවේ නම් මේ ආඥාපනත උල්ලංඝනය වන පරිදි වූ ගෙවීමක්, සේවයේ යොදවා ගැනීමක්, සේවයේ නියුක්ත කිරීමක් හෝ ගිවිසුමක් වීමේ හේතුවෙන්, නැතහොත් මේ ආඥාපනතේ කවර හෝ විධිවි ධානයක් අනායාකාරයකින් උල්ලංඝනය කිරීමක් වීමේ හේතුවෙන්, නීති විරෝධී ක්‍රියාවක් විය හැකිය තිබුණු බව ; සහ

(ආ) එවැනි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අනවධානය හෝ අහඹු අයථා ගණනය නැතහොත් ඒ සමාන ස්වභාවයක වෙනත් යම් සාධාරණ හේතුවක් නිසා උද්ගත වූ බව සහ කිසිසේත් ම සද්භාවයෙන් තොරවීමක් නිසා උද්ගත නොවූ බව,

84ඇ. (1) 70 වන උපවගන්තියේ සඳහන් යම් පාඨශාලාවක් හැර වෙන යම් ස්ථානයක් ඡන්ද පොළක් ලෙස පාවිච්චි කිරීමේ කාර්යය සඳහා අවශ්‍යා බව කොමසාරිස්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ ස්ථානයෙහි නියම සන්තකය දරන තැනැත්තා වෙත භාර දෙනු ලබන, නැතහොත් එබඳු නියම සත්තකය දරන තැනැත්තකු නොමැති අවස්ථාවක ඒ ස්ථානයෙහි අයිතිකරු වෙත භාර දෙනු ලබන ලිඛිත නියමයක් මගින් තත් කාර්යය සඳහා ඒ ස්ථානය අත්කර ගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ස්ථානයක් අත්කර ගනු ලබන අවස්ථාවක, අත්කර ගැනීමේ කාලසීමාව සති හතරකට වැඩි නොවිය යුතු ය.

(3) මේ වගන්තියෙහි "ස්ථානය" යන්නෙන් යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් අදහස් කෙරෙන අතර, පැලක්, මඩුවක් / හෝ ඉදිකිරීමක් හෝ එහි යම් කොටසක් ද ඊට ඇතුළත් වේ.

අහිංසක ක්‍රියාවක් නීති විරෝධී ක්‍රියාවක් වීමෙන් බැහැර කිරීමට අධිකරණයට ඇති

84ඇ.(1) 84ඇ වැනි වගන්තිය යටතේ යම් ස්ථානයක් අත්කර ගනු ලැබූ

බලය. අවස්ථාවක, ඒ අත්කර ගැනීමට පෙරාතුව ම ඒ ස්ථානයේ නියම සන්තකය දැරූ තැනැත්තාට හෝ එබඳු නියම සන්තකයක් දැරූ තැනැත්තකු නොමැති අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරුට,තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් ඒ අත්කරගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් වන්දි ගෙවිය යුතු අතර, ඒ අත්කර ගත් කාලසීමාව තුළ ඒ ස්ථානයට සිදුවූ යම් අලාභයක් වේ නම් එය ද පියවිය යුතු ය.

(2) යම් ස්ථානයක් සම්බන්ධයෙන් (1) වැනි උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය පහත සඳහන් කරුණු ගැන සලකා බලා නිශ්චය කළ යුතු ය.

(අ)ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු කුලිය හෝ එසේ ගෙවිය යුතු කුලියක් නොමැති අවස්ථාවක, ප්‍රදේශයෙහි ඒ හා සමාන ස්ථානයකට ගෙවිය යුතු කුලිය ; සහ

(ආ)ඒ ස්ථානය අත්කර ගන්නා විට ඒ ස්ථානයෙහි නියම සන්තකය දැරූ තැනැත්තාට ඒ ස්ථානය අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ස්වකීය පදිංචි ස්ථානය හෝ ව්‍යාපාර ස්ථානය වෙනස් කරන ලෙස නියම වූයේ නම්, ඒ වෙනස කිරීමට ආනුෂංගික වූ යම් සාධාරණ වියදමක් වේ නම්, ඒ වියදම

(3) මේ වගන්තිය යටතේ වන්දි ලැබීමට හිමිකම් ලත්යම් තැනැත්තකු වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තිමත් වූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් ආයාචනයක් කළ හැකිය. එවැකි ආයාචනයක් ඉදිරිපත්කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් බේරුම්කරුවකු පත් කළ යුතු අතර ඒ ආයාචනය නිශ්චය කිරීම සඳහා ඔහු වෙත පැවරිය යුතු ය. ඒ ආයාචනය සම්බන්ධයෙන් බේරුම්කරුගේ නිශ්චය අවසානාත්මක විය යුතු ය.

ස්ථානයක් අත්කර ගැනීම සඳහා වන්දි ගෙවීම.
(1965 අංක 15 & 23)

85. ප්‍රකාශිතවම අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති විටෙක හැර, පළ කරන ලෙස මේ ආඥාපනතින් නියමිත සෑම දැන්වීමක්ම-

(අ) ඉංග්‍රිසි භාෂාවෙන් කරන ලද පරිවර්තනය සමඟ සිංහල සහ දෙමළ භාෂාවෙන් විය යුතුය.

(ආ) ඒ ප්‍රදේශයෙහි පළාත්පාලන ආයතනයේ කාර්යාලයේ ප්‍රදර්ශනය කළ යුතු අතර එයට ප්‍රසිද්ධිය ලබා දීමෙහි ලා වඩාත්ම සුදුසු යයි එය පළ කිරීමේ වගකීම භාර නිලධරයා විසින් සලකනු ලබන වෙනත් ආකාරයකින් ද එය පළ කළයුතු ය.

85.අ. මේ ආඥාපනත යටතේ යම් බලධරයකු විසින් ප්‍රදර්ශනය කරන ලද යම් දැන්වීමක් හෝ පරීක්ෂා කිරීම සඳහා මේ ආඥාපනතට අනුකූලව තබා ඇති යම් ලේඛනයක් නිත්‍යානුකූල බලය නොමැතිව විනාශ කරන, විච්ඡේදනය කරන විරූප කරන හෝ ඉවත් කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

86. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක එක් එක් කොට්ඨාසයක ඡන්ද හිමි නාමලේඛනය පිළියෙල කිරීමේ දී ද, යම් පළාත් පාලන ආයතනයක යම් ඡන්ද විමසීමක කාර්යය සඳහා අපේක්ෂකයන් නම් කිරීම සම්බන්ධයෙන් ද, මේ ආඥාපනත යටතේ දරන ලද සියලු වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

87. මේ ආඥාපනත යටතේ යම් අධිකරණයක් විසින් නියම කරනු ලබන සියලුම දඩ මුදල් අයකර ගනු ලැබූ විට, ඒ අධිකරණය විසින් ඒවා ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

දැන්වීම් පළ කිරීම.

89.* පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ආඥාපනතෙහි-

“උපලේඛනය” යන්නෙන් මේ ආඥාපනතේ උපලේඛනයක් අදහස්වේ.
“කොමසාරිස්වරයා” යන්නෙන් මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ.

“තත් කාලයෙහි බල පවත්නා පාර්ලිමේන්තු මැතිවරණ නාම ලේඛනය” යන්නෙන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව යටතේ තත් කාලයෙහි බලපවත්නා යම් ඡන්ද හිමි නාමලේඛනයක් අදහස් වේ.” “තරුණයා” යන්නෙන් 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ක්‍රියාත්මකව පවත්නා ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ වූ වර්ෂයේ ජූනි මස පළමුවන දිනට වයස අවුරුදු දහ අටට අඩු නොවූ ද මේ ආඥාපනත යටතේ පැවැත්වෙන සහ අදාළ තැනැත්තා අපේක්ෂකයෙකු වීමට ඉදිරිපත්ව සිටින ඡන්ද විමසීම සඳහා නාමයෝජනා පත් භාර ගැනීමේ කාලසීමාවේ අවසාන දිනයට වයස අවුරුදු තිස් පහට වැඩි නොවූ ද තැනැත්තෙක් අදහස් වේ.”

ඡන්ද විමසීම්වල වියදම්.

“රාජ්‍ය සංස්ථාව” යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියෙක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනයයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක් , මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස්වේ.

“රාජ්‍ය ආයතන” යන්නට, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තුමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක් මගින් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ යම් ආයතනයක්, පළාත් පාලන ආයතනයක්, රජයට පවරා ගත් යම් වෙළෙඳ ව්‍යාපාරයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද, රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් සියයට පනහකට වැඩි කොටස් දරන්නා වූ ද, යම් සමාගමක් ද ඇතුළත් වේ.

“ප්‍රාදේශීය සභා ප්‍රදේශය” යන්නෙන්, ප්‍රාදේශීය සභා පනතේ අර්ථානුකූලව යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් අදහස් වේ.

“දිස්ත්‍රික්කය” යන්නෙන් පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ.

“නගරය” යන්නෙන්, නගර සභා ආඥාපනතේ අර්ථානුකූලව යම් නගරයක් අදහස් වේ.

“නියමිත දිනය” යනනෙන් 1947 පෙබරවාරි මස 10 දිනය අදහස්වේ.

“අනුමත ලකුණ” යන්නෙන් කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ

කරනු ලබන දැන්වීමක් මගින් මෙම ආඥාපනතේ කාර්යය සඳහා අනුමත කරන ලද ලකුණක් අදහස් වේ.

"බලයලත් නියෝජිතයා" යන්න අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ බලයලත් නියෝජිතයා වීමට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ඒ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් යම් තැනැත්තකුට ප්‍රකාශිතව ලියවිල්ලකින් බලය දී ඇත්තේ ද, සහ එසේ බලය දෙන ලද බව නාමයෝජනා කිරීමේ කාලසීමාව ආරම්භ වීමට යටතේ පිරිසෙයින් පැය හැත්තෑදෙකකට පෙර එම ලේකම් හෝ එම කණ්ඩායමේ නායකයා විසින් ඡන්ද විමසීම පැවැත්වෙන ඡන්ද ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත දැනුම් දී ඇත්තේ ද, එවැනි තැනැත්තෙක් අදහස් වේ".

"නගරාධිපති" යන්නෙන්, මහා නගර සභාවක නගරාධිපතිවරයා හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා අදහස් වේ ;

"උප නගරාධිපති" යන්නෙන්, මහ නගර සභාවක උප නගරාධිපති හෝ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක උප සභාපතිවරයා අදහස් වේ;

"ඡන්ද දිස්ත්‍රික්කය" යන්නෙහි, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවෙහි ඇති අර්ථයම තිබේ;

"ඡන්ද විමසීම් නිලධරයා" යන්නෙන්, මේ ආඥාපනත යටතේ පත්කරනු ලැබූ දිස්ත්‍රික්කයක, ඡන්ද විමසීම් නිලධරයා අදහස් කෙරේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් , යම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ;

"පළාත් පාලන ඡන්ද විමසීම" යන්නෙන්, පළාත්පාලන ආයතනයක සභිකයන් තෝරා පත් කරගැනීම අදහස් වේ ;

"පාර්ලිමේන්තු මහා මැතිවරණය" යන්නෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මහා මැතිවරණයක් අදහස් වේ;

"බලයලත් නියෝජිතයා" යන්නෙන් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයක පළමුව නම සඳහන් තැනැත්තා අදහස් වේ ;

"පාර්ලිමේන්තු මැතිවරණ රාජ සභා ආඥාව" යන්නෙන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව අදහස් වේ;

"මහ නගරය" යන්නෙන්, නියමිත දින පැවති සෑම මහා නගර සභාවක පරිපාලන සීමාව තුළ පිහිටි ප්‍රදේශය හෝ මහ නගරසභා සංස්ථාපනයට සම්බන්ධ තත් කාලයෙහි බල පවත්නා යම් ලිඛිත නීතියක අර්ථානුකූල මා නගරයක් වූ යම් ප්‍රදේශයක් අදහස් වේ;

"වැඩිපුර සිටින සංඛ්‍යාව" යන්නෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමකින් එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ

ස්වාධීන කණ්ඩායම විසින් 65 ආ (3) වගන්තිය ප්‍රකාරව තෝරා පත්කිරීම සඳහා හිමිකම් ලබන සභිකයන් ගණන ඉක්මවමින් පළාත් පාලන ආයතන සඳහා තේරී පත්වන අපේක්ෂකයන් ගණන අදහස්වේ;

"මැතිවරණ කොමසාරිස්වරයා" යන්නෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ;

(1987 අංක 20 & 8)

"සභාව" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.

(1963 අංක 9 & 19)

(1963 අංක 9 & 19)

## පළමුවන උපලේඛනය (28 (2) වන වගන්තිය)

(1977 අංක 24 & 87)

### 1 - පළමු නාම යෝජනා පත්‍රය

.......................................................................මහ නගර සභාව/ නගර සභාව/ ප්‍රාදේශීය සභාව.

(1963 අංක 9 & 19) පිළිගත් දේශපාලන පක්ෂයක් වන .................................................... පක්ෂය විසින්/ (ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට ස්වාධීන කණ්ඩායමේ නායකයා වන ...................................................) විසින්
(1963 අංක 9 & 19) ............................................................. මහ නගර සභාවේ / නගර සභාවේ / ප්‍රාදේශීය සභාවේ සභිකයින් තෝරා ගැනීම සඳහා අපේක්ෂකයින් වශයෙන් පහත දැක්වෙන තැනැත්තන් මෙයින් නාම යෝජනා කරනු ලැබේ.

### I - අපේක්ෂකයන්

(1977 අංක 24 & 87)

| 1 | 2 | 3 | | | | | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නම සහ කොට්ඨාස අංකය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | | | | | පදිංචි ලිපිනය | රැකියාව | තරුණ අපේක්ෂකයකු වන හෝ නොවන බව | අපේක්ෂකයාගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන | පිරිමි කාන්තා |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

## II – අතිරේක නාමයෝජනා පත්‍රය

| 1 | 2 | | | | | | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| නම - පිරිමි කාන්තා | ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | පදිංචි ලිපිනය | රැකියාව | තරුණ අපේක්ෂකයකු වන හෝ නොවන බව | පිරිමි කාන්තා |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

මෙම නාමයෝජනා පත්‍රයෙහි නම සඳහන් සියලු තරුණ අපේක්ෂකයන් ආඥාපනතේ 89 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති වයස් සීමාව තුළ සිටින බවට මම මෙයින් සහතික කරමි.

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ / ස්වාධීන කණ්ඩායම් නායකයාගේ -

අත්සන : ........................................................
නම : ........................................................
ලිපිනය : ........................................................
නිල මුද්‍රා : ........................................................

ඉහත නම සඳහන් ............................................ යන පිළිගත් දේශපාලන පක්ෂයේ / ස්වාධීන කණ්ඩායම් නායකයා විසින් 20..........
මස.............. දින මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

....................................

(සාම විනිසුරු/දිවුරුම් කොමසාරිස් නිල මුද්‍රාව)

ලිපිනය ..............................

"කොට්ඨාසය බහු සභික කොට්ඨාසයක් නම් තරු සලකුණු එකක් (*) යොදා සභිකයින් දෙදෙනෙකු තෝරා පත්කර ගැනීමේ දී අදාල කොටුවෙහි අපේක්ෂකයන් දෙදෙනෙකුගේ නම් ඇතුළත් කරන්න. සභිකයින් තිදෙනකු තෝරා පත්කර ගැනීමේ දී අදාල කොටුවෙහි තරු සලකුණු දෙකක් (**) යොදා අපේක්ෂකයන් තිදෙනකුගේ නම් ඇතුළත්

කරන්න.”

**දෙවන උපලේඛනය** (45 වන වගන්තිය)

ඡන්ද දීමෙහිලා ඡන්දදායකයාට මග පෙන්වීම සඳහා ඡන්ද පොළකම පිටපතින් හා ඡන්දය දෙන සෑම ආවෘත ස්ථානයකම ප්‍රදර්ශනය කළ යුතු විධානවල ආකෘතිය.

සෑම ඡන්දදායකයකුටම තම කැමැත්ත පරිදි යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකුට ලබාදිය හැකි එක ඡන්දයක් තිබිය යුතු ය.

ඡන්දදායකයා, ඡන්දය දෙන එක් ආවෘති ස්ථානයකට ගොස්, ඡනද පත්‍රිකාවේ දකුණු පැත්තේ අවස්ථාවෝචිත පරිදි තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ ලකුණ ඉදිරියේ මෙසේ (x) කතිරයක් ලකුණු කළ යුතු ය.

ඉක්බිතිව ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තේ නිල ලකුණ ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙනෙන පරිදි ඡන්ද පත්‍රිකාව නමා එය ඡන්ද පෙට්ටිය තුළ බහා ඡන්ද පොළෙන් වහාම ඉවත්ව යා යුතු ය.

ඡන්දදායකයා අතින් වූ ප්‍රමාද දෝෂයකින් ඡන්ද පත්‍රිකාවක් නරක් වුවහොත්, ඔහු විසින් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත එය ආපසු දිය හැකි අතර, ඡන්ද ස්ථානාධිපතිවරයා එය ප්‍රමාද දෝෂයක් බවට සෑහීමට පත්වන්නේ නම් ඔහුට වෙනත් ඡන්ද පත්‍රිකාවක් දිය හැකිය.

ඡන්දදායකයා විසින් -

(අ) එක් අපේක්ෂකයකුට වඩා වැඩි ගණනකට ඡන්දය දෙනු ලැබුවහොත් හෝ

(ආ) තමාට පසුව හඳුනාගත හැකි වන යම් ලකුණක් ප්‍රත්‍රිකාවෙහි සටහන් කළ හොත්,

ඔහුගේ ඡන්ද පත්‍රිකාව අවලංගු වන අතර, එය ගණන් කරනු නොලැබේ. ඡන්දදායකයා, ඡන්ද පොළකින් පිටත ඡන්ද පත්‍රිකාවක් ගෙන යන්නේ නම් හෝ ඡන්ද පෙට්ටිය තුළ දැමීමට තමාට බලය දෙන ලද ඡන්ද පත්‍රිකාවක් නොවන යම් දෙයක් එම පෙට්ටිය තුළට බහාලන්නේ නම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

**තුන්වන උපලේඛනය** (47 වන වගන්තිය)

**ඡන්ද පත්‍රිකාවේ මුහුණතෙහි ආකෘතිය**

උපපත්‍රිකාවේ අංකය :

“ඒ” පක්ෂය - ඡන්ද සලකුණ
“බී” පක්ෂය - ඡන්ද සලකුණ
“සී” පක්ෂය - ඡන්ද සලකුණ

ස්වාධීන කණ්ඩායම 1 - ඡන්ද සලකුණ
ස්වාධීන කණ්ඩායම 2 - ඡන්ද සලකුණ
ස්වාධීන කණ්ඩායම 3 - ඡන්ද සලකුණ

77. ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

**හතරවන උපලේඛනය** (76 (1) වන වගන්තිය)

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

..............................................වන මම.............................................
මහ නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම ප්‍රදේශයේ ............................... කොට්ඨාසය සඳහා පැවැත්වෙන මේ ඡන්ද විමසීමේ දී මා හට කියවා දෙන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76 වන වගන්තියෙන් තහනම් කෙරෙන කිසිවක් නොකරන බව ගම්භිරකා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

................................................ ...........................

ප්‍රකාශය ගනු ලබන තැනැත්තාගේ නම හා තනතුර — ප්‍රකාශකගේ අත්සන

සැලකිය යුතුය - ප්‍රකාශය ගනු ලබන තැනැත්තා විසින් , මේ වගන්තිය ප්‍රකාශකට කියවා දෙනු ලැබිය යුතු ය.

**හතරවන උපලේඛනය** (76 (1) වන වගන්තිය)

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

..................................................... වන මම ...................................
මහ නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා පැවැත්වෙන මේ ඡන්ද විමසීමේ දී මා හට කියවා දෙන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76* වන වගන්තියෙන් තහනම් කෙරෙන කිසිවක් නොකරන බව ගම්භිරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

.................................... .............................

ප්‍රකාශය ගනු ලබන තැනැත්තාගේ නම හා තනතුර — ප්‍රකාශකගේ අත්සන

සැලකිය යුතුය - ප්‍රකාශය ගනු ලබන තැනැත්තා විසින් , මේ වගන්තිය ප්‍රකාශකට කියවා දෙනු ලැබිය යුතු ය.

## හත්වන උපලේඛනය (53අ වගන්තිය)

### නාමලේඛනයේ ආකෘතිය

### ඡන්ද පත්‍රිකා භාර දෙනු නොලැබූ ඡන්දදායකයන්ගේ නාමලේඛනය

(76 (1) වන වගන්තිය)
(1987 අංක 20 & 10)

පළාත් පාලන ආයතනය : .........................................
කොට්ඨාස අංකය : .........................................
ඡන්ද විමසීමේ දිනය : .........................................
ඡන්ද පොළ : .........................................

| ඡන්දහිමි නාම ලේඛන යෙහි | ඡන්ද දායකයා ගේ නම | ඡන්ද දායකයා ගේ ලිපිනය | ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව | | | |
|---|---|---|---|---|---|---|
| | | | උචිත පරීක්ෂණය කිරීමට ඉඩ නොදීම | උචිත ලකුණින් ලකුණු කොට තිබීම | උචිත ලකුණින් ලකුණු කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම | වලංගු අනන්‍යතා ලේඛනයක් හෝ අනන්‍යතාව තහවුරු නොකිරීම |
| | | | | | | |

*ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලැබේ.

*මෙම විධිවිධාන බලාත්මක වී එහි කාලය ඉකුත්වී ඇති නිසා 5 වන උපලේඛනය අත්රින ලදී. (හයවන උපලේඛනය අත්හරින ලදී.)
* ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 24 දරන පනතේ 82 වන වගන්තිය බලන්න.

## නව වැනි උපලේඛනය

1. මේ නියෝග 1987 (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල කාර්ය සඳහා-

“නිකුත් කිරීම” යන්නට, මුල් නිකුත් කිරීම සහ පසුව කෙරෙන යම් නිකුත් කිරීමක් ඇතුළත් වේ.;

“තැපැල් ඡන්දදායකයා” යන්න ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු ඉන් අදහස් වේ.

“උපලේඛනය” යන්නෙන්, මේ නියෝගවල උපලේඛනය අදහස් වේ;

“ආඥාපනත” යන්නෙන්, මේ නියෝගවල උපලේඛනය අදහස් වේ;

3. තැපැල් ඡන්දදායකයෙකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් උපලේඛනයේ “අ” අකෘතියට සාරානුකූල විය යුතුය.

4. (1) මේ නියෝගයේ විධිවිධානවලට යටත්ව, ආඥාපනත යටතේ තේරීම් භාර නිලධරයා විසින් තබා ගනු ලබන තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව හා ඔවුන්ගේ ලැයිස්තුව පහසු යයි ඔහුට පෙනී යන ආකෘතියක විය යුතු අතර, තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොටස් සංඛ්‍යාවකින් තබාගනු ලැබිය හැකිය.

(2) තැපැල් ඡන්දදායකයකුගේ ඡන්ද පත්‍රිකාවක් යවනු ලැබියයුතු ලිපිනය තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඔහුගේ නමට ඉදිරියෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි හෝ ඒ ලැයිස්තුවේ එක් එක් කොටසක ඇති නම්වලට අනුගාමිකව අංක යෙදිය යුතුය.

(4) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව පිළියෙළ කරනු ලැබූ වහාම, තේරීම් භාර නිලධරයා විසින් එහි පිටපතක් පරීක්ෂණය සඳහා තම කාර්යාලයේ තැබීමෙන්, එය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

(5) තැපැල් ඡන්ද පත්‍රිකාවක්, තැපැල් ඡන්දදායකයන් නොවන ඡන්දදායනයන්ට භාර දෙනු ලබන ඡන්ද පත්‍රිකාවල ආකෘතියෙහිම සහ ඒ ඡන්ද පත්‍රිකාවලින් වෙන්ව හඳුනාගත නොහැකි පරිදි විය යුතුය.

(6) තැපැල් ඡන්දදායකයකුට, ඔහුගේ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග යවනු ලබන අන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය උපලේඛනයේ “ආ” ආකෘතියට සාරානුකූල විය යුතුය.

(7) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී තේරීම්භාර නිලධරයාට ලිපිකරුවන් වශයෙන් සහාය වීම සඳහා තැනැත්තන් පත්කරනු ලැබිය හැකිය.
එසේ වුවද , ඡන්ද විමසීමේ දී හෝ ඡන්ද විමසීම සම්බන්ධයෙන් අපේක්ෂකයෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබූ කිසිම තැනැත්තකු එසේ පත් කරනු නොලැබිය යුතු ය.

8.(1)

(අ) තේරීම්භාර නිලධරයා සහ ඔහුගේ ලිපිකරුවන් ;

(ආ) බලයලත් නියොජිතයකු හෝ කණ්ඩායම් නායකයකු ;

(ඇ) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තකු ; සහ මේ

නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම්
නියෝජිතයකු නොවන කිසිම තැනැත්තකුට තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතු වලදී පැමිණ සිටිය නො හැකි ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකවර නිකුත් කළ යුතු අවස්ථාවේ එක් එක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් එක් නියෝජිතයකු බැගින් හෝ

ඒ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් පත් කරනු ලැබීමට තේරීම්භාර නිලධරයා විසින් බලය දෙනු ලැබිය හැකි සංඛ්‍යාවක් දක්වා වූ ද ඒ කාණ්ඩ සංඛ්‍යාව නොඉක්මවන්නා වූ ද නියෝජිතයන් හැකි සංඛ්‍යාවක් දක්වා වූ ද ඒ කාණ්ඩ සංඛ්‍යාව නොඉක්මවන්නා වූ ද නියෝජිතයන් වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය හැකිය. එසේ වුව ද, එක් එක් බලයලත් නියෝජිතයා හෝ

කණ්ඩායමේ නායකයා සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ නියෝජිතයන් ගණන සමාන විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වැනි ඡේදය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින දැක්වෙන පත් කිරීමේ දැන්වීම් තැපැල් ඡන්ද පත්රිකා නිකුත් කිරීම සඳහා නියමිත වේලාවය කලින් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් තේරීම්භාර නිලධරයාට දෙනු ලැබිය යුතු ය.

(4) නියෝජිතයකු මියගියහොත් හෝ ඔහුට ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් ඔහු වෙනුවට වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරන ලද නියෝජිතයාගේ නම සහ ලිපිනය පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් තේරීම්භාර නිලධරයාට වහාම දෙනු ලැබිය යුතුය.

(5) නියෝජිතයන් පත් කිරීම හා ඔවුන් පත් කිරීම පිළිබඳ තේරීම් භාර නිලධරයාට දීම බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් ම කරනු ලැබීම වෙනුවට පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් හෝ යථා පරිදි බලය දී ඇත්නම්, නාම යෝජනා පත්‍රයේ නම සඳහන් අපේක්ෂකයා විසින් කරනු ලැබිය හැකිය.

(6) මේ නියෝගවල, නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම්, ස්වකීය පත්වීම් යථා පරිදි කරනු ලැබූ හා දැනුම් දෙනු ලැබූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද, මේ නියෝගයේ (2) වැනි ඡේදය යටතේ පත් කරන ලද නියෝජිතයන් සම්බන්ධයෙන් වන විට, තේරීම්භාර නිලධරයා විසින් බලය දෙන ලද සංඛ්‍යාව ඇතුළත වූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද තේරුම් ගනු ලැබිය යුතු ය.

(7) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු හෝ විසින් තමාගේ යම් නියෝජිතයකු පත්කරනු ලැබුවහොත්, ඒ නියෝජිතයාට කිරීමට බලය දෙනු ලැබිය හැකි වූ යම් ක්‍රියාවක් හෝ දෙයක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් ම කිරීම හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙහිලා තමාගේ නියෝජිතයාට සහාය වීම හෝ කරනු ලැබිය හැකි ය.

(8) බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ ඔවුන් ගේ නියෝජිතයා හෝ ඉදිරියෙහි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට මේ

නියෝගවලින් නියමිතව හෝ බලය දී ඇති අවස්ථාවක එවැනි යම් තැනැත්තන් ඒ කාර්යය සඳහා නියමිත වේලාවට, එසේ නියමිත ස්ථානයට පැමිණ නොසිටියද ඒ ක්‍රියාව හෝ දෙය අන් සෑම අතින් ම වලංගු පරිදි කර ඇත්නම් ඒ පැමිණ නොසිටීමෙන් ඒ ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය.

9.(1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින් ම , ඒ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර මෙහි උපලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූල රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ වූ ප්‍රකාශයක් තේරීම්භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු අතර වෙනත් යම් තැනැත්තෙකු විසින් භය කරනු ලබන විට, එය තේරීම්භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ඉදිරිපිට කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින්ම, ඡන්දය දීමේ රහස්‍යතාව රැක ගැනීමට ආධාර වීම කළ යුතු අතර,

(අ) නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකා මත කරන ලද නිල ලකුණ පිළිබඳව ඒ කටයුතුවල දී ලබාගත් යම් තොරතුරක් ඡන්ද විමසීම් අවසන් කරනු ලැබීමට පෙර, යම් තැනැත්තකුට දැනුම් දීම හෝ

(ආ) නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකා මත කරන ලද නිල ලකුණ පිළිබඳ ඒ කටයුතුවලදී ලබාගත් තොරතුරක් කවර හෝ විටෙක යම් තැනැත්තකුට දැනුම් දීම නොකළ යුතුය.

(4) මේ නියෝගයේ (3) වැනි ඡේදයේ විධි විධාන කඩකරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතුය.

10.(1) තේරීම්භාර නිලධරයා විසින්, ඡන්ද විමසීමක නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයට පසු දින දහයක් ඉකුත් වීමට පෙර, තමා විසින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ එකී නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වැනි නියෝගයේ (2) වැනි ඡේදය යටතේ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් හෝ පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව, ඒ එක් එක් බලයලත් නියෝජිතයාට සහ කණ්ඩායම් නායකයාට දැනුම් දෙනු ලැබිය යුතුය.

(2) තේරීම්භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා කිසිවක් පසුව නිකුත් කරනු ලබන අවස්ථාවක, තමා විසින් එසේ පසුව නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වැනි නියෝගයේ (2) වන ඡේදය යටතේ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන්

සංඛ්‍යාව ඒ එක් එක් බලයලත් නියෝජිතයාට සහ කණ්ඩායම් නායකයාට, හැකිතාක් ඉක්මනින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

11. (1) එක් තැපැල් ඡන්දදායකයා වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාව පිටිපස නිල ලකුණින් මුද්‍රා තැබීම හෝ නිල ලකුණ සිදුරු කිරීම හෝ කරනු ලැබිය යුතුය. තවද ඒ ඒ ඡන්දදායකයාගේ නම සහ අංකය හඬ නගා කියවා, ඒ ඒ ඡන්ද දායකයාගේ අංකය ඒ එක් එක් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතුය.

තව ද, ඒ ඡන්ද පත්‍රිකාව ඔහුට නිකුත් කරන ලද බව දැක්වීම පිණිස එහෙත් ඔහුට නිකුත් කරන ලද නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක්දැයි නොදක්වා තැපැල් ඡන්දදායකයාගේ ලැයිස්තුවෙහි ඒ ඡන්දදායකයාගේ අංකය ඉදිරියෙන් ලකුණක් තැබිය යුතුය.

(2) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතු ඒ ඡන්ද දායකයාගේ අංකය, තැපැල් ඡන්දදායකයාගේ ලැයිස්තුවෙහි සඳහන් ඒ ඡන්දදායකයාගේ අංකය විය යුතුය.

(3) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කර ඇති අංකය ඒ ඡන්දදායකයා වෙත යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියෙහි ලකුණු කරනු ලැබිය යුතු ය. එසේ ලකුණු කරනු ලැබූ අංකය මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

12. තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඇතුළත් සටහන් දෙකක් එකම තැපැල් ඡන්දදායකයා සම්බන්ධයෙන් වන බවට තේරීම්භාර නිලධරයකු සෑහීමට පත් වන අවස්ථාවක ඔහු විසින් ඒ ඡන්දදායකයා වෙනුවෙන් එක තැපැල් ඡන්ද පත්‍රිකාවකට වැඩි ගණනක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

13.(1) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය මේ නියෝගවල "ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යථා පරිදි ලකුණු කොට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහාලූ තැපැල් ඡන්ද පත්‍රිකාව සහ යථා පරිදි පුරවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය ආපසු එවීම පිණිස වූ ලියුම් කවරය මේ නියෝගවල "ආවරණ ලියුම් කවරය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

14. තැපැල් ඡන්දදායකයන් අමතා යවනු ලබන සියලුම ලියුම් කවර, තේරීම් භාර නිලධරයා විසින් ගණන් කොට ළඟම පිහිටි තැපැල් කාර්යාලය වෙත වහාම භාර දෙනු ලැබිය යුතු අතර, එසේ භාර දෙන ලද ලියුම් කවර සංඛ්‍යාව සඳහන් කරමින් තේරීම්භාර නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සි ආකෘතියක් තැපැල් ස්ථානාධිපතිවරයා විසින් තැපැල් කාර්යාලයේ දින මුද්‍රාවෙන් මුද්‍රා තබා, ඒ ලියුම් කවර වල ලිපිනය ඇති තැනැත්තන් වෙත ඒවා භාර දීම සඳහා වහාම යවනු ලැබිය යුතු ය.

15. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසන් කරනු ලැබීමෙන් පසු තේරීම්භාර නිලධරයා විසින්, හැකි ඉක්මනින් සහ බලයලත් නියෝජිතයන්ගේ හා කණ්ඩායම් නායකයන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී -

තැපැල් ඡන්ද පත්‍රිකාව නිකුත්

(අ) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කළපිටපත් ; සහ

කිරීම ප්‍රතික්ෂේප කිරීම.

(ආ) නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා වෙන වෙනම පැකට්ටුවලට දමා ඒ පැකැට්ටු මුද්‍රා තබනු ලැබිය යුතු ය.

"ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යන යෙදුම සහ "ආවරණ ලියුම් කවරය" යන යෙදුම අර්ථ නිරූපනය කිරීම.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කිරීමේ කාර්යය සඳහා තේරීම්භාර නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කරන ලද පිටපත් ඇතුළත මුද්‍රා තබන ලද පැකට්ටුව විවෘත කරනු ලැබිය හැකි අතර, නිකුත් කිරීම අවසන් වූ පසු මේ නියෝගයේ (1) වැනි ඡේදය අනුව ඒ පිටපත් නැවතත් පැකට්ටුවලටම දමා මුද්‍රා තබනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද දායකයන් අමතා යවනු ලබන ලියුම් කවර තැපැල් කාර්යාලට භාර දීම.

16.(1) තැපැල් ඡන්දදායකයන් වෙත තැපැල් ඡන්ද පත්‍රිකා මුලින් නිකුත් කිරීමේ කටයුතුවල දී තැපැල් ඡන්දදායකයන්ගෙන් ලැබෙන ආවරණ ලියුම් කවර දැමීම සඳහා ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පෙට්ටි තේරීම්භාර නිලධරයා විසින් සපයනු ලැබිය යුතු ය. එවැනි සෑම ඡන්ද පෙට්ටියක් ම ආඥාපනතේ 61අ වැනි වගන්තියේ කාර්ය සඳහා ඡන්ද පෙට්ටියක් ලෙස සලකනු ලැබිය යුතුය.

තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව හා උප පත්‍රිකා මුද්‍රා තැබීම.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයෙහි සඳහන් සෑම ඡන්ද පෙට්ටියක්ම පැමිණ සිටින බලය ලත් නියෝජිතයන්ගේ සහ කණ්ඩායම් නායකයාගේ නියෝජිතයන්ට විවෘතව හා හිස් ව පෙන්වා තේරීම්භාර නිලධරයාගේ මුද්‍රාවෙන් සහ ස්වකීය මුද්‍රා තැබීමට කැමති යම් නියෝජිතයන්ගේ මුද්‍රාවලින් මුද්‍රා තබා "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය" යන්න සහ ඡන්ද විමසීම පවත්වනු ලබන්නේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ නම එහි ලකුණු කරනු ලැබිය යුතු අතර තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද පෙට්ටියේ සුරක්ෂිත භාරය සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුතුය.

17. ඡන්ද විමසීම ආරම්භවීමට පැය හැත්තෑ දෙකකට පෙර ආවරණ ලියුම් කවරයක් ලැබුණු විට, තේරීම්භාර නිලධරයා විසින් වහාම තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය තුළ එය විවෘත නොකොට බහාලිය යුතුය.

18. තේරීම්භාර නිලධරයා විසින් විවෘත නොකරන ලද ආවරණ ලියුම් කවර තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි තුළට බහාලීමෙන් පසුව සහ ඡන්ද විමසීම ආරම්භ වීමට පෙර ඕනෑම වේලාවක, තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි විවෘත කර ඒවායේ ඇති ආවරණ ලියුම් කවර එක් එක් කොට්ඨාස අනුව වෙන් කළ යුතු ය. ආවරණ ලියුම් කවර වෙන් කිරීම නිම වූ විට, තේරීම්භාර නිලධරයා විසින් එම එක් එක් කොට්ඨාසයට අදාළ ආවරණ ලියුම් කවර, ඒ ඒ කොට්ඨාසය සඳහා වෙන වෙනම කවරයක බහා මුද්‍රාව තබා ඡන්ද පත්‍රිකා සහ වෙනත් බඩු බාහිරාදිය සමග ඡන්ද විමසීමේ දිනයට පෙර දින ආදළ කොට්ඨාසය සඳහා පත් කරනු ලැබූ ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දිය යුතු ය;

19. තේරීම්භාර නිලධරයා විසින් , ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ආරම්භ කිරීමට පෙරාතුව ම, ඉක්මනින් කොට්ඨාසය සඳහා පත් කර ඇති ඡන්ද ගණන් කිරීමේ නිලධරයා මගින් කොට්ඨාසයට අදාළ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලියුම් කවර විවෘත කරවා ඡන්දය ගණන් කිරීම ඉදිරියට කරගෙන යා යුතු ය.

24. (2) ගණන් කිරීමේ නිලධරයා විසින් ආවරණ ලියුම් කවරයක් විවෘත කරනු ලැබ එය තුළ-

(අ)

(i) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක්; හෝ

තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලියුම් කවර කොට්ඨාස අනුව වර්ග කිරීම.

(ii) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(iii) අනන්‍යතා ප්‍රකාශයක් පමණක් ; හෝ

(iv) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් පමණක් ; හෝ

(v) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් පමණක් ඇති බව සොයා ගනු ලබන අවස්ථාවක නැතහොත්

(ආ) කිසිවක් නොමැති බව සොයා ගනු ලබන අවස්ථාවක මේ නියෝගයේ අනුයාත විධිවිධාන අදාළ විය යුතුය.

තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම

ආවරණ ලියුම් කවර විවෘත කිරීම

(3) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට , අනන්‍යතා ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති බවටත්, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අන්න්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය ඡන්ද පත්‍රිකා ලියුම් කවරයේ ලකුණු කර ඇති ඒ හා සමාන අංකයට ද පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අනන්‍යතා ප්‍රකාශයේ ලකුණු කර ඇති අංකය, ඡන්ද පත්‍රිකා ලියුම් කවරයේ ලකුණු කර ඇති ඒ අංකයට ද අනුරූප වන බවටත්, ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත්විය යුතුය. ඔහු එසේ සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ ප්‍රකාශය, (මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනම බඳුනකට ද, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකාව (මෙහි මින්මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහි වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් බඳුනකට ද දැමිය යුතුය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන අවස්ථාවක, මේ නියෝගය (3) වැනි ඡේදය මගින් නියමිත පරිදි ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් නොවන විටෙක ඔහු විසින් -

(අ)එම උපලේඛනයේ 20 වන, 21 ව , 22 වන, 23 වන නියෝග සහ 24 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත් කිරීමෙන් "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ ප්‍රකාශය, පැමිණ සිටින යම් ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම් ඉහතින් වූ (අ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචනවලට ; ප්‍රතික්ෂේප කිරීමට විරෝධය

පාන ලදී" යන වචන එකතු කරනු ලැබිය යුතු ය.

(ඇ) පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, නැතහොත් පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකාව, ඒ ප්‍රකාශයට ඇමිණිය යුතු ය. ; තවද

(ඈ) ප්‍රකාශය සහ ඉහතින් වූ (ඇ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන (මෙහි මින්මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) බඳුනකට දැමිය යුතුය.

(5) මේ නියෝගයේ (2) වැනි ඡේදයේ (අ) (iii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින් "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද ප්‍රතිකාවක් සහ කිසිම ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් ලැබී නැත." යන වචන අනන්‍යතා ප්‍රකාශය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(6) මේ නියෝගයේ (2) වැනි ඡේදයේ (අ) (iv) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ගණන් කිරීමේ නිලධරයා විසින් "ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත." යන වචන ඡන්ද පත්‍රිකාවෙහි සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනකට දැමිය යුතුය.

(7) මේ නියෝගයේ (2) වැනි ඡේදයේ (අ) (v) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට අනන්‍යතා ප්‍රකාශයක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහා ඇද්දැයි නිසැකවම දැන ගැනීම පිණිස ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ලියුම් කවරය විවෘත කරනු ලැබිය යුතු ය.

(8) මේ නියෝගයේ (7) වැනි ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ කල්හී, අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකාවක් ඒ ලියුම් කවරය තුළ ඇත්නම්, ඒ ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති බවටත්, අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන බවටත් ගණන් කිරීමේ නිලධරයා විසින් තමා ම සෑහීමට පත් විය යුතු අතර-

(අ) එසේ සෑහීමට පත් වන්නේ නම්, ඒ ප්‍රකාශය අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුනට දැමිය යුතු අතර, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමිය යුතුය; තවද

(ආ) එසේ සෑහීමට පත් නොවන්නේ නම් -

(i) ඒ ප්‍රකාශය පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වපු ලැබිය යුතු අතර ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම්, ඉහතින් වූ (i) වැනි අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචන වලට "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී." යන වචන එකතු කරනු ලැබිය යුතු ය.

(ii) ඒ ප්‍රකාශයට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඒ ඡන්ද පත්‍රිකාව අමුණනු ලැබිය යුතුය.

(iii) ඒ ප්‍රකාශය සහ ඉහතින් වූ (iii) වැනි අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දමනු ලැබිය යුතු ය.

(9) මේ නියෝගයේ (7) වැනි ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ විට , එය තුළ-

(අ) අනන්‍යතා ප්‍රකාශයක් පමණක් ; හෝ
(ආ) ඡන්ද පත්‍රිකාවක් පමණක් ; හෝ
(ඇ) කිසිවක් නොමැති බව

ගණන් කිරීමේ නිලධරයා විසින් සොයා ගනු ලැබුවහොත් , ඔහු විසින් -

(i) ඉහතින් වූ (අ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඒ ප්‍රකාශයෙහි " අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් ලැබී නැත" යන වචන සටහන් කිරීම.

(ii) ඉහතින් වූ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඒ ඡන්ද පත්‍රිකාවෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත" යන වචන සටහන් කිරීම.

(iii) ඉහතින් වූ (ඇ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. බහාලූ කිසිවක් ලැබී නැත". යන වචන සටහන් කිරීම ; සහ

(iv) අනන්‍යතා ප්‍රකාශයක් හෝ ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ තිබුණේ නම්, ඒ ප්‍රකාශය හෝ ඡන්ද පත්‍රිකාව ඒ ලියුම් කවරයට ඇමිණීම කරනු ලැබිය යුතු අතර ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඉහතින් වූ (iv) වැනි අනුඡේදය යටතේ ඒ ලියුම් කවරයට අමුණූ ඇති යම් ලේඛනයක් හෝ ලේඛන වෙතොත් ඒ ලේඛනය හෝ ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(10) (2) වැනි ඡේදයේ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින් , ආවරණ ලියුම් කවරයෙහි, "ප්‍රතික්සේප කරන ලදී. බහාලූ කිසිවක් ලැබී නැත." යන වචන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලියුම් කවරය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතුය.

(11) අනන්‍යතා ප්‍රකාශයක් ඒ අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතියේ පිටිපස සඳහන් උපදෙස් ප්‍රකාර අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති නම් මිස යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතුය.

25. (1) 24 වැනි නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති එක් එක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය ගණන් කිරීමේ නිලධරයා විසින් වෙන වෙනම විවෘත කරනු ලැබිය යුතුය.

(2) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක කිසිම ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් නොවන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ පියුම් කවරයෙහි. "කිසිම ඡන්ද පත්‍රිකාවක් බහා නොමැත" යන වචන සටහන් කොට එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතුය.

(3) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අවස්ථාවක ගණන් කිරීමේ නිලධරයා විසින්-

(අ) ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන්නේ නම්, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමීම ; සහ

(ආ) ඒ ලියුම් කවරයෙහි ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අතර ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති අංකය , ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකයට අනුරූප නොවන්නේ නම් , ඒ ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කොට, ඒ ඡන්ද පත්‍රිකාව ඒ ලියුම් කවරයට අමුණා එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමීම කරනු ලැබිය යුතුය.

ඡන්ද පත්‍රිකා ලියුම් කවර විවෘත කිරීම

26, 25 වැනි නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී, ගණන් කිරීමේ නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ වෙන වෙනම පැකැට්ටු දෙකක බහා ඒ පැකැට්ටු මුද්‍රා තැබිය යුතුය.

27.(1) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට කලින්, ඔහු විසින් හෝ විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් , එහි පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගෙන ඒ බඳුනෙහි තිබුණු ඡන්ද පත්රිකා සංඛ්‍යාව ගණන් කොට වාර්තා කර ගනු ලැබිය යුතුය.

(2) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකාවල ඡන්ද ගණන් කිරීමෙහි ලා ආඥාපනතේ 62 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ සහ 63 වැනි සහ 63අ වැනි වගන්තිවල අදාළ විය යුතුය.

28. ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින් -

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා;

(ඇ) එක් එක් අපේක්ෂකයන්ට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය;

(ඈ) ආඥාපනතේ 63 වන වගන්තියේ (5) වන උපවගන්තියට අනුකූලව සකස් කරන ලද ප්‍රකාශය;

(ඉ) 26 වැනි නියෝගයේ සඳහන්, මුද්‍රා තබන ලද පැකට්ටු දෙක; සහ

(ඊ) 27(1) වැනි නියෝගය යටතේ, ගණන් කිරීම පිළිබඳ වාර්තාව මුද්‍රා

ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සහ අනන්‍යතා ප්‍රකාශ මුද්‍රා තැබීම

තබන ලද පැකට්ටුවල බහා තේරීම්භාර නිලධරයා වෙත නොපමාව භාරදිය යුතුය.

**මේ නියෝගවල උපලේඛනය**

**"අ" ආකෘතිය**

තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉල්ලීම

.............................................................................පළාත් පාලන
(පළාත් පාලන ආයතනයේ නම සඳහන් කරන්න.)
ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙතය.

.....................................................................................වන මම
ඉහත සඳහන් පළාත් පාලන ප්‍රදේශය සඳහා බලපවත්නා ඡන්ද හිමි නාමලේඛනයේ, මාගේ නම...........................................................
යනුවෙන් දැක්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි. නාම ලේඛනයෙහි මාගේ නම දැක්වෙන්නේ පහත සඳහන් අනුක්‍රමික අංකය, ඡන්ද කොට්ඨාසය, කොට්ඨාසයේ නම සහ අංකය , මැතිවරණ කොට්ඨාසය යටත් වේ .

මැතිවරණ කොට්ඨාසයේ අංකය :
ඡන්ද කොඨ්ඨාසයේ අංකය :
කොට්ඨාසයේ නම සහ අංකය :
මගේ නමට අයත් අනුක්‍රමික අංකය :

(1)
(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ / ශ්‍රී ලංකා නාවික හමුදාවේ / ශ්‍රී ලංකා ගුවන් හමුදාවී සාමාජිකයකු වශයෙන් :

(ආ) පොලිස් දෙපාර්තමේන්තුවේ / ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ/ තැපැල් දෙපාර්තමේන්තුවේ/ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ/ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ/..............................ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්

(ඇ) ඡන්ද විමසීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත් කරනු ලැබූ/ පත් කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්

(ඈ) ඡන්ද විමසීම හා සම්බන්ධිත කාර්යය සඳහා පත් කරනු ලැබූ/පත් කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහා බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්
මගේ සේවා නියුක්තියේ විශේෂ අවස්ථාගත කරුණු හේතුවෙන්
(2) ....................................................................................
(පළාත් පාලන ආයතනයේ නම යොදන්න.)

පළාත් පාලන ආයතනය සඳහා මා අපේක්ෂකයකු වීම හේතුවෙන් මට වෙන් කරන ලද ඡන්ද පොළෙහි ඡන්දය දීමට මට නොහැකි වීමට ඉඩ

ඇති බැවින්, ඉහත සඳහන් පළාත් පාලන ආයතනය සඳහා සභිකයින් තෝරා පත් කර ගැනීමේ දී තැපැල් ඡන්දදායකයකු වශයෙන් සළකනු ලැබීමට මම මෙයින් ඉල්ලුම් කරමි.

මගේ ඡන්ද පත්‍රිකාව සහ අනිකුත් ලේඛන එවනු ලැබිය යුතු ලිපිනය පහත දැක්වේ.

පහත දැක්වෙන සටහන ප්‍රකාර .සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති නම් ඉල්ලුම්කරුගේ සහතික කරන නිලධරයාගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න. සහතික කිරීමේ නිලධරයෙකු වශයෙන් කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකම් ඇත්නම් ඉල්ලුම්කරුගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න.

.........................................

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය............................

*මා/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතුකොට ගෙන
*මට/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී මට/ඔහුට පෞද්ගලිකව ඡන්දය දීමට නොහැකි/නොහැකි වීමට ඉඩ ඇති බව මෙයින් සහතික කරමි.
මේ ඉල්ලුම්පත්‍රයෙහි දැක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදි
දිනය සහ නිල මුද්‍රාව.........................................................

.............................................................

සහතික කරන නිලධරයාගේ ඉල්ලුම්කරුගේ
අත්සන සහ නිල නාමය

*අදාළ නොවන වචන කපා හරින්න.

**සටහන**

1. සෑම ඉල්ලුම් පත්‍රයක් ම, ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ නාමයෝජනා දැන්වීම පළකරනු ලැබූ දිනයේ සිට දින දහයක් ඇතුළත ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි වී සිටින ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක්ම නිසි පරිදි පුරවා තිබිය යුතුය. එසේ නොවුනහොත් තේරීම්භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේය.

3. සෑම ඉල්ලුම්කරුවෙකුට ම තේරීම්භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ

ලිපිනයට හෝ, ඔහු එසේ හිමිකම් ලබා නොමැති නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5. "සහතික කිරීමේ නිලධරයා" යන යෙදුම

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට -

(i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාපති හෝ ඒ ගුවන් හමුදාපති හමුදාපති නම්, නැතහොත්, ඒ ඉල්ලුමම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වැනි කොටසෙහි සඳහන් තැනැත්තෙකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ.

(ආ)රජයේ සේවයේ හෝ ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට -

(i) ඒ ඉල්ලුම්කරුවකු, යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු අදහස් වේ; නැතහොත්
(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වැනි කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින නිලධරයා ඉන් අදහස් වේ.

(ඇ) පළාත් පාලන ඡන්ද විමසීමක අපේක්ෂකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබී ඡන්ද විමසීම් ප්‍රදේශයක සඳහා වූ තේරීම්භාර නිලධරයා ඉන් අදහස් වේ.

*මා/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතුකොට ගෙන
*මට/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළෙහි *දී මට/ඔහුට පෞද්ගලිකව ඡන්දය දීමට *නොහැකි/නොහැකි වීමට ඉඩ ඇති බව මෙයින් සහතික කරමි.
මේ ඉල්ලුම්පත්‍රයෙහි දැක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදිය
දිනය සහ නිල මුද්‍රාව...................................................................

..................................................................
*සහතික කරන නිලධරයාගේ ඉල්ලුම්කරුගේ
අත්සන සහ නිල නාමය

*අදාළ නොවන වචන කපා හරින්න.

**සටහන**

1.සෑම ඉල්ලුම් පත්‍රයක්ම, ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ නාමයෝජනා දැන්වීම පළකරනු ලැබූ දිනයේ සිට දින දහයක් ඇතුළත ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි වී සිටින ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක්ම නිසි පරිදි පුරවා තිබිය යුතුය. එසේ නොවුනහොත් තේරීම්භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේ ය.

3. සෑම ඉල්ලුම්කරුවෙකුට ම තේරීම්භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ ඔහු එසේ හිමිකම් ලබා නොමැති නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5.“සහතික කිරීමේ නිලධරයා” යන යෙදුම

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට -

(i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාපති හෝ ඒ ගුවන් හමුදාවේ හමුදාපති නම්, නැතහොත් ඒ ඉල්ලුම්කරු තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වැනි කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ.

(ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන නම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට -

(i) ඒ ඉල්ලුම්කරු , යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම් ඒ ඉල්ලුම්කරු අදහස් වේ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු , මේ අනුඡේදයේ (1) වැනි කොටසෙහි සඳහන් නැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින නිලධරයා ඉන් අදහස් වේ.

(ඇ) පළාත් පාලන ඡන්ද විමසීමක අපේක්ෂකයෙකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබී ඡන්ද විමසීම් ප්‍රදේශයක සඳහා වූ තේරීම්භාර නිලධරයා ඉන් අදහස් වේ.

*මා/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතුකොට ගෙන

*මට/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළෙහි *දී මට/ඔහුට පෞද්ගලිකව ඡන්දය දීමට **හැකි/** නොහැකි වීමට ඉඩ ඇති බව මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම්පත්‍රයෙහි දැක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදිය දිනය සහ නිල මුද්‍රාව..................................................................

..............................................................
*සහතික කරන නිලධරයාගේ ඉල්ලුම්කරුගේ
අත්සන සහ නිල නාමය

*අදාළ නොවන වචන කපා හරින්න.

**සටහන**

1. සෑම ඉල්ලුම් පත්‍රයක්ම , ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ නාමයෝජනා දැන්වීම පළකරනු ලැබූ දිනයේ සිට දින දහයක් ඇතුළත ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි වී සිටින ඡන්ද විමදීම් ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක්ම නිසි පරිදි පුරවා තිබිය යුතුය. එසේ නොවුනහොත් තේරීම්භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේ ය.

3. සෑම ඉල්ලුම්කරුවෙකුටම තේරීම්භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම් ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ ඔහු එසේ හිමිකම් ලබා නොමැති නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5. "සහතික කිරීමේ නිලධරයා" යන යෙදුම

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට-

(i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාපති හෝ ඒ ගුවන් ගමුදාවේ හමුදාපති නම්, නැතහොත්, ඒ ඉල්ලුම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊලඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස්වේ.

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වැනි කොටසෙහි සඳහන් තැනැත්තෙකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊලඟට සිටින කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ.

(ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට -

(i) ඒ ඉල්ලුම්කරු, යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වැනි කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින නිලධරයා ඉන් අදහස් වේ.

(ඇ) පළාත් පාලන ඡන්ද විමසීමක අපේක්ෂකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉල්ලුම්කරු ඡන්ද හිමිකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබී ඡන්ද විමසීම් ප්‍රදේශයක සඳහා වූ තේරීම්භාර නිලධරයා ඉන් අදහස් වේ.

**"ආ" ආකෘතිය**

අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

*ආකෘතියේ ඉදිරිපස*

ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය........................................................

(තේරීම්භාර නිලධරයා විසින් ඇතුළත් කිරීම සඳහා)

*(මට දැන් භාර දෙන ලද) ඉහත දැක්වෙන අනුක්‍රමික අංකය දරන ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය, මගේ අත්සනට සාක්ෂිකරුවකු වන පහත සඳහන් නිලධරයාගේ භාරයේ එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

(මා දැන් ඉදිරිපත් කරන) ඉහත දැක්වෙන පරිදි අනුක්‍රමික අංකය යෙදූ ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය කෙලින්ම එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

..................................................

ඡන්දදායකයාගේ අත්සන

දිනය : ..................................

ඉහත නම් සඳහන් තැනැත්තාට, ඔහුගේ සහතික කිරීමේ නිලධරයා වශයෙන් මා භාරයේ මෙහි සඳහන් කරන ලද ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය එවන ලදී. පැවැත්වීමට ඇති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ අපේක්ෂකයකු වන මා භාරයේ තිබෙන ඒකකයේ/ආයතනයේ/කාර්යාලයේ සේවයෙහි නියුක්තව සිටින ඉහත නම සඳහන් තැනැත්තා මම පෞද්ගලිකව හඳුනමි.

ඡන්දදායකයා වෙත භාර දෙනලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින්, මගේ කාර්යාලයේ සපයා ඇති ආවෘත ස්ථානය තුළ දී එකෙණෙහිම ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ බහාලන ලද අතර මා සහ ඡන්දදායකයා ඉදිරිපිට දී ලියුම් කවරය මුද්‍රා තබන ලදී.

ඉහත දැක්වෙන අනන්‍යතා ප්‍රකාශය ඡන්දදායකයා විසින් ඡන්දය දීමට කලින් මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

(6 වැනි නියෝගය)

මා පෞද්ගලිකව හඳුනන ඉහත නම් සඳහන් තැනැත්තා විසින් ඉහත සඳහන් ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය මට පෙනුවූ අතර ඉහත දැක්වෙන ප්‍රකාශය මා ඉදිරිපිටදී අත්සන් කරන ලදී.

......................................................
සාක්ෂිකරුගේ අත්සන සහ නිල නාමය

දිනය සහ නිල මුද්‍රාව :....................................................................
(මේ ආකෘතියේ පිටිපස ඇති උපදෙස් බලන්න)

*අදාළ නොවන්නේ නම් කපා හරින්න

.

ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන තම නිල නාමය හා ලිපිනය යටතේ කෙළින්ම යවනු ලැබූ ඡන්දදායකයන් සම්බන්ධයෙන් පමණක් අදාළ වන අතර අදාළ නොවන්නේ නම් කපා හරිනු ලැබිය යුතු ය. ඒ ඡන්දදායකයන් පිළිබඳ ප්‍රකාශයට සාක්ෂි දැරීම පසු පිටුවේ උපදෙස්වල නියම කර ඇති පරිදි විය යුතුය.

ආකෘතියේ පිටිපස

(අ) තම සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයා විසින් ප්‍රකාශය අත්සන් කිරීමට පෙර-

(i) ඒ නිලධරයා භාරයේ ඡන්දදායකයා වෙත එවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඡන්ද පත්‍රිකාව බහාලූ ලියුම් කවරය:

(ii) අනන්‍යතා ප්‍රකාශයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති, ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය ඔහුවෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාවේ දැක්වෙන අංකය ම බව දැක බලා ගත යුතු ය.

ඉන්පසු ඡන්දදායකයා විසින් තමා සාක්ෂිකරු වශයෙන් ක්‍රියා කළ යුතු යම් නිලධරයකු ඉදිරිපිට දී ප්‍රකාශය අත්සන් කළ යුතුය.

2. ඡන්දදියකයාට එක ඡන්දයක් පමණක් ඇත්තේය.

3.ඡන්දදායකයා තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ තත් කාර්ය සඳහා සළසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුණක් (මෙසේ X) යෙදීමෙන් ඡන්දය දිය යුතුය. තව ද, ඒ පක්ෂය විසින් හෝ කණ්ඩායම විසින් හෝ නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් 3 දෙනෙකුට නොවැඩි ගණනක් සම්බන්ධව සිය මනාපය දැක්වීමට ඒ එක් එක් අපේක්ෂකයා සඳහා වෙන්කර ඇති අනුක්‍රමික අංකයට අනුරූප වන අනුක්‍රමික අංකය ඇතුළත් ඡන්ද පත්‍රිකාවේ පහළ ඇති කොටුවෙහි කතිර ලකුණ යෙදීමෙන් කරනු ලැබිය හැකිය.

4.ඡන්දදායකයා තමා ඡන්දය දුන්නේ කවර ආකාරයකට ද යන වග කිසි තැනැත්තකුට දැකීමට ඉඩ නොතැබිය යුතු ය.

5.ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් වහාම ඡන්ද පත්‍රිකාව තමා "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන වචන මතුපිටින් මුද්‍රණය කරනු ලැබ , සපයා ඇති කුඩා ලියුම් කවරය තම සාක්ෂිකරුගේ ලබාගත් ඒ තුළ ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව, ඒ ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස නොපෙන්වමින් බහා ඒ ලියුම් කවරය නොගැලවෙන සේ අලවා එය අප්‍රමාදව යැවීම සඳහා තම සාක්ෂිකරුට භාර දිය යුතුය.

ඉන්පසුව, ඡන්දදායකයා විසින්, සම්පූර්ණ කරන ලද තම අනන්‍යතා ප්‍රකාශය සමග මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, තේරීම්භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා ලියුම් කවරය නොගැලවෙන සේ අලවා එය අප්‍රමාදව යැවීම සඳහා තම සාක්ෂිකරුට භාර දිය යුතුය.

6 .ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්ද විමසසීම අවසන් කරනු ලැබීමට පෙර, තේරීම්භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත් ද, යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග තිබුණහොත් ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙද සලකනු නොලැබිය යුතුය.

(ආ) ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන කෙළින්ම ස්වකීය නිල නාමය සහ ලිපිනය යටතේ යවනු ලැබුවේ යම් ඡන්දදායකයකු වෙත ද ඒ ඡන්දදායකයාට උපදෙස්

1. ඡන්ද දායකයා විසින්, තම අනන්‍යතා ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ඒ ඡන්ද ප්‍රකාශය තමා අත්සන් කළ යුත්තේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තාට-

(අ) ඒ ප්‍රකාශයේ නිශ්චිත වශයෙන් දක්වා ඇති අංකයම දරන ඡන්ද පත්‍රිකාව සහ,

(ආ) ඡන්දදායකයා වෙත අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය හා ඡන්ද පත්‍රිකාව බහා එවන ලද ලියුම් කවරය පෙන්වනු ලැබිය යුතුය.

(2)
(අ) ඡන්දදායකයාගේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන්නේ නම්, ඒ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරලත් නිලධරයකු විය යුතු වූ ද;

(ආ) ඡන්දදායකයා රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන්නේ නම්, ඒ සේවයේ ජ්‍යේෂ්ඨ නිලධරයකු විය යුතු වූ හෝ ඡන්දදායකයාට ජ්‍යෙෂ්ඨ නිලධරයකු නොමැති නම්, ඒ සේවයේ වෙනත් යම් නිලධරයකු විය යුතු වූ ද

සාක්ෂිකරුවකු ඉදිරිපිට දී ඡන්දදායකයා විසින් අනන්‍යතා ප්‍රකාශය අත්සන් කරනු ලැබිය යුතුය.

3.ඡන්දදායකයාට එක් ඡන්දයක් පමණක් ඇත්තේය.

4. ඡන්දදායකයා, තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුනක් (මෙසේ x) කිරීමෙන් ඡන්දය දිය යුතුය. තවද ඒ පක්ෂය විසින් හෝ කණ්ඩායම විසින් හෝ නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් 3 දෙනෙකුට නොවැඩි ගණනක් සම්බන්ධව සිය මනාපය දැක්වීම, ඒ එක් එක් අපේක්ෂකයා සඳහා වෙන් කර ඇති අනුක්‍රමික අංකයට අනුරූප වන අනුක්‍රමික අංකය ඇතුළත් ඡන්ද පත්‍රිකාවේ පහළ ඇති කොටුවෙහි කතිර ලකුණ යෙදීමෙන් කරනු ලැබිය හැකි ය.

5.ඡන්දදායකයා තමා ඡන්දය දුන් වහාම “ඡන්ද පත්‍රිකා ලියුම් කවරය” යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ බහා එවන ලද කුඩා ලියුම්

කවරය තුළ ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව දමා ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඉන් පසුව ඡන්දදායකයා විසින් අනන්‍යතා ප්‍රකාශය සහ මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා ලියුම් කවරය,

තේරීම්භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා එය අප්‍රමාදව තැපෑලෙන් යැවිය යුතුය. ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව වහාම ආපසු එවනු නොලැබුවහොත්, එය ගණන් කරනු ලැබීමට ප්‍රමාද වැඩි විය හැකි ය.

6. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්දය විමසීම අවසන් කරනු ලැබීමට පෙර තේරීම්භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත් ද යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග තිබුණහොත් ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතුය.

"ඇ" ආකෘතිය

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

මට කියවා දෙන ලද ආඥාපනතේ උපලේඛනයේ ඇතුළත් නියෝගවල (9)(1) වන නියෝගයේ (3) වැනි ඡේදය මගින් තහනම් කරනු ලැබ ඇති කිසිවක් මේ කටයුතු වල දී මා නොකරන බවට ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

............................................
ප්‍රකාශකගේ අත්සන

...........................................
ප්‍රකාශ කරන ලද්දේ යම් තැනැත්තකු ඉදිරිපිට දී
ද ඒ තැනැත්තාගේ අත්සන

දිනය ................................

සැලකිය යුතුය - ප්‍රකාශය කරනු ලබන්නේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තා විසින් ප්‍රකාශක වෙත මෙහි සඳහන් කර ඇති ඡේදය කියවා දෙනු ලැබිය යුතුය.